

# මහින්ද චින්තන

## අලුත් ශ්‍රී ලංකාවක්

# දිනවමු ශ්‍රී ලංකා

ජනාධිපතිවරණය 2005

# මහින්ද චින්තන

අලුත් ශ්‍රී ලංකාවක්

| | |
|---|---|
| පරි. අංක | 6690 |
| වර්ග · | 320.6 |
| දිනය | |

සත් තිස් වසරක දේශපාලන ගමන් මගෙහි

මා සමඟ අත්වැල් බැඳ පැමිණි

දහස් සංඛ්‍යාත සහෘද රට වැසියන්ගේ

අදහස් සහ යෝජනා ඇසුරින්

ගොඩ නැගෙන

"මහින්ද චින්තන"

මාගේ දේශයේ පැවිදි උතුමන්ට,

මවුවරුන්ට, පියවරුන්ට

සොයුරු සොයුරියන්ට සහ දරුවන්ට

සෙනෙහසින් පිළිගන්වමි.



"මේ ගහ කොළ මේ මහ පොළව ඔබගේය
එහෙත් ඒ සියල්ල ඔබගේ පමණක් නොව
ඔබගේ මතු පරපුර වෙනුවෙන් ද රැකිය යුතුය.
පාලකයා යනු ඔබේ දරුවන්ගේ උරුමයෙහි
හිමිකරුවා නොව තාවකාලික භාරකරුවාය."

# පටුන


| | පිටුව |
|---|---|
| විනය ගරුක සමාජයක් උදෙසා | 7 |
| සෙනෙහස පිරි පවුලක් | 8 |
| පවුලේ ජීවන බර සැහැල්ලු කිරීමට | 17 |
| පවුලේ අගහිඟකම් නිමාවට "සමෘද්ධි" | 19 |
| ජන සෙවණ | 21 |
| සමෘද්ධිමත් ගමක් | 22 |
| අපේ රට අපි හදමු | 25 |
| නොබෙදුණු රටක් - බහුතර සම්මුතියක් - ගෞරවණීය සාමයක් | 28 |
| රට රැකීම | 32 |
| පිරිපුන් සමාජයක් - තිරසාර සංවර්ධනයක් | 35 |
| කෙතට අරුණ | 38 |
| දැය නංවන නව නිපැයුම් | 48 |
| නිල්ල පිරුණු රටක් | 53 |
| බලශක්ති ප්‍රතිපත්ති | 54 |
| තිරසාර ප්‍රවාහන පිළිවෙතක් | 55 |
| නිල් අහස, නිල් දියඹ ජය ගනිමු | 58 |
| විද්‍යා හා තාක්ෂණය | 59 |
| සුව සම්පත සුරකින | 61 |
| නැණ ගුණ වැඩුම | 63 |
| සුනාමියෙන් යළි ගොඩ නැගෙමු | 67 |
| ප්‍රාදේශීය සංවර්ධන | 68 |
| කලා කෙත අස්වැද්දීම | 78 |
| නිරෝගී දැයක් | 82 |
| ජන මතයට මුල් තැන | 84 |

# විනය ගරුක සමාජයක් උදෙසා

## ගුණවත් පුරවැසියෙක්

මිනිසා භෞතික වශයෙන් පමණක් නොව අධ්‍යාත්මික වශයෙන් ද ගොඩ නැඟීම සඳහා පුද්ගලයාට ශ්‍රද්ධාව මෙන්ම ප්‍රඥාවද ලබා දිය යුතුය. ඒ සඳහා මාපිය-දූ දරු, සැමියා-බිරිඳ, ගුරු-සිසු, සේව්‍ය-සේවක, පාලක-පාලිත ආදී සියලු සබඳතා යහපත් සහ එලදායී බවට පත් කර වෛරය තුරන් කිරීම මගේ අරමුණයි.

සියලු ආගම්වලට අයත් **දරුවන් ඔවුනොවුන්ගේ ආගම්වලට අනුකූල වූ ධාර්මික අධ්‍යාපනයක්** ලබනවා දැකීම මගේ අභිලාෂයයි.

- **මතට තිත**

  නීතිය පොලීසිය හා සමාජ ආයතන සම්බන්ධීකරණය කරමින් ශ්‍රී ලංකාවේ මත්කුඩු උවදුර වසර තුනක් තුළ දී සහමුලින් පිටුදැකීම සඳහා අධිෂ්ඨානශීලීව කැපවෙමි. විෂ මතට එරෙහිව ස්වෙච්ඡා සංවිධාන, ආගමික සිද්ධස්ථාන සහ පාසල් දරුවන් විසින් ගෙන යන **දැනුවත් කිරීමේ සහ අධ්‍යාපනික වැඩසටහන් සඳහා රජයේ මූල්‍ය අනුග්‍රහය** ලබා දෙන්නෙමි.

  **පොදු මහජන ස්ථානවල දුම්බීම සහ මත්පැන් පානය තහනම්** කිරීමට කටයුතු කරමි.

  මත්පැන්, මත්ද්‍රව්‍ය හා සිගරැට්වලට ඇබ්බැහි වූවන් එයින් මුදා ගැනීම සඳහා දැනට ඒ වෙනුවෙන් මධ්‍යස්ථාන පවත්වාගෙන යන **ස්වේච්ඡා සංවිධානවලට රාජ්‍ය අනුග්‍රහය** දෙමි. තවද මේ අරමුණ උදෙසා රජය මඟින් දිවයිනම ආවරණය වන පරිදි ආදර්ශ මට්ටමේ මධ්‍යස්ථාන පිහිටුවමි.

ළමා අපචාර, ස්ත්‍රී දූෂණය, පාතාල අපරාධ හා සංවිධානාත්මක අපරාධ පිටු දකින්නෙමි. ඒ සඳහා නීතිමය ව්‍යුහය ප්‍රතිසංවිධානය කරන්නෙමි. ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය තව දුරටත් ශක්තිමත් කරන්නෙමි.



ශ්‍රී ලංකාවේ මාර්ග නීති උල්ලංඝනය කිරීමද ඒ නිසාවෙන් මැනිය නොහැකි තරමේ ජීවිත හා දේපළ විනාශ වීමද අපගේ දෛනික අත්දැකීමක් වී තිබේ. මෙකී අවාසනාවන්ත තත්වය මුළුමනින්ම නිම කිරීම අත්‍යවශ්‍ය කරුණක් වන අතර, ඒ සඳහා කිසිදු බලවේගයකට යටත් නොවන ආකාරයට නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපරිම ආකාරයෙන් ආයතනගත නීති රීති ශක්තිමත් කිරීමට පියවර ගන්නෙමි.

## සෙනෙහස පිරි පවුලක්

### මුල් තැන අම්මාට


සමාජ බැඳීමේ ශක්තිය අපේ පවුලයි. එහි මුල්තැන අම්මායි. සමාජය වඩාත් සොඳුරු තැනක් කළ හැක්කේ පවුලේ එකිනෙකා අතර සම්බන්ධතා වඩා සමීප හා මිත්‍රශීලී ඒවා බවට පත් කිරීමෙනි. පවුලේ සාමාජිකයන් ආර්ථික වශයෙන් දුෂ්කරතාවට සහ පීඩාකාරීත්වයන්ට පත්ව සිටීම එබඳු මිත්‍රශීලී සම්බන්ධතා ඇතිවීම කෙරෙහි අහිතකර ලෙස බලපාන බව මගේ විශ්වාසයයි. එහෙයින් පවුලේ එක් එක් සාමාජිකයන්ගේ දුෂ්කරතා සහ පීඩාවන් මඟ හැරවීම පිණිසත් පවුල ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම පිණිසත් මම පැහැදිලි වැඩපිළිවෙලක් සකස් කර ඇත්තෙමි.

- **ගැබිණි මාතා සහන වැඩසටහන**

  තමන්ට අවශ්‍ය පෝෂණය ලැබීමට අසමත් සෑම ගැබිණි මවකටම අවශ්‍ය ආහාර ද්‍රව්‍ය අඩංගු පෝෂණ මල්ලක් නොමිලේ ලබා දීමට මම කටයුතු කරමි. එබඳු සෑම මවකටම අවශ්‍ය සුව සායන, උපදෙස් හා වෛද්‍ය සේවා ගමින් ගමට ලබා දීමට ද වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරමි.

### මුල් පස් වසර වැඩසටහන

සියලු හොඳ දේ දරුවන්ට ලබා දීම අරමුණු කර ගනිමින් දරුවන්ගේ පිබිදෙන ජීවිත අර්ථවත් කිරීම සඳහා දරුවන් වෙනුවෙන් නව අමාත්‍යාංශයක් පිහිටුවමි.



උපතේ සිට වසර පහ දක්වා දරුවන්ට **කිරි මිලදී ගැනීම සඳහා මසකට රුපියල් 200/- බැගින්** ලබා දීමට කටයුතු කරමි.

රට පුරා ඇති සියලු පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සියල්ල එකම ජාත්‍යන්තර ප්‍රමිතියකට ගෙන ඒමටත් ඒ සඳහා පෙර **පාසල් පාලිකාවන්ට අවශ්‍ය පුහුණුව තාක්ෂණය හා මූල්‍ය පහසුකම්** මාසිකව සැපයීමටත් පියවර ගන්නෙමි.

පූර්ව වියේ පසුබෑමට ලක්වන අපේ දරුවන් සඳහා විශේෂ අධ්‍යාපන ක්‍රමවේදයන් අරඹන්නෙමි.


රට පුරා ඇති ළමා නිවාසවල කළමනාකාරිත්වය විධිමත් කිරීමට කටයුතු කරන අතර, **දැනට ළමා නිවාසවල එක් ළමයෙක් සඳහා වෙන් කරන ලද මුදල දෙගුණයක් කරමි.**

## "යොවුන් දිරිය" වැඩසටහන

වර්ෂ 2001-2003 එ.ජා.ප. රජය සමයේ කිසිදු උපාධිධාරියකුට රැකියා නොදී දිග්ගැස්සූ විරැකියා පෝලිමෙන් උපාධිධාරීන් 42,000කට නිදහස් සන්ධාන රජයේ රැකියා සැපයීමේ වැඩ පිළිවෙලට අමතරව **2006 වසර තුළදී තවත් උපාධිධාරීන් 10,000කට රැකියා** ලබා දෙමි.

දැනට **රාජ්‍ය සේවයේ ඇති 33,000ක් පමණ වන පුරප්පාඩු ඉතා ඉක්මනින් පුරවනු ඇත. අනියම් හා තාවකාලික පදනමින් සේවයේ නියුතු සියලු දෙනාට ස්ථිර පත්වීම්** ලබා දිමට ක්‍රියා කරමි.

මේ වනවිට තමන්ගේ උපාධියට නොගැලපෙන රාජ්‍ය අංශයේ රැකියාවක යෙදී සිටින උපාධිධාරීන් සඳහා උපාධිධාරී සේවාවන් ස්ථාපනය කොට සමාන වැටුප් ලබා ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරමි.



දැනට රජයේ පාසල්වල සේවය කරන **සියලු ස්වේච්ඡා ගුරුවරුන්ට ස්ථිර පත්වීම්** ලබා දීමට කටයුතු කරමි.

මා වෘත්තිය පුහුණු ඇමතිවරයාව සිටි සමයේ "ජීවිතයට හැකියාවක්-හැකියාවට රැකියාවක්" යන තේමා පාඨය යටතේ රටේ වෘත්තීය පුහුණුව විධිමත් කළෙමි. එකී වැඩසටහන තවත් පුළුල් කොට හැකියාවන් හි ඌණතා නිසා අපේක්ෂා භංගත්වයට පත්ව සිටින තරුණ පිරිසට නූතන තාක්ෂණය මුසු, දේශීය වෙළඳපොළ සඳහා පමණක් නොව ජාත්‍යන්තර අවශ්‍යතාවන්ට ද මනාව ගැළපෙන කුසලතාවන් ලබාදෙමි. 'යොවුන් දිරිය' ලෙස හැඳින්වෙන එකී වැඩසටහන ඔස්සේ **2006 වසර තුළදී 50,000කටද, 2007 වසර තුළදී තවත් 50,000කටද ඉහළ වැටුපක් සහිත රැකියා අවස්ථාවන්** ලබාදෙමි.

## "දෑතට සවිය"

දැනට මේසන්වරුන්, වඩු කාර්මිකයින්, විදුලි කාර්මිකයින් සහ පයිප්ප වැඩ කරුවන් වැනි තාක්ෂණ ක්ෂේත්‍රයන් තුළ පුහුණුව ලබන **100,000 පමණ දෙනාට තමන් පුහුණුව ලත් ක්ෂේත්‍රයේ රැකියාවේ නියුතු වීමට අවශ්‍ය උපකරණ** ඇතුළු අනෙකුත් පහසුකම් ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

අපගේ නව ආර්ථික වැඩපිළිවෙල යටතේ ඇතිවන ශීඝ්‍ර සංවර්ධනය හේතු කරගෙන නිසි කළමනාකාරිත්වයකින් දියුණු වන **රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය සහ ස්වයං ව්‍යවසායකත්වය තුළින් ඇතිවන රැකියා අවස්ථාවන්ට අමතරව විදේශ රැකියා අවස්ථා ද ඇතුළුව රැකියා විසි හතර ලක්ෂයක් ඉදිරි වසර 06 තුළදී උදා කිරීමට** පියවර **ගන්නෙමි.**

## ආදායම් උපයන්නන්ට

සේවකයන්ගේ සංඛ්‍යාව අතින් ගත් විට වැඩි දෙනෙක් සේවයේ යෙදෙන්නේ පෞද්ගලික අංශයේ නමුත්, ඔබට වඩා ආකර්ෂණීය වන්නේ රාජ්‍ය සේවය බව මම දනිමි. **එබැවින් මගේ සේවා කාලය තුළ මම කිසි විටෙකත් රාජ්‍ය සේවය කප්පාදු නොකරමි.** එසේම පෞද්ගලික අංශය පිළිබඳව ඇති ඔබේ ආකල්පයන් ද



වෙනස් විය යුතු බව මම විශ්වාස කරමි. මෙම දෙඅංශයෙන්ම සිදුවිය යුත්තේ අපේ ජනතාවට කාර්යක්‍ෂම සහ මිත්‍රශීලී සේවාවක් ලබා දීමයි. එහිදී පෞද්ගලික අංශය දැනටමත් ඇතැම් කරුණු අතින් ඉදිරියෙන් සිටින බැවින් රාජ්‍ය අංශයේ ඵලදායීතාව, කාර්යක්‍ෂමතාව සහ මිත්‍රශීලීත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම අපේ යුතුකමකි. ඒ සඳහා පළමුව **රාජ්‍ය සේවයේ ගරුත්වය සහ ස්වාධීනත්වය** යළි ඇති කිරීමට මම පියවර ගනිමි.

**රාජ්‍ය අංශය**

- **2005 අයවැයෙන් ක්‍රියාත්මක වූ වැටුප් වර්ධකයේ ඉතිරි කොටස 2006 ජනවාරි** මාසයේ සිට ඔබට ලබා දෙන්නෙමි.
- මීට අමතරව වැඩිවන **ජීවන වියදම දරා ගැනීම සඳහා** ආරම්භක දීමනාවක් ලෙස මසකට **රුපියල් 1000 ක්** ගෙවීමට කටයුතු කරන්නෙමි. **සෑම හය මසකට වරක්ම වැඩිවන සෑම ජීවන අංකයකටම රුපියල් 2.50 බැගින්** ගණනය කර ඉහත රුපියල් 1000 ට එකතු කරන්නෙමි.
- හමුදා හා පොලිස් සේවා ඇතුළු රාජ්‍ය අංශයේ සියලු සේවකයන් 2005 වසර තුළ දී ලබා **නොගත් නිවාඩු සඳහා එක් දිනකට දෙගුණය බැගින් වූ හිලව් දීමනාව** ලබන වසරේ ජනවාරි මාසයේ පටන් ගෙවීමට කටයුතු කරමි.
- **රාජ්‍ය සේවකයකු පියකු වනවිට දින තුනක විශේෂ නිවාඩුවක්** ලබා දීමට පියවර ගන්නෙමි.
- **කාර්ය සාධනය මත පදනම් වන නව දිරි දීමනා ක්‍රමයක් හඳුන්වා දෙමි.**
- **පවුල්වල සාමාජිකයින්ද ආවරණය වන පරිදි රජයේ සේවකයන්ට නව සෞඛ්‍ය රක්‍ෂණ ක්‍රමයක්** ලබා දීමට කටයුතු කරමි.
- **රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ සංස්ථා, මණ්ඩලවල නිළධාරීන් සඳහා** අපේ රජයන් විසින් මීට පෙර අවස්ථාවල දී ක්‍රියාවට නංවා ඇති **තීරු බදු රහිත වාහන ආනයන බලපත්‍ර** නැවත ලබා දීමට කටයුතු කරමි.



- වර්තමානයේදී රජයේ සේවකයින්ට ලබා දෙන **පස් අවුරුදු වැටුප් නිවාස ණය ක්‍රමය දැනට හිමිකම් නොකියන රාජ්‍ය සංස්ථා වලටත්** ලබා දෙන්නෙමි. ණය මුදලේ ප්‍රමාණය දැනට පවතින උපරිමය වන **ලක්ෂ 20 සිට ලක්ෂ 30 ක් දක්වා වැඩි කරන අතර, කාලය වසර 5 සිට වසර 7 ක් දක්වා** දීර්ඝ කරමි.
- **රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප්** පිළිබඳව මෑත කාලයේ සිදු කරන ලද සියලු සංශෝධනයන් ඉවත් කොට මේ වනවිට **රාජ්‍ය සේවයේ යෙදෙන සියලු දෙනාටත් ඉදිරියේදී බඳවා ගන්නා සියලු දෙනාටත් විශ්‍රාම වැටුප්** ලැබීමට ඇති අයිතිය සහතික කරමි.
- සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල මඟින් එහි සාමාජිකයින්ගේ පහසුව සඳහා **විශේෂඥ වෛද්‍ය සේවා සහිත ආරෝග්‍යශාලාවක්** ආරම්භ කරමි.
- 1980 ජූලි වර්ජකයන්ගේ මෙතෙක් නොවිසඳී ඇති ගැටලු නිරාකරණය කිරීම සඳහා කඩිනම් පියවර ගන්නෙමි.

## පෞද්ගලික අංශය

- වසර ගණනක් තිස්සේම නිවැරදිව බදු ගෙවා අප රටේ සංවර්ධනයට දායක වූ බදු ගෙවන්නන්ට විශේෂ පිළිගැනීමක් ලබා දීමට මම අදහස් කරමි. ඒ සඳහා වසරකට රුපියල් 250,000කට අවමයකට යටත්වී වසර 5ක ආදායම් බදු ගෙවා ඇති සියලුම **පුද්ගල බදු ගෙවන්නන්ට තීරු බදු රහිතව වාහන ආනයන බලපත්‍රයක් ලබා දීමට කටයුතු කරමි.**
- පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා සේවක අර්ථසාධක අරමුදල, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ බැංකු ඒකාබද්ධ කොට **අඩු පොලියට නිවාස ණය ලබා දීමේ වැඩ පිළිවෙලක්** සකස් කරමි.

## විදේශ සේවා නියුක්තිය

ජාතික ආර්ථිකයේ සුරක්ෂිතභාවය වෙනුවෙන් විදේශ රැකියාවල නියුතු අප සහෝදර සහෝදරියන් කරනු ලබන කැප කිරීම මම මහත් සේ අගය කරමි. ඔවුන් සහ ඔවුන්ගේ පවුල්වල



ආරක්ෂාව හා සුභ සිද්ධිය වෙනුවෙන් අප මේ දක්වා අනුගමනය කර ඇති ක්‍රියා මාර්ගයන් හි පවතින දුර්වලතාවයන් මඟ හරවා ඔවුනට, ඔවුනගේ පවුල්වලට හා රටට ඉහළම ප්‍රතිලාභ ලැබෙන නව ක්‍රමවේදයක් සකසමි. ඒ අනුව,

- දැනටමත් විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් එළඹ තිබෙන එකඟතාවන්ට අනුව 2006 වසරේදී පමණක් **කොරියාව, මැලේසියාව ඇතුළු රටවල රැකියා** 100,000 ක් ලබා දීමට කටයුතු කරමි. ඊළඟ වසර වලදී මෙම සංඛ්‍යාව තවත් වැඩි කර ගැනීම සඳහා ඒ ඒ රටවල් සමඟ අලුත් එකඟතාවන් ගොඩනගා ගැනීමට කටයුතු කරමි.
- ගෘහ සේවිකාවන් වෙනුවට **හෙද, නාවික හා පරිගණක වැනි ක්ෂේත්‍ර සඳහා වැඩිපුර රැකියා අවස්ථා** උදා කරමි.
- විදේශ රැකියා කොට ආපසු පැමිණෙන අය සඳහා දෙනු ලබන **තීරු බදු රහිත දීමනාව ඇමෙරිකානු ඩොලර් 5,000 දක්වා ඉහළ නංවමි.** එසේම මෙරට පැමිණ **පළමු මාස 6 තුළදී එය පාවිච්චි කිරීමට** හැකිවන සේ නීති සංශෝධනය කරමි.
- රාජ්‍ය හා පෞද්ගලික බැංකු මඟින් 30% ක රජයේ දායකත්වයක් ඇතිව විශේෂ **නිවාස ණය යෝජනා ක්‍රමයක්** හඳුන්වා දෙමි.
- රැකියා සඳහා විදේශගත වන්නන්ට ඒ සඳහා වැයවන **මූලික වියදම් පියවීමට අවශ්‍ය බැංකු ණය පහසුකම්** ලබාදීමට අවශ්‍ය වැඩපිළිවෙළක් සකසන්නෙමි.
- විදේශ සේවා නියුක්තිකයන්ගේ **පවුල්වල දරුවන් සඳහා ගම් මට්ටමින් සුභ සාධන** ව්‍යාපෘති ආරම්භ කරමි.
- **විදේශ සේවා නියුක්තික කාන්තාවන්ගේ ආරක්ෂාව** තහවුරු කරමි.
- විදේශ රැකියාවලට යාමට බලාපොරොත්තු වන තරුණ තරුණියන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් **ලියාපදිංචි කර ඔවුනට අවශ්‍ය පුහුණුවීම්** ලබාදීමට කටයුතු කරමි.
- යුරෝපීය රටවල හෙද සේවය සඳහා විශාල ඉල්ලීමක් තිබේ. එම රැකියා වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් හෙදියන් හා



හෙද නිලධාරින් පුහුණු කිරීමට ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන **නව හෙද විදුහලක්** පිහිටුවනු ලැබේ.

- විදේශ රටවල සේවය කරන අය වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි.

## කාන්තා ඔබට "දිරිය කාන්තා" වැඩසටහන

අපේ පවුලේත්, සමාජයේත් පදනම කාන්තාවයි. නිවසේ සාමය පවත්වාගෙන යන්නී, ආර්ථික කළමනාකරණය කරන්නී, පවුලේ මෙහෙයුම දරන්නී ඇයයි. එබැවින් කාන්තාව සවිබල ගැන්වීම යනු සමාජයම සවිබල ගැන්වීමකි. **"දිරිය කාන්තා"** වැඩසටහන ඒ සඳහාය.

දැනට විදේශ වෙළඳාමේ දැවැන්තයින් බවට පත්ව සිටින ප්‍රමුඛ ව්‍යාපාරික ආයතන සම්බන්ධ කොටගත් විශේෂිත ස්වයං රැකියා ව්‍යාපෘතියක් ආරම්භ කරමි. ඒ යටතේ **ගමකින් තෝරාගනු ලබන කාන්තාවන් දහ දෙනෙකුට පළමු වසරේදීම අළුතින් ආදායම් මාර්ග** සපයා දෙන්නෙමි. විදේශ වෙළඳපොළට අවශ්‍ය අත් යන්ත්‍ර රෙදි පිළි, සෙල්ලම් බඩු සහ අත්කම් භාණ්ඩ ඔබේ නිවසේ සිටම නිෂ්පාදනය කර ආදායම් උපයන්නටත් එමඟින් අනුන්ට අත නොපා ජීවත් වන්නටත් හැකි ක්‍රමයක් සකසමි.

දැනටමත් කුඩා ව්‍යාපාරවල යෙදෙන, එහෙත් ඇප තැබීමට හැකියාවක් නොමැති නිසා බැංකු ණයක් ගැනිමට නොහැකිව ළතැවෙන ඔබට අලුතෙන් හඳුන්වාදෙන "**ලංකා පුත්‍ර**" **බැංකු සේවය තුළින් රජයේ මැදිහත්වීමෙන් ණය ලබා දීමේ ක්‍රමයක්** හඳුන්වා දෙන්නෙමි.

**හිංසනයට හා මානසික පීඩනයට ලක් වී ඇති අපේ කාන්තාවන් එයින් ගළවා ගැනීම සඳහා "කාන්තා පිළිසරණ"** වැඩසටහන රට පුරා ක්‍රියාත්මක කරමි. සුනාමිය හා යුද ගැටුම්වලින් පීඩාවට පත්ව ඇති අය සඳහා එහිදී විශේෂ අවධානය යොමු කරවමි.

කාන්තාවන් හිංසනයේ ගොදුරු බවට පත්වීම වැළැක්වීම හා දැනටමත් එසේ පීඩනයට ලක්වී ඇති කාන්තාවන් ඉන් මුදවා



ගැනීම සඳහා අවශ්‍ය උපදේශන, මඟ පෙන්වීම සහ රැකවරණය ලබා දීම පිණිස සුදුසු ආයතනික ව්‍යුහයන් සකස් කරමි.

වැටුප් ලබාගැනීම, දේපොළ හිමිකම, පොදු ආයතනවල ක්‍රියා කිරීම, රජයේ සේවා හා වරප්‍රසාද ලබා ගැනීම යනාදී සෑම අංශයකදීම ස්ත්‍රීන් හා පුරුෂයන් අතර කිසිදු අසමානතාවක් ඇති නොවන පරිදි නීති රීති සකසමින් **සමානාත්මතාවයේ හා සාධාරණත්වයේ අයිතිය භුක්ති විඳීමට අප රටේ කාන්තාවන්ට සියලු ඉඩකඩ** විවර කර දෙමි.

දැනටමත් සකස් කර ඇති කාන්තා අයිතීන් සුරැකීමේ නීති රීති ද ඇතුළත් වන පරිදි කාන්තා අයිතිවාසිකම් ආරක්ෂණ ප්‍රඥප්තිය වසරක් තුළ දී සම්පාදනය කරන අතර, එයට වඩාත් ශක්තිමත් හා බලසම්පන්න අර්ථයක් එකතු කිරීම සඳහා දැනට කාන්තා අයිතීන් වෙනුවෙන් පෙනී සිටින ආයතන හා රාජ්‍ය නොවන සංවිධානවලට ආරාධනා කරමි.

පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල **අපේක්ෂක ලැයිස්තුවල කාන්තා නියෝජනය අවම වශයෙන් 25% කින් වැඩි** කිරීමට කටයුතු කරමි.

## "ජ්‍යෙෂ්ඨ පුරවැසි බුහුමන්" වැඩසටහන

තම ජීවිතය දරුවන් වෙනුවෙන්, රට දැය වෙනුවෙන් කැපකළ ජ්‍යෙෂ්ඨ පුරවැසියනට තනිවෙන්නට මම ඉඩ නොතබමි.

රජයේ සේවකයන්ගේ **වැටුප් වැඩි කිරීම්වලට සාපේක්ෂව විශ්‍රාම වැටුප් ද වැඩි කිරීමට** පියවර ගන්නෙමි.

දැනට විශ්‍රාම වැටුප් ලබන සියලු සේවා කාණ්ඩයන් හී පවතින **විෂමතා ඉවත් කොට විශ්‍රාමිකයන්ගේ ආත්ම ගෞරවය ආරක්ෂා වන අන්දමට විශ්‍රාම වැටුප් ක්‍රමය සංශෝධනය කරමි.**



***දෘෂ්ටි ආබාධ සඳහා අවශ්‍ය ඇස් කණ්ණාඩි නොමිලේ ලබා දීමට පියවර ගනිමි.***

රාජ්‍ය ප්‍රවාහන සේවාවන්හි දී වයස 70 ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් **සඳහා 50% ක ගාස්තු අඩු වීමක් සැළසුම් කරමි.**

**වසරකට වරක් ආගමික වන්දනාවක් සඳහා මෙකී ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ දුම්රිය බලපත්‍ර** ලබා දෙමි.

සියලු අතින් අසරණ වන අපේ දෙටු පුරවැසියන් වෙනුවෙන් රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශයේ සහාය ඇතිව වැඩිහිටි නිවාස පද්ධතියක් ඉදි කෙරෙනු ඇත.

දැනට කිසිදු විශ්‍රාම වැටුපක් හෝ අර්ථ සාධක අරමුදලේ හිමිකමක් නොලබන ගොවි, ධීවර, ත්‍රී රෝද රථ රියදුරු, සුළු ව්‍යාපාරික වැනි කටයුතුවල නිරත නමුත් සේවායෝජක විසින් සේවා නියුක්තික-යන්ගේ භාර අරමුදල් මණ්ඩලයට දායක මුදල් ගෙවනු නොලබන **සියලුම ස්වයං රැකියා ලාභීන්ට ජාතික විශ්‍රාම වැටුප් ක්‍රමය** යටතේ ප්‍රතිලාභ ලබා දෙන්නෙමි.

## ආබාධිත තත්ත්වයන්ට පත් වූ පුරවැසියන්

දෑස තිබියදී නොදකින, සවන් තිබියදී නොඅසන, දෑත් දෙපා තිබියදී නිසි දෙයට නොයොදවන මිනිසුන් සහිත සමාජයක කායිකව හෝ මානසික ආබාධිතයන්ගෙන් යුත් ඔබ කිසිදු වෙනස්කමකින් තොරව ගෞරවණීය පුරවැසියන් ලෙස මම පිළිගනිමි.

**කිසිදු ආදායමකට හිමිකමක් නොලබන ආබාධිත සහිත පුද්ගලයන් සිටින පවුලක් සඳහා මසකට රුපියල් 3,000 ක් ලබා දෙන්නෙමි.**

**දැනට අඳ, ගොළු, බිහිරි වශයෙන් සමාජයෙන් වෙන් කොට පවත්වාගෙන යනු ලබන පාසල් වෙනුවට රජයේ ජනප්‍රිය පාසල්වල ඒ සඳහා වෙන් වූ අංශ ඇති කිරීමට කටයුතු කරමි.** මේ හරහා ආබාධිත තත්වයෙන් යුත් පුරවැසියන් සමාජයේ වෙනස් කණ්ඩායමක්ය යන මතය දුරු කිරීමට හැකි වේයැයි මම විශ්වාස කරමි.

රැකවරණයක් නොමැති ඔබ වෙනුවෙන් රජයෙන් **"රැකවරණ නිවාස"** ඉදි කරමි. ඔබ අයත් වන්නේ ආබාධිත ජනගහනයේ



කිසිදා පාසල් අධ්‍යාපනය ලබා නොමැති කොටසකට වුවද ඔබට යහපත් රැකියාවක යෙදෙන්නට අවශ්‍ය වෘත්තීය පුහුණුව ලබාදීමට මම කටයුතු කරමි.

**සේවකයින් 100 කට වැඩි සංඛ්‍යාවක් සිටින ආයතනවල සේවා නියුක්තියෙන් 3%ක් ඔබ වෙනුවෙන් වෙන් කිරීමට** මම කටයුතු කරමි.

**ප්‍රසිද්ධ ගොඩනැගිලිවල ආබාධිතයන් සඳහා නව ප්‍රවේශ මාර්ග** ඇති කරන්නෙමි.

අප වෙනුවෙන් දෑත් දෙපා කැපකොට **ආබාධිත වූ සියළුම රණවිරුවනට වසර තුනක් තුළදී නිවසක්** ලබා දෙන්නෙමි.

ඔවුන්ට ප්‍රමුඛත්වයක් ලැබෙන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ගොඩ නඟන්නෙමි.

රණවිරුවන්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් පැන නැගී ඇති සියළු ගැටළු වහාම නිරාකරණය කරන්නෙමි.

ආබාධිත තත්වයන්ට පත් වූවන්ට **වකුගඩු බද්ධ කිරීම, හෘද සැත්කම් ආදියේදී දැනට ජනාධිපති අරමුදලින් ලබාදෙන 50% වෙනුවට 100% ම** ලබා දීමට කටයුතු කරමි.

ආබාධිත තත්වයට පත් වූවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පතට පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය පියවර ගන්නෙමි.

## පවුලේ ජීවන බර සැහැල්ලු කිරීමට

ජීවන වියදම අඩු කිරීම සඳහා අවශ්‍ය ප්‍රධානම සාධකය වන්නේ පුද්ගලයාගේ ආදායම් මට්ටම ඉහළ නැංවීමයි. මෙම ප්‍රකාශනය පුරාම ඉදිරිපත් වන සියලු කරුණු කේන්ද්‍රගත වන්නේ පුද්ගලයාගේ සහ පවුලේ ආදායම ඉහළ නංවන ව්‍යාපෘතීන් මතයි. නමුත් ඒවායේ ප්‍රතිඵල අත්දැකීමට කිසියම් කාලයක් වැයවන බව මම නිහතමානීව පිළිගන්නෙමි. එතෙක් පුද්ගලයාගේ එදිනෙදා ජීවිතයේ ප්‍රශ්න ජය ගැනීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවීමට මම අදහස් කරමි.



1. වසර පහ දක්වා දරුවන්ට කිරි මිලදී ගැනීම සඳහා මසකට රුපියල් 200/- ක සහනාධාරයක් ලබාදෙමි.

2. වැඩිවන ජීවන වියදම දරාගැනීම සඳහා ආරම්භක දීමනාවක් ලෙස රජයේ සේවකයන්ට රුපියල් 1000ක් ගෙවීමට සහ වැඩිවන ජීවන අංකයකට රුපියල් 2.50 බැගින් ගෙවීමට පියවර ගන්නෙමි.

3. ජීවන බර සැහැල්ලු කිරීම උදෙසා,

   I. අවම ප්‍රමාණයේ ජල පාරිභෝගික කාණ්ඩය සඳහා මාසිකව රුපියල් 20 ක වට්ටමක් ද,

   II. අඩුම මාසික විදුලි පරිභෝජනයක් ඇති කාණ්ඩය සඳහා මසකට රුපියල් 30 ක වට්ටමක් ද,

   III. විදුලි බලය නොමැති අඩු ආදායම්ලාභි නිවෙස්වලට මසකට ලීටර් 2 ක භූමිතෙල් සහනාධාරයක් ද 2006 මාර්තු මාසයේ සිට බල පැවැත්වෙන පරිදි ලබා දෙන්නෙමි.


   අඩු පිරිවැය සහිත බලශක්ති නිෂ්පාදන ක්‍රම භාවිතා කිරීම තුළින් ද, විදුලි, ඛනිජ තෙල් හා ජල සම්පාදන රාජ්‍ය ආයතන කාර්යක්ෂම කිරීම තුළින් ද, මෙම සේවාවල මිල පොදු ජනතාවට දරා ගත හැකි මට්ටමක දීර්ඝ කාලීනව පවත්වා ගැනීමට කටයුතු කරමි.

4. ගැබිණි මව්වරුන්ට පෝෂණ මල්ලක් නොමිලේ ලබා දෙන්නෙමි.

5. දරුවන්ගේ දිවා ආහාරය සඳහා බත් වේලක් නොමිලේ ලබා දෙන්නෙමි.

6. නව ලංකා ස.තො.ස ආරම්භ කර රට පුරා වෙළඳ සැල් විවෘත කොට සහල්, සීනි, පරිප්පු, කිරිපිටි, කුළු බඩු, පොල්තෙල් ඇතුළු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල පහත හෙළීමට කටයුතු කරමි. ඒ තුළින් සෑම දුප්පත් පවුලකටම සතියකට ප්‍රමාණවත් හාල්, කරවල, එළවළු ඇතුළු ආහාර මල්ලක් පහසු මිලට ලබා දීමට කටයුතු කරමි.





7. සහල්, එළවළු, ළූණු වැනි අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගොවියාගෙන් සෘජුව මිලදී ගැනිමට හා පාරිභෝගිකයාට පහසු මිලට අලෙවි කිරීමට රජය තරගකාරී ලෙස මැදිහත් වනු ඇත. මේ සඳහා වී අලෙවි මණ්ඩලයද, නව ලංකා ස.තො.ස සහ සමුපකාර ජාලය ද ඵලදායි ලෙස යොදා ගනිමි.

8. නිතර පරිහරණය කරන ආහාර හා බෙහෙත් ද්‍රව්‍ය ආදිය ආනයනය කිරීම පුද්ගලික අංශයට පමණක් සීමා නොකර රජයද ඒ සඳහා කාර්යක්ෂමව මැදිහත් කරවමි. පාරිභෝගිකයාට දුෂ්කර අවස්ථාවලදී පහසුවෙන් හා හිඟයකින් තොරව එම භාණ්ඩ ලබා ගැනීමට ඉඩ සලසා දෙමි.

9. සියළුම පොහොර වර්ගවල කිලෝ 50 ක මිල රු. 350 ක් දක්වා අඩු කරමි. ඉන් නිෂ්පාදන වියදම අඩු කිරීමෙන් හා නිෂ්පාදනය වැඩි කිරීමෙන් සහල්, එළවළු, පළතුරු ඇතුළු දේශීය නිෂ්පාදනවල මිල පහත හෙලීමට කටයුතු කරමි.

## පවුලේ අගහිඟකම් නිමාවට “සමෘද්ධි”


පවුලේ අගහිඟකම් නිම කිරීම සඳහා අප විසින් අරඹන ලද සමෘද්ධි ව්‍යාපාරය විසින් මේ වන විට අත්පත් කර ගෙන ඇති ජයග්‍රහණයන් පිළිබඳව මම සතුටට පත් වෙමි. එබැවින් මම තවදුරටත් සමෘද්ධි ව්‍යාපාරය පිළිබඳව විශ්වාසය තබන අතර ඊට නව මුහුණුවරක් ලබා දෙමින් දුගීකම දුරලීම සඳහා ජනතාව සවිබල ගැන්වීමේ වැඩසටහන වඩාත් ශක්තිමත් කරමි.

**සමෘද්ධි සහන**

- සමෘද්ධිලාභීන්ගේ මාසික ආදායම රුපියල් 5000 දක්වා වැඩි කර ගැනීමට හැකියාව ලැබෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කරමි. ඒ සඳහා රුපියල් කෝටි 300ක ප්‍රාග්ධනයක් අයවැයෙන් වෙන් කරමි.



- සමෘද්ධි සහනාධාර ලැබීමට සුදුසුකම් ඇතත් විවිධ හේතූන් නිසා එම හිමිකම අහිමි වී ඇති අය අළුතින් සමෘද්ධි වැඩසටහනට ඇතුළත් කරමි.
- **සමෘද්ධි දීමනාව 50% කින් ඉහළ නැංවීමට කටයුතු කරමි.**
- වයෝවෘද්ධ, ආබාධිත පවුල් සඳහා රුපියල් 3,000 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.
- **සෑම සමෘද්ධි ප්‍රතිලාභි පවුලක් වෙතම මරණයකදී ලැබෙන රුපියල් 5,000ක දීමනාව රුපියල් 10,000ක් දක්වා වැඩි කෙරේ.**
- **දරු ප්‍රසූතියකදී ගෙවනු ලබන රුපියල් 2,500ක මුදල වහාම ක්‍රියාත්මක වන පරිදි රුපියල් 5,000 දක්වා වැඩි කරනු ලැබේ.**
- **සමෘද්ධි සහනාධාර පවුල් සවිබල ගැන්වීම සඳහා රුපියල් 100,000ක ණය** මුදලක් ලබා දීමට කටයුතු කරමි.
- සමෘද්ධිලාභී පවුල්වලට ලබාදෙන රක්ෂණයක් යටතේ **පවුලේ ගෘහ මූලිකයා මිය ගියහොත් හෝ ආබාධිත තත්වයට පත් වුවහොත් හෝ රු. 2,50,000ක් ලබා දීමෙන් පවුලේ ආදායම සහතික කර ගැනීමේ මගකට** යොමු කෙරේ.
- **සමෘද්ධි ප්‍රතිලාභි පවුලේ දරුවන් සඳහා පිරිනමනු ලබන ශිෂ්‍යත්ව දීමනාව 50% කින් වැඩි කරනු ලැබේ.**
- සමෘද්ධි බැංකු, ණය ආධාර හා රක්ෂණ, ගැමි පුබුදු හා ජන පුබුදු වැනි වැඩසටහන් කඩිනම්ව හා විධිමත්ව තවදුරටත් ක්‍රියාත්මක කෙරේ.
- සමෘද්ධි වැඩසටහනට ඇතුළත් වන්නන්ගේ කෘෂිකාර්මික හා පශු නිෂ්පාදනයන් රජය විසින් මිලදී ගැනීමට ක්‍රමයක් ද සකස් කරමි.



**සමෘද්ධි නිලධාරීන්ගේ ගැටලු විසඳීම**

- සමෘද්ධි නිලධාරීන් හා කළමනාකරුවන්ගේ විශ්‍රාම වැටුප් ඇතුළු අනෙකුත් ප්‍රශ්න සොයා බැලීමට කොමිසමක් පත් කරමි.
- අනෙකුත් රාජ්‍ය සේවකයන්ට මෙන් සමෘද්ධි නිලධාරීන්ටද නිවාස ණය ලබා දීමට කටයුතු කරමි.
- යතුරු පැදි ලබා දීමේ වැඩ පිළිවෙල මාස තුනකින් සම්පූර්ණ කරන්නෙමි.

## ජන සෙවන

ශ්‍රී ලංකාවේ සෑම පවුලක්ම නිවසක් හිමි පවුලක් විය යුතු බව මම දැඩිව විශ්වාස කරමි. එකී උතුම් අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා,

- **නිවාස ඉදි කිරීම සඳහා බිම් කොටස් ලක්ෂයක්** ලබා දෙන්නෙමි.
- කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල රජයේ සේවකයින් වෙනුවෙන් තට්ටු නිවාස යෝජනා ක්‍රම 4 ක් ක්‍රියාත්මක කරමි.
- කොළඹ නගරය තුළ **පැල්පත් හා සෙසු අවිධිමත් නිවාසවල වෙසෙන ජනතාව සඳහා නව නිවාස 65,000 ක්** ඉදි කෙරෙනු ඇත.
- පළමු වසර පහේදී **පොළිය පමණක් ගෙවීමේ ක්‍රමය සහිත නිවාස ණය යෝජනා ක්‍රමයක්** ඇති කිරීමට පියවර ගන්නෙමි.
- **සෑම ගමකටම වසරකට, නිවාස 25** බැගින් ඉදි කෙරෙනු ඇත.
- මධ්‍යම පාන්තිකයින් සඳහා **පහසු මිලට තට්ටු නිවාස** ඉදි කෙරෙනු ඇත.
- **විදේශගත ශ්‍රමිකයින් සඳහා රජයෙන් 30% ක දායකත්වය ලබාදෙන නිවාස ණය ක්‍රමයක්** සකස් කිරීමට පියවර ගන්නෙමි.



අඩු ආදායම් නාගරික ජනාවාස වැඩසටහන යටතේ නිවාස තැනීමට දෙන ලද පර්චස් දෙකක ඉඩම් කැබැල්ලේ පූර්ණ අයිතිය එහි වත්මන් පදිංචිකරුවන්ට ලබා දෙන්නෙමි. ඒ වෙනුවෙන් මුද්දර ගාස්තු හෝ ඔප්පු ගාස්තු අය කරනු නොලැබේ.

නාගරික මහල් නිවාස ඇතුළු **රජයේ නිවාස යෝජනා ක්‍රමවල පදිංචිකරුවන්ට එම නිවාසවල සින්නක්කර අයිතිය** ලබා දෙන්නෙමි.

දියවර, දියවර විසිරි, ජන උදාන, ගම් උදාන ආදී විවිධ නම්වලින් ඉදිකර ඇති **නිවාස යෝජනා ක්‍රම යටතේ ලබා දී ඇති නිවාස ණය හා පොළියද කපා හැර එම නිවෙස්වල සින්නක්කර අයිතිය** ලබාදෙමි.

## සමෘද්ධිමත් ගමක්

### ගම නැඟුම

මාගේ ජීවිතය විකසිත වූයේ කුරහන් හේන් පිස හමා ආ ගැමි සුවඳිනි. ඒනිසාම සොඳුරු බවින්, සෙනෙහසින් හා සෞන්දර්යයෙන් පිරුණු ගම පිළිබඳ මා දකින සිහිනය 'ගම නැඟුම' ලෙස යථාර්ථයක් බවට පත් කරමි. පසුගිය දශක ගණනාව තුළ අපේ දෑස් ඉදිරිපිටදීම පිරිහීමට ලක් වූ ගම පුනර්ජීවනය කරමි.

ඒ සඳහා නව පරිපාලන ව්‍යුහයක් වශයෙන් "ජන සභාව" ඇති කරමි. විහාරාධිපතීන් වහන්සේ, හින්දු, ඉස්ලාම්, කිතුණු ආගම්වල පූජක උතුමන් ඇතුළු පැවිදි නායකත්වයද, ගමේ සියලු ප්‍රජා සංවිධාන නායකත්වයද, ප්‍රාදේශීය සභාවල ජනතා නියෝජිතයන් ද, ගම නියෝජනය කරන සියලු රාජ්‍ය නිලධාරීන් ද ඊට ඇතුළත් වනු ඇත. ඒ ඔස්සේ ගමේ යහපත සඳහා ගමට අදාළ තීන්දු ගැනීමට ඉඩකඩ සැලසෙනු ඇත.

ගමේ සිටින පහළ මට්ටමේ රාජ්‍ය සේවකයන් ද, ගමේ අනෙකුත් ප්‍රජා සංවිධාන ද එක ස්ථානයකට ගොනු කරන්නා වූ "ජන සභා ලේකම් කාර්යාල" ක්‍රමයක් හඳුන්වා දී ගමට ලබාදෙන රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීමේ වැඩ පිළිවෙලක් හඳුන්වා දෙමි.



විශ්ව දැනුම ගමට ගෙන ඒම, ගමේ දැනුම ලෝකය සමඟ හුවමාරු කරගැනීම සහ සේවාවන් කාර්යක්ෂමව ලබාගැනීම අරමුණු කර ගනිමින් පිහිටුවන්නා වූ "නැණ සල" මධ්‍යස්ථාන ද, 'e' විද්‍යුත් පුස්තකාලද මේ ජන සභා ලේකම් කාර්යාල සමඟ සම්බන්ධ කෙරෙනු ඇත.

- විදුලිය නොමැති සෑම ගමකටම විදුලිය
- සෑම ගමකටම පොදු දුරකථන සේවාවක්
- හිඟයකින් තොරව පානීය ජලය
- කෙත් බිම් සඳහා වාරි ජලය
- 'මග නැගුම' තුළින් ග්‍රාමීය ප්‍රවේශ මාර්ග
- යටිතල පහසුකම් සංවර්ධනය
- මානව හා භෞතික සම්පතින් පිරුණු ගමේ පාසල
- ගම සුවපත් කොට රැක බලා ගන්නා සෞඛ්‍ය මධ්‍යස්ථානය
- පහසු මිලට බඩු ගැනීමට සමුපකාරය සහිත කඩමණ්ඩිය
- වී ගබඩාව, පොහොර ගබඩාව සහ වී මෝල
- "රැකියා බිහි දොර" කර්මාන්තශාලාව
- සිඟිති උයන මැදි කොටගත් පෙර පාසල
- ප්‍රජා ශාලාවට යා වූ ක්‍රීඩා පිටිය
- සොඳුරුබර "වන පියස"
- පොදු සුසාන භූමිය

මේ සියල්ල ගම නැගුමේ පොදු අරුත සාක්ෂාත් කරනු ඇත.

**පස් වසරක් තුළ සෑම ගමකම නව නිවාස 125 ක් තනවන්නෙමි.** එයින් නිවාස 25 ක් පළමු වසරේදීම නිම කෙරෙනු ඇත. එමඟින් ගම් තුළම වැලි, ගඩොල් කර්මාන්තද මේසන් වැඩ, වඩු වැඩ වැනි සේවාවන්ද ස්වයංව වර්ධනය කිරීමටත්, අලුත් රැකියා බිහි කිරීමටත් බලාපොරොත්තු වෙමි.



සෑම ගමකම සුළු කර්මාන්ත ව්‍යාපෘති ඇරඹෙනු ඇත. අපේ ඉපැරණි කර්මාන්ත වූ පිත්තල වැඩ, යකඩ වැඩ, ලාක්ෂා වැඩ,

අමු රෙදි විවීම්, පන් පැදුරු වැඩ ආදියට අමතරව සෙල්ලම් බඩු නිපැයීම, මැටි වැඩ, සායම් වැඩ, ආහාර නිපැයුම්, සේවා නිපැයුම් ආදී විවිධ කර්මාන්ත ඒ ඒ ගමට ආවේනික හැකියාවන් අනුව සංවර්ධනය කරමි. **එවැනි එක් ව්‍යාපාතියකට රුපියල් 100,000 බැගින් ලබා දෙමි.**

**ගොවි ගම්මානවල ගොවි පවුලකට වී බිස්සක් ඉදි කර ගැනීම සඳහා රු. 10,000 බැගින්** ලබා දී ගෙදරම වී ගබඩා කිරීමට පහසුකම් ඇති කරන්නෙමි. එමගින් වී ගබඩා හිඟය මඟ හරවා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

එමෙන්ම, සෑම ගොවි ගම්මානයකටම අවශ්‍යතාව පරිදි **ග්‍රාමීය වී ගබඩාවක් හා වී මෝලක්ද, ආහාර ගබඩාවක්ද**, ආරම්භ කිරීමට කටයුතු කරමි.

**දරුවන්ගේ පාසල් වසා දැමීම වෙනුවට ඒවා ශක්තිමත්ව ගොඩ නංවමි.** බීමත්කම, සූදුව ආදියෙන් වැනසෙන ගැමි ජීවිත ගොඩ නැංවීම සඳහා භික්ෂූන් වහන්සේගේ හා ආගමික නායකයින්ගේ සහය ලබාගැනීමට ක්‍රියා කරමි.

එමෙන්ම ගමේ දැව අවශ්‍යතා සඳහා සෑම ගමකම **උස්බිම් ජල පෝෂිත ප්‍රදේශද ආවරණය වන පරිදි "වන පියස"** ව්‍යාපෘති ද ඇති කරමි.

මෙලෙස මා විසින් යෝජනා කරනු ලබන 'ගම' යථාර්ථයක් වනුයේ එකී ව්‍යාපෘතිය සඳහා නිවැරදි කළමනාකරණයක් හිමිවන්නේ නම් පමණි. ඒ වෙනුවෙන් රාජ්‍ය නිලධාරීන් හා ගම සම්බන්ධ කිරීමට විශේෂයෙන් පුහුණුව ලැබූ උපාධිධාරියකුගේ සේවය සෑම ගමකටම ලබාදීමටද, අදාළ ජන සභා ලේකම් කාර්යාල හා ජනාධිපති ලේකම් කාර්යාලය අතර සෘජු සම්බන්ධතාවක් ඇති කිරීමටද මම අදහස් කරමි. එසේම "නැණ සල" ගමේ ජනතාව ලෝකයා සමඟ එකතු කරමින් විශ්ව 'ගම්මාන සංකල්පය ද අර්ථවත් කරනු ඇතැයි මම විශ්වාස කරමි.



## අපේ රට අපි හදමු

මේ රටේ නිදහස උත්තරීතර ය. කිසිදු බෙදුම්වාදයකට මම ඉඩක් නොතබන්නෙමි. කිසිම අයකුට අප රටේ ජනසම්මතවාදය විනාශ කිරීමට මම ඉඩ නොදෙන්නෙමි. අපේ රටේ ශිෂ්ටාචාරය ගොඩ නැඟුනේ මෙත්තාව, මුදිතාව, කරුණාව, තුළිනි. මිනිසා පමණක් නොව සතා සිවුපාවා ගහකොළ මහ පොළොව දක්වා පැතිරුණු මෙත් සිත එහි පදනම විය. විවිධ හේතු නිසා ඉරිතැලී ගිය මේ සිත් නැවත එක් ජාතික අරමුණකට ගොනු කරවීම මාගේ අපේක්ෂාවයි. සියල්ලන්ගේ ජාතික හා ආගමික අනන්‍යතාවන්ට ගරු කිරීම, කිසිවකුට බලය යොදා හිරිහැර නොකිරීම, පුද්ගල නිදහස හා සමාජ නිදහස සුරැකෙන නව සමාජයක් බිහිකිරීම මාගේ බලාපොරොත්තුවයි.

### දැහැමි රටක්

අපේ සමහර නායකයන් අපව ආගමෙන් ඈත් කිරීමෙන් සිදුවුයේ "දහම් දිවයින" නමින් අතීතයේ දි හැඳින්වුණු අපේ රට අපරාධ රැල්ලකින් වෙළී යාමයි. මේ අපරාධ රැල්ලෙන් මිදීමට මා යෝජනා කරන්නේ පන්සල-පල්ලිය-කෝවිල වෙත ජනතාව සමීප කරවීමයි. ඒ අරමුණ ඉටුකර ගැනීමට මම මතු දැක්වෙන වැඩපිළිවෙල ක්‍රියාත්මක කරමි.

බුදු සසුනට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති ප්‍රමුඛස්ථානය තහවුරු කිරීමට අවශ්‍ය විධි විධාන යොදන අතර හින්දු-ඉස්ලාම්-ක්‍රිස්තියානි ඇතුළු අනෙකුත් සෑම ආගමකටම සමානාත්මතා පදනමකින් සැලකෙනු ඇත.

රටේ තීරණාත්මක අර්බුදයන් හි මහ සඟ රුවන ප්‍රමුඛ ආගමික නායකයන්ගේ අනුශාසනා නිරතුරුවම රාජ්‍ය නායකයාට ලබාගත හැකි උත්තරීතර සාමයික සභාවක් පිහිටුවන්නෙමි.

ඕනෑම රටක භික්ෂූන් වහන්සේලාට බෞද්ධ අධ්‍යාපනය ලබා දිය හැකි මට්ටමේ බෞද්ධ භික්ෂු විශ්ව විද්‍යාලයක් ශ්‍රී ලංකාවේ පිහිටුවමි.



සියලු ආගම්වලට අයත් ස්වේච්ඡා දහම් පාසල් ගුරුවරුන් සඳහා දීමනා ක්‍රමයක් සකස් කිරීමට ද පියවර ගනු ලැබේ.

**මෙතෙක් පිරිවෙන් ශිෂ්‍යයන් සඳහා රජයෙන් ලබා දෙන ලද රුපියල් 1,000ක ප්‍රතිපාදනය රුපියල් 2,000 ක් දක්වා වැඩි කරන්නෙමි.**

ආගමික සිද්ධස්ථාන මුල් කරගෙන "නැණ සල" මධ්‍යස්ථාන අරඹමි.


ආර්ථික වශයෙන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දී ඇති **ආගමික සිද්ධස්ථාන නඩත්තු කිරීම සඳහා විශේෂ වැඩසටහනක්** සකස් කරන්නෙමි.

බ්‍රිතාන්‍ය පාලන යුගයේ පැනවුණු විහාර දේවාලගම් ආඥා පනත යල් පැන ගොස් ඇති බැවින් බෞද්ධ විහාර සහ දේවාල සතු දේපොළ පාලනය පිළිබඳ කාලානුරූපී වෙනස්කම් සහිත නව පනතක් ගෙන එමි.

සුනාමි ව්‍යසනයෙන් සහ ගැටුම්වලින් විනාශ වුණු සියලු බෞද්ධ, හින්දු, කිතුණු, ඉස්ලාම් ආගමික සිද්ධස්ථාන කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරමි.

දඹදිව වන්දනාවේ යන බොදුනුවන්ට ද, මක්කම වන්දනාවේ යන ඉස්ලාම් බැතිමතුන්ට ද, ශුද්ධ වූ භූමිය වන්දනා කිරීමට යන කිතුනුවන්ටද එකී සංචාරයන් හි ආරක්ෂාව සහ අවම පහසුකම් සහතික වන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරමි.

මඩු පල්ලිය ආශ්‍රිතව ඇති භූමිය විශේෂයෙන් වෙන් කරන ලද භූමියක් ලෙස හඳුන්වමින් එහි නඩත්තුව මුළු වර්ෂය පුරාම කතෝලික සභාවේ අධීක්ෂණයට යටත් කරනු ලැබේ. ඒ මඟින් එම ප්‍රදේශයේ නීති විරෝධී දැව කැපීම අවම කර ගැනීමට අදහස් කෙරෙන අතර එම ප්‍රදේශයේ බැතිමතුන් සඳහා නිවාස 500 ක් තනනු ලැබේ. එම ප්‍රදේශයේ සංවර්ධනය පුළුල් සැළැස්මක් ඔස්සේ කරනු ලබන අතර එම පළාතේ ගෞරවය සහ පූජනීය භාවය රැකෙන ආකාරයට අනෙකුත් සේවාවන් ද පහසුකම් ද සපයනු ලැබේ.



තලවිල, තේවත්ත, වහකෝට්ටේ, හිනිදුම මාතර වැනි කතෝලික බැතිමතුන්ගේ වන්දනාවට පාත්‍ර වී ඇති සිද්ධස්ථානවලට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කරමි.

හින්දු ලබ්ධිකයන්ට තම ආගම ඇදහීම සඳහා ඇති අයිතිය තහවුරු කරන අතර, ඒ සඳහා අවශ්‍ය රාජ්‍ය මැදිහත්වීම නොඅඩුව ලබා දෙමි.

පුරා විද්‍යාත්මක වටිනාකමක් සහිත හින්දු පුද බිම් සංරක්ෂණය කොට ජාතික පූජා භූමි ලෙස නම් කිරීමට කටයුතු කරමි.

දිවයින පුරා පිහිටි හින්දු ආගමික පාසල් සඳහා අවශ්‍ය සම්පත් සහ මූල්‍ය ආධාර සැපයීම සඳහා අවශ්‍ය පියවර ගන්නෙමි.

මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරුන් ගේ සහ මරණ පරීක්ෂකවරුන් ගේ පුරප්පාඩු කඩිනමින් පියවීමට කටයුතු කරන අතර, හඳුනාගත් ප්‍රදේශ සඳහා නව තනතුරු ඇති කරන්නෙමි.

නීතිය අනුව ආගමික අවසන් කටයුතු කිරීමේදී මතුවිය හැකි බාධාවන් නිමා කිරීමට අවශ්‍ය නෛතික පසුබිම සකස් කරමි.

### "අතීත අභිමන හෙටටත්"

ශ්‍රී ලංකාවේ සියලු ඓතිහාසික හා ජාතික උරුමයන් සුරක්ෂිත කොට අනාගත පරපුරට දායාද කිරීම රජයේ ප්‍රමුඛ වගකීමක් ලෙස සළකන්නෙමි.

"උරුම අරුණ" ව්‍යාපෘතිය යටතේ ඓතිහාසික හා පුරා විද්‍යාත්මක ස්ථාන 10,000 ක් සංරක්ෂණය කෙරේ. පෞරාණික උරුමයන් බවට පත්ව ඇති පුරා වස්තු විනාශ කිරීම, විකිණීම හෝ මිලදී ගැනීම වැනි ක්‍රියාවල නිරත වන්නන්ට දැඩි දඬුවම් පැමිණ වීමට නීති සකස් කෙරේ.



## නොබෙදුණු රටක් - බහුතර සම්මුතියක් - ගෞරවණීය සාමයක්

උතුරු හා නැගෙනහිර පවත්නා අර්බුදය පිළිබඳව නැවුම් ලෙස සිතන්නටත් අලුත් විසඳුම් මගක් සෙවීමටත් මම අදිටන් කර ගෙන සිටින්නෙමි. අතීතයේදී සිදු වූ ගැටුම්වලදී ද සාම සාකච්ඡාවලදී ද සිදු වූයේ මේ ප්‍රශ්නය ක්‍රමයෙන් ඔඩුදුවමින් උතුරු නැගෙනහිර දෙපළාතට සීමා නොවී මුළු රටේම පැතිරී යෑමයි. කලාපීය හා ජාත්‍යන්තර ලෙස ද පැතිරී ගිය ප්‍රශ්නයක් වීමයි. ඒ නිසාම පිටස්තර ඇඟිලි ගැසීම්වලින් ප්‍රශ්නය තවත් ව්‍යාකූල විය.

විශේෂයෙන් පසුගිය එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුව විසින් දුරදිග නොබලා කිසිදු ඉදිරි දැක්මකින් තොරව හදිසියේ ඇතිකරගත් සටන් විරාමය නිසා ප්‍රශ්න ගණනාවක් ඇතිවිය. උතුරේ ඉතිරිව තිබූ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන තවදුරටත් විනාශ විය. නැගෙනහිර දෙමළ, මුස්ලිම් හා සිංහල ජනයා අවමානයට හා අසහනයට පත්වූහ. ආරක්ෂක අංශ දුර්වල කෙරිණි. රටේ ජනතාවගේ කැමැත්ත නොවිමසා විදේශවලදී විවිධ සම්මුතිවලට එළැඹිණි. එකී සම්මුති ජනතාව මත පැටවීමට උත්සාහ කෙරුණු අතර දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය ඒ සම්මුතිවලින් ඉවත් විය.

දැන් ඇතැමුන් උත්සාහ කරන්නේ ඒ අසාර්ථක වූ පැරැණි මාර්ගයේම ඒ අසාර්ථක වූ තැනින්ම පටන්ගෙන ඉදිරියට යෑමටය. එහි අවසාන ප්‍රතිඵලය වනු ඇත්තේ තිරසාර සාමයක් ඇතිවීම නොව දැනට අවි අතට නොගෙන ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරමින් ඇති පිරිස් ද අවි අතට ගැනීම දක්වා තල්ලු කිරීමයි.

අතීතයේ මේ ප්‍රශ්නය විසඳීමට ගනු ලැබූ සියලු පියවරවල හොඳ නරක මැනවින් විමසා නැවුම් මඟක් ගැනීමට මම අදහස් කරමි. එම මාවත තැනීමේදී මා පදනම ලෙස සලකන්නේ **නොබෙදුණු රටක් බහුතර සම්මුතියක් සහ ගෞරවණීය සාමයක් යන්න ය.**

බලයට පත්වූ වහාම පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ සමඟ මම ඉහත ප්‍රතිපත්තීන් පදනම් කරගනිමින් සාකච්ඡා ආරම්භ කරමි.



පාර්ලිමේන්තුව නියෝජනය නොකරන දේශපාලන පක්ෂ සමඟ ද එවැනිම සාකච්ඡාවක් අරඹමි. මහ සඟරුවන, අන්‍යාගමික පූජක උතුමන්, සිවිල් සංවිධාන විශේෂයෙන් උතුරු හා නැගෙනහිර දෙපළාතේ දෙමළ, මුස්ලිම් හා සිංහල ජනතා සංවිධාන සමඟ ද මම සාකච්ඡා කරන්නෙමි.


තෙමසක් ඇතුළත මම එකී සාකච්ඡා නිම කරමි. එකඟතා ඇතිවුණු හා නොවුණු ප්‍රශ්න වෙන වෙනම හඳුනා ගෙන එකඟතා නැති ප්‍රශ්න සඳහා ජාතික සම්මුතියක් ඇතිකර ගැනීමට මම පියවර ගන්නෙමි. එම ජාතික සම්මුතියේදී ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වයත්, භෞමික අඛණ්ඩතාවයත්, ඒකීය රාජ්‍ය ව්‍යුහයත්, ජනතාවගේ ජාතික අනන්‍යතාවයනුත්, ඔවුන් අතර සාමකාමී සහජීවනයත් ආරක්ෂා විය යුතු බව මගේ පිළිගැනීමයි.

සාම්ප්‍රදායික නිජබිම්, ස්වයංනිර්ණය අයිතිය වැනි මූලධර්මයන්හි සිර නොවී, සියලු පුරවැසියන් සතු බලය උපරිම ලෙස ශක්තිමත් කෙරෙන සාමකාමී දේශපාලන විසඳුමක් ඇති කරගැනීම මාගේ ප්‍රමුඛ ඉලක්කයයි. මා බලය පිරිනමන්නට බලාපොරොත්තු වන්නේ පුරවැසියා වෙතටයි. බලය ලබාදිය යුතු වන්නේ පුරවැසියා අතටයි. ශක්තිමත් හා බලවත් පුරවැසියකු බිහිකිරීම මඟින්, ජාතික ගැටළුවට විසඳුම් සොයා ගත හැකි වනු ඇතැයි මම විශ්වාස කරමි.

එහිදී, ඉහත පිළිගැනීම්වලට අනුව ජනසම්මතවාදයේ මූලික ඉගැන්වීම වන බහුතර මතයට මම එකඟවෙමි. මගේ තනි මතය වෙනුවට මම බහුතර ජනතා මතය පිළිගන්නෙමි.

ජාතික සම්මුතියකට අප එළඹුණු වහාම එකී එකඟතාවය මම ජනමත විචාරණයකට යොමු කරමි.

ඉහත ක්‍රියාවලිය ක්‍රියාත්මක වන අතරතුර දැනට ප්‍රජාතන්ත්‍රවාදයට පිවිස නැති දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය සමඟ මම සෘජුව සාකච්ඡා ආරම්භ කරමි. මේ සඳහා එහි නායකයා මුණ ගැසීමටද මම අදහස් කරමි.



සියලු ප්‍රජාතන්ත්‍රවාදී සංවිධාන සමඟ එළැඹෙන ජාතික සම්මුතිය මම විවෘතව දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය වෙත ඉදිරිපත් කරමි.

මෙම ක්‍රියාවලියේ දී මුස්ලිම් ජනතාවගේ අයිතිවාසිකම් ආරක්‍ෂා කරමින් ඔවුන්ගේ නියෝජනය තහවුරු කරමි.

සැලසුමක් නැති, අනාගතයක් නැති, කාල රාමුවක් නැති සාකච්ඡා ගෞරවණීය සාමයක් උදාකර ගැනීමේ අරමුණ ඉදිරියේ ඵල රහිත බව එක්සත් ජාතික පෙරමුණේ සාකච්ඡා මලාව තුළින් (2002 - 2004) ඔප්පු කර ඇති නිසා මම වෙනස් මඟක් ගන්නට තිරණය කර ඇත්තෙමි. මම දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයට නිශ්චිත කාල සටහනක් හා නිශ්චිත න්‍යාය පත්‍රයක් ලබා දෙමි. එහිදී,

**බෙදුම්වාදය අත්හැරීම**
**අවිහරණය**
**ප්‍රජාතන්ත්‍රවාදයට පිවිසීම**
**අවසන් විසඳුම**
**එය ක්‍රියාත්මක කිරීම**

යන සියල්ල පිළිබඳව විවෘත න්‍යාය පත්‍රයකට ඔවුන් සමඟ එකඟතාවය ලබා ගැනීමට ක්‍රියා කරනු ඇත.

විදේශ රටවල් අපේ ප්‍රශ්නයට අනවශ්‍ය ලෙස මැදිහත් කරගැනීමට සිදුව ඇත්තේ 1977 දී බලයට පත් එ.ජා.ප. ආණ්ඩුවේ අදුරදර්ශී විදේශ ප්‍රතිපත්තිය නිසා බව මගේ විශ්වාසයි. ඒ නිසා සිදු වූ ලේ වැගිරීම්වල නිමක් නැත. ඒ අතීතයයි. වර්තමානයේ ද අනවශ්‍ය මට්ටමින් විදේශ බලපෑම් ශ්‍රී ලංකාව මත පටවන්නට එක්සත් ජාතික පෙරමුණ ක්‍රියා කළේය. මම මේ අසමතුලිත විදේශ බලපෑම සමතුලිත කිරීමට ක්‍රියා කරමි.

අපේ අසල්වැසි ඉන්දියාව සමඟ පුමුබතා පදනම මත මම මේ පිළිබඳව සාකච්ඡා ආරම්භ කරමි. ඔවුන් සමඟ ද කලාපීය ආරක්‍ෂාව හා සාමය පිළිබඳව සම්මුතියකට එළඹෙමි.



අපේ රටට බෙහෙවින් ඇප උපකාර කර ඇති චීනය, රුසියාව හා පකිස්ථානය වැනි රටවල් සමඟ ද ආසියානු සහයෝගීතාවයක් මම ගොඩ නගමි.

දැනට සාම සම සභාපතිවරුන් වන එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය හා නෝර්වේ සමඟ ද මම මේ අළුත් ප්‍රවේශය පිළිබඳව විවෘත සාකච්ඡාවකට එළඹෙමි.

මේ සියලු සාකච්ඡා හා එකඟතා සාර්ථක වුවහොත් මම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසීමට ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් පත් කරමි. එයට විපක්ෂයේ නියෝජනය ද ලබා ගනිමි. එකී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ද ජනමත විචාරණයකට යොමු කරමි. බහුතර කැමැත්තෙන් එය අනුමත වුවහොත් මම එය එකහෙළාම ක්‍රියාත්මක කරමි.

මෙකී සාකච්ඡා කෙරීගෙන යන අතර උතුරු හා නැගෙනහිර දෙපළාතට මාගේ පොදු සංවර්ධන සැලැස්මට අමතරව සුවිශේෂී වැඩපිළිවෙලක් යොදමි.

කිසිදු ත්‍රස්ත ක්‍රියාවකට ඉඩ නොලැබෙන පරිදි සටන් විරාම ගිවිසුම යළි සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. සටන් විරාම නිරීක්ෂණ ක්‍රියාදාමය පිළිබඳව යළි විමර්ශනය කොට පිළියම් යොදනු ඇත. එහිදී කලාපීය සහයෝගිත්වය ලබා ගැනීමටද කටයුතු කරමි.

ගැටුම්වලින් අවතැන්වූවන් කිසිදු භේදයකින් තොරව තම ගම්බිම් වල පදිංචි කරවීම සඳහා **"ජාතික සවිය"** නමින් වෙනම අධිකාරියක් පිහිටුවමි. නැවත පදිංචි වන එක් පවුලක් සඳහා ආරම්භයේදී රුපියල් 150,000 ක් ද ස්ථිර වාසස්ථාන සඳහා රුපියල් 250,000ක් ද ලබා දෙමි. ඒ සඳහා මම ස්වේච්ඡා සංවිධාන හා විදේශීය ප්‍රදානයන් යොදා ගනිමි.

සුනාමි විපතට ලක්වූ ප්‍රදේශ ගොඩනැංවීම සඳහා පුළුල් හා කඩිනමින් ජාතික වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට මම අදහස් කරමි. එහිදී උතුරු හා නැගෙනහිර දෙපළාත නැවත ගොඩනැංවීමට ප්‍රමුඛ අවධානයක් යොමු කෙරේ. ඒ සඳහා



යෝජනා වී තිබෙන පශ්චාත් සුනාමි කළමනාකරණ මෙහෙයුම් මණ්ඩලය වැනි ආයතන ක්‍රියාත්මක නොකරන අතර, උතුරු හා නැගෙනහිර පළාත් ගොඩනැඟීම් කටයුතු සඳහා ප්‍රදේශයේ ජනතා නියෝජිතයන්ගේ හා ජනතා සංවිධානවල සෘජු අදහස් සහ යෝජනා ක්‍රියාවට නැංවීමට **"ජය ලංකා"** වැඩපිළිවෙල සිංහල, දෙමළ, මුස්ලිම් සියල්ලන්ගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක කරමි.

## රට රැකීම

### ජාතික ආරක්ෂාව හා ආරක්ෂක සේවා


රටේ ස්වෛරීත්වය හා භෞමික අඛණ්ඩතාව සුරක්ෂිත කිරීමට හැකිවන පරිදි නව ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියක් මම හඳුන්වා දෙන්නෙමි.

හමුදා සෙබළුන්ගේ චිත්ත ධෛර්‍යය නැංවෙන පරිදි මනා පුහුණුවකින්, අභිමානයකින් සහ ශික්ෂණයකින් යුත් ජාතික ආරක්ෂක හමුදාවක් ගොඩනැඟීම සඳහා අවශ්‍ය න්‍යායික සහ ප්‍රායෝගික පාඨමාලා ඇතුළත් නව ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලයක් පිහිටුවමි.

රාජ්‍ය සේවයේ අනෙකුත් වෘත්තීන් මෙන් නොව ආරක්ෂක හමුදාවන් හි සෙබළ සහ නිළ නොලත් ශ්‍රේණිවල අනිවාර්ය විශ්‍රාම ගැන්වෙන සේවා කාලය වසර 22 කි. එහෙයින් එම කාලය සම්පූර්ණ කොට විශ්‍රාම යන විට **පූර්ණ විශ්‍රාම වැටුපට හිමිකම් ලබා දෙමි.**

ආරක්ෂක හමුදා සෙබළුන් සහ නිලධාරීන් සඳහා නිවාස සැපයීම වෙනුවෙන් **රණවිරු ගම්මාන සංකල්පය යටතේ නිවාස 50,000 ක්** කඩිනමින් ඉදිකරනු ඇත.

ත්‍රිවිධ හමුදා සේවකයන්ගේ ගෙවල් කුලී කපා ගැනීම්, විශ්‍රාම පාරිතෝෂික ඇතුළු වෘත්තීයමය සහ සුබ සාධනමය ගැටලු නිරාකරණය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට පූර්ණ බලැති කමිටුවක් පත් කරනු ලැබේ.



ත්‍රිවිධ හමුදා වල සේවකයන් සඳහා **වාහනයක් හෝ මෝටර් සයිකලයක් මිලදී ගැනීමට දීර්ඝ කාලීන ණය** මුදලක් ලබා දෙමි.

ඉන්දියාව, පකිස්තානය, චීනය, රුසියාව, එක්සත් රාජධානිය හා එක්සත් ජනපදය වැනි රටවල් සමඟ ත්‍රස්තවාදයට එරෙහි තොරතුරු, දැනුම, පුහුණුව හුවමාරු කිරීමේ ඒකාබද්ධ ක්‍රියා මාර්ගයකට එළඹෙමි.

## මහජන ආරක්ෂාව, අධිකරණය හා නීතිය

සෑම පුරවැසියකුගේම මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීම වැළැක්වෙන ආකාරයට කටයුතු කිරීමටත් මූලික අයිතීන් කඩ වූ විටදී කඩිනමින් සහ අඩු වියදමින් සහන ලබා දීමටත් අධිකරණ ක්‍රියාවලියක් හඳුන්වා දෙමි.

නීතිය ඉදිරියේ සෑම පුරවැසියකුම එක සමාන ලෙස සැලකීම සහතික කිරීම සඳහා අඩු ආදායම් ලබන පුරවැසියන්ට නොමිලේ නීතිඥ සහය ලබාදීමට අවශ්‍ය යාන්ත්‍රණයක් සකසමි.

නඩු කටයුතු දීර්ඝ ලෙස කල්ගතවීම නිසා යුක්තිය ඉටුවීම පමා වීම වැළැක්වීමට සිවිල් සහ අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කොට නව නීති ප්‍රතිපාදනයන් හඳුන්වා දෙමි.

අභියාචනාධිකරණයේ කටයුතු විමධ්‍යගත කරමි.

බන්ධනාගර පරිපාලනය පුළුල් ප්‍රතිසංස්කරණයට ලක් කොට බන්ධනාගාර නිලධාරීන්ගේ වෘත්තිය හා අනෙකුත් ගැටලු විසඳීමට කටයුතු කරමි. එලෙසින්ම, සිරගත වූ අය නිදහස් වන විට සමාජයට අනුගත කිරීමට නව වැඩපිළිවෙලක් හඳුන්වා දෙමි.



පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කටයුතු සියල්ල විධිමත් ලෙස පරිගණකගත කොට සියලු පුරවැසියන්

හට හැඳුනුම්පත් ලබාදීමේ වැඩසටහනක් අරඹන්නෙමි. මෙහි ඇති ජීවදත්ත තොරතුරු රජයේ අනෙක් දෙපාර්තමේන්තුවලටද අවශ්‍ය පරිදි ලබාගැනීමට ඉඩ සලසා දෙමි. මේ කටයුතු කාර්යක්ෂම කිරීමෙන් වතුකරයේ පුරවැසියන්ට ද උතුරු නැගෙනහිර පළාත් වල ජනතාවට ද මුහුණපෑමට සිදුවී ඇති දුෂ්කරතා මඟහැරී යනු ඇත.

## පොලිස් සේවය

අපරාධ නිවාරණය සහ විමර්ශනය, නීතිය සහ සාමය ආරක්ෂා කිරීම, පුද්ගලයා සහ දේපොළ ආරක්ෂා කිරීම මුල් කරගෙන පොලිස් දෙපාර්තමේන්තුව නවීකරණයට ලක් කරන අතර පොලිස් සේවය මහජනයාට මිත්‍රශීලී සහ අපක්ෂපාතී සේවයක් බවට පත් කරමි.

සෑම පොලිස් නිලධාරියකුටම අවශ්‍ය පුහුණුව හා නවීන තාක්ෂණික ඥානය ලබා දෙනු ඇත. විමර්ශන කටයුතු නිසි ආකාරව සිදු කිරීමට නීතිඥ, විගණන, ගණකාධිකාරි, පරිගණක හා අනෙකුත් තාක්ෂණික නිලධාරීන්ගේ සහය සෘජුවම ලබා දීමට කටයුතු කරමි.

පොලිස් කොමිසමේ ඇති අඩුපාඩු මග හරවා බඳවා ගැනීම්, උසස්වීම් හා ස්ථාන මාරුවීම් සාධාරණව හා කඩිනමින් ඉටු කිරීම සඳහා විධිවිධාන සලසන්නෙමි.

වසර 140 කට වඩා පැරැණි පොලිස් ආඥා පනත පොලිස් සේවයේ අභිවෘද්ධිය සැලසෙන පරිදි සංශෝධනය කරන්නෙමි.

පොලිස් නිලධාරීන්ට වාහන සහ මෝටර් බයිසිකල් මිලදී ගැනීමට දීර්ඝ කාලීන ණය මුදලක් ලබා දෙන්නෙමි.

පොලිස් උපසේවා නිලධාරින් ස්ථිර පොලිස් සේවයට අනුයුක්ත කිරීමට කටයුතු කරමි.

ග්‍රාමාරක්ෂක නිලධාරීන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා සොයා බැලීම පිණිස කමිටුවක් පත් කරමි.



## පිරිපුන් සමාජයක් - තිරසාර සංවර්ධනයක්

### නව ජාතික ආර්ථික පිළිවෙතක්

දේශීය නිෂ්පාදකයා දිරිමත් වන පරිදිත් විදේශීය ආයෝජනයන්ගේ සහභාගිත්වය ඵලදායී ලෙස ලබාගත හැකි වන පරිදිත් නිදහස් ආර්ථිකයේ සාධනීය ලක්ෂණ දේශීයත්වය සමඟ ගලපමින් **නවීකරණයවූත් සමබරවූත් ජාතික ආර්ථික පිළිවෙතක් අනුගමනය කරන්නෙමි.**

එවන් පිළිවෙතක් තුළින් **වසරකට 8 % ක ආර්ථික වර්ධනයක්** ඉදිරි හය වසර තුළ අත්කර ගැනීමට අපේක්ෂා කරමි. **එම වර්ධනයේ ප්‍රතිලාභ දේශයේ පොදු ජනතාව වෙතට,** විශේෂයෙන්ම අප සමාජයේ හරි අඩක් පමණ වන අඩු ආදායම්ලාභීන් වෙතට, ගලායාම තහවුරු කිරීමට පියවර ගන්නෙමි.

දේශීය ව්‍යවසායකයන්ට විදේශීය වෙළඳපොළ ජයග්‍රහණය කිරීමට හැකි වන පරිදි සිය ව්‍යාපාර සංවර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය, තාක්ෂණය සහ දැනුම ලබා දීම සඳහා වැඩපිළිවෙලක් සකස් කරන්නෙමි.

**ජාතික සම්පත් හෝ උපාය මාර්ගික ලෙස වැදගත් මූල්‍ය, බලශක්ති හා ප්‍රවාහන ක්ෂේත්‍රයන්හි රාජ්‍ය අයිතිය එලෙසම පවත්වා ගන්නා අතර එවන් කිසිදු සම්පතක් හෝ රාජ්‍ය ආයතනයක් පෞද්ගලිකරණය නොකෙරෙනු ඇත.**

පොදු සම්පත්වල සැබෑ අයිතිකරුවන් වන මහජනතාවගේ හිමිකම් ප්‍රවර්ධනය වනසේ ආයතන හා සම්පත් කළමනාකරණය කිරීමේ රජයේ භාරකාරත්ව වගකීම තහවුරු කෙරෙන පරිදි **පොදු වගකීම් පනතක්** ඉදිරිපත් කරනු ඇත. ඒ තුළින් පොදු දේපළ අයිතිය, නිර්දේශපාලනීකරණය සහ වෘත්තීයමය හා ස්වාධීන කළමනාකරණය තහවුරු කොට රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට පියවර ගන්නෙමි.



- **සාර්ව ආර්ථික මෙහෙයුම**

රාජ්‍ය වියදම් සහ අයවැය පරතරය අඩු කිරීම පමණක්ම දක්ෂ මූල්‍ය කළමනාකරණයේ ලක්ෂණයක් ලෙස සැළකිය නොහැකිය. එහි වැදගත්ම ලක්ෂණයන් වන්නේ රාජ්‍ය වියදම් අත්‍යවශ්‍ය ආර්ථික ප්‍රමුඛතා ක්ෂේත්‍රයන් වෙත යොමු කිරීම සහ එම වියදම්වලින් උපරිම ප්‍රතිඵල ජාතික ආර්ථිකයට ලබා දීමයි. මම එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරමි.

කාර්යක්ෂම වියදම් කළමනාකරණය තුළින් අයවැය හිඟය දරාගත හැකි මට්ටමක් දක්වා අඩු කරනු ලැබේ. රාජ්‍ය වියදම් නිරන්තරයෙන් විමර්ශනයට ලක් කෙරෙනු ඇත.

අමාත්‍යාංශ සඳහා මෙතෙක් අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කරන ලද්දේ වැය ශීර්ෂ අනුව ගෙවීම් සඳහා පමණි. නමුත් ඉදිරි වසරේ සිට නිමැවුම් කාර්ය සාධන ඉලක්කද පදනම් කර ගනිමින් ප්‍රතිපාදන ලබාදීමට පියවර ගන්නෙමි.

අමාත්‍යාංශවලට අයවැය ප්‍රතිපාදන ලබාදීමේදී පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවලට නිශ්චිත ප්‍රතිශතයක් වෙන් කෙරෙනු ඇත.

බදු ක්‍රම වඩා සරල කිරීමට සහ කාර්යක්ෂම කිරීමට පියවර ගන්නෙමි.

- **බැංකු මූල්‍ය හා රක්ෂණ සේවා**

ජාතික ව්‍යවසාය බැංකුව යටතේ “ලංකා පුත්‍ර” නමින් නව බැංකු සේවයක් හඳුන්වා දෙනු ලැබේ. ඒ යටතේ දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට තම ව්‍යාපාර ජාත්‍යන්තර මට්ටම දක්වා වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයෙනු ඇත.

මීට අමතරව **ගොවි ජනතාවගේ යහපත සඳහා කෘෂි බැංකුවක්** ආරම්භ කරන්නෙමි.

අඩු ආදායම්ලාභීන් සඳහා පහසුවෙන් නිවාස ණය සැපයීමේ වැඩපිළිවෙලක් පවත්නා බැංකු ව්‍යුහය තුළින් සකස් කරන්නෙමි.



සණස සහ සමෘද්ධි බැංකු ක්‍රම වඩාත් ශක්තිමත් කරන්නෙමි. එමඟින් ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීමට අදාළ මූල්‍යමය සහාය ලබා දෙන්නෙමි.

අඵත් ණය ආරක්‍ෂක රක්‍ෂණ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.

දේශීය ව්‍යවසායකයන්ට කොළඹ කොටස් වෙළඳපොළෙහි තම සමාගම් ලැයිස්තුගත කිරීමට දිරි ගැන්වීම් සහ උපදෙස් ලබා දෙන අතර ඉදිරි වසර හය තුළ දී නව ලැයිස්තුගත කිරීම් සංඛ්‍යාව 40% කින් ඉහළ නැංවීමට කටයුතු කරමි.

- **වෙළඳ හා වාණිජ කටයුතු**

ජාතික ආර්ථිකයේ ප්‍රබල සාධකයක් ලෙස සැලකෙන තොග හා සිල්ලර වෙළෙඳුන් මුහුණපානු ලබන මූල්‍යමය හා අනෙකුත් ගැටළු විසඳීම සඳහා කඩිනම් පියවර ගන්නෙමි. දෛනික ණය, බැඳුම් ණය ආදී සහන ණය ක්‍රම පදික වෙළෙන්දාගේ සිට ඉහළම තොග වෙළෙන්දා දක්වා රජයේ මැදිහත් වීමෙන් ලබා දීමට කටයුතු කරන්නෙමි.

ශ්‍රී ලංකාවේ සමුපකාර ක්‍රමය නැවත සවිමත් කොට පාරිභෝගිකයාට යුක්ති සහගත වූද, සාධාරණ වූද මිලකට භාණ්ඩ සැපයීම මාගේ අභිප්‍රායයි. ඒ සඳහා ශ්‍රී ලංකාවේ සමුපකාරය පිළිබඳව පවතින ප්‍රතිපත්තිය යළි සකස් කරමි.

එසේම සියලුම සමුපකාර සමිති දේශපාලන වහල් භාවයෙන් මුදා ජනතා පාලනයකට නතු කරන අතර, අපගේ "ගම නැඟුම" වැඩසටහන යටතේ නවීකරණය වූ සමුපකාර අලෙවි හලක් සෑම ගමකටම ලබාදෙමි.

නව ලංකා ස.තො.ස., වී අලෙවි මණ්ඩලය, පළතුරු හා එළවලු අලෙවි ආයතනය වැනි රාජ්‍ය ආයතන පිහිටුවීමටද, ඒවා ශක්තිමත් කොට පොදු ජනතාවට වඩා ලාභදායී හා කාර්යක්‍ෂම සේවාවක් ලබා දීමටද කටයුතු කරමි.

## කෙතට අරුණ

### කෘෂිකර්ම ප්‍රතිපත්තිය

ජල හිඟයෙන්, ඉඩම් හිඟයෙන්, වගා පාළුවෙන් අස්වනු විකුණාගත නොහැකි කමෙන් සහ නව ක්‍රමෝපායයන් නොමැති කමෙන් අපේ ගොවියා විඳින දුක් ගැහැට අපමණ ය. ඔවුන්ගේ සිතුම් පැතුම් හා අපේක්ෂාවන් මම හොඳින් හඳුනමි. කොළඹ සුපිරි මන්දිරවල සිට ගොවියා "මොඩ්" කරන්නට සැරසෙන, එහෙත් ගොවියා සැබෑවටම නැතිබැරිකමේ වියගසට ගැට ගැසූ, පටු මතධාරී දේශපාලකයන්ගේ ඡන්ද පොරොන්දුවලට වඩා වෙනස් පිවිසුමක් ගොවි ගැටළු විසඳීම සඳහා අවශ්‍ය වන්නේය.

- **කෙතට දියවර**

  ජල සම්පත අප රටේ ප්‍රධානතම සම්පත් වලින් එකකි. එම අගනා සම්පතේ අයිතිය ස්වදේශික පොදු ජනයා සතු විය යුතුය. මම ඒ බව තහවුරු කරමි.

  ජාතික වාරිමාර්ග සැලසුමක් ඔබට ඉදිරිපත් කිරීමට මම අදහස් කරමි. එමඟින් ප්‍රධාන ගංගාවන්, ප්‍රාදේශීය වැව්, අමුණු හා ගම්මානයන් හි ජල ධාරාවන් සම්බන්ධ කෙරෙන අතර, දකුණේ මෙන්ම උතුරේ ද, බටහිර මෙන්ම නැගෙනහිර ද වියළි බිම් හරිත ගැන්වීම ඒ හරහා සිදු කෙරෙනු ඇත.

  "වැව් දස දහසේ" ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම මෙන්ම **මොරගහකන්ද, උමා ඔය, උතුරු මැද මහ ඇළ, දැදුරු ඔය, මැණික් ගඟ, රඹුකන් ඔය, යාන් ඔය, හැඩ ඔය, කිරම ඔය සහ ඌරාව වැනි බහු කාර්ය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම** මාගේ අපේක්ෂාවයි.

- **වගාවට ඉඩම්**

  අප කුඩා දිවයිනේ ප්‍රධාන ගැටළු අතර ඉඩම් පිළිබඳ ප්‍රශ්නයට හිමි වන්නේ ප්‍රමුඛස්ථානයකි. එසේම, වගා කළ හැකි බිම් පුරන් වීම ද සාම්ප්‍රදායික ආකල්ප සහ දුෂ්කර කොන්දේසි හේතුවෙන් ශ්‍රී ලාංකිකයා ගොවිතැනින් ඈත්



වීමද අප හමුවේ මතුව ඇති බරපතල අභියෝගයක්ය. එය ජය ගැනීමට මම ස්ථිරවම අදිටන් කරගෙන සිටින්නෙමි. ඒ සඳහා ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් සකසන්නෙමි.

ඒ යටතේ වගාවට ඉඩම් නොමැතිව ලතවෙන ගොවි පවුල්වලට ඉඩම් කට්ටි ලක්ෂයක් ලබාදීමට මම කටයුතු කරමි.

ගොවි ජනපද හා මහවැලි යෝජනා ක්‍රමවල පසු පරම්පරාවේ සියලුම ගොවීන්ට ඉඩම් ලබා දෙන්නෙමි.

ගොවියාට රජයෙන් ලබා දී ඇති ගොවි බිම් වල සින්නක්කර අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය නීති සම්පාදනය කරනු ඇත.

## වී හා ආහාර භෝග නිෂ්පාදනය

වක්කඩින් අත සෝදා පැමිණි නාම යෝජනා පත්‍රය අත්සන් කළ ඩී.ඒ. රාජපක්ෂගේ පුත්‍රයකු වශයෙන් වෙල, කමත, ඉපනැල්ල, වක්කඩ මට ආගන්තුක ස්ථාන නොවේ. නිවසක්, අත් ට්‍රැක්ටරයක් හා තමන්ගේම වූ වී බිස්සක් සහිත ස්වශක්ති ගොවි පවුලක් පිළිබඳ මිහිරි සිහිනය සැබෑ කර ගැනීමට මම වසර 40 ක් පෙරුම් පිරුවෙමි. එම සිහිනය සැබෑ කරවීමට අවස්ථාව උදාවනු ඇතැයි මම සිතමි.

- **බීජ නිෂ්පාදනය**

ආහාර බෝග නිෂ්පාදන පිරිවැයෙන් බීජ වලට වැයවන සැළකිය යුතු කොටස අවම කිරීමේ හා දේශීය බීජ නිෂ්පාදනය ශක්තිමත් කිරීමේ අරමුණින් තරගකාරී ලෙස මුහුම් බීජ රට තුළ නිෂ්පාදනය කිරීමේ විධිමත් වැඩ පිළිවෙලක් සකස් කරන්නෙමි.

මේ සඳහා බීජ පර්යේෂණ ගොවිපොළ මෙන්ම රජයේ බීජ නිෂ්පාදන ගොවිපොළ ද සංවර්ධනය කිරීමට පියවර ගන්නෙමි.



## ◆ පොහොර

කෘෂිකර්මාන්තයේ හා වැවිලි කර්මාන්තයේ නිෂ්පාදනය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් සියලු රසායනික පොහොර වර්ග කිලෝ 50 ක බෑගයක් රුපියල් 350 ක මිලකට ලබා දෙන්නෙමි.

මීට අමතරව රසායනික භාවිතයෙන් තොරව ගොවිතැන් කිරීම දිරි ගැන්වීම සඳහා රජය විසින් විශේෂ වැඩසටහනක් ආරම්භ කරන අතර ඒ සඳහා උනන්දු වන ගොවීන්ට මූල්‍යමය ආධාර ලබා දෙමි.

දීර්ඝ කාලීනව ගොවියාට අඩු මිලට පොහොර සැපයීමේ වැඩ පිළිවෙල යටතේ නව පොහොර කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීමට කටයුතු කරමි.

සමුපකාර හරහා ගොවීන්ට අත්‍යවශ්‍ය කෘමි නාශක හා වල් නාශක පහසුවෙන් හා අඩු මිලට ලබා දීමේ වැඩ පිළිවෙලක් සකසන්නෙමි.

## ◆ කෘෂි තාක්ෂණ හා මූල්‍ය සම්පත්

කෘෂි උපකරණ සහ ට්‍රැක්ටර් සහන කුලියට ලබා දීමට ගොවි සමිති වලට අවශ්‍ය ප්‍රාග්ධන ශක්තිය ලබා දෙමි.

අත් ට්‍රැක්ටර් සහ වෙනත් ගොවි උපකරණ වලට ඇති බදු සියල්ල ඉවත් කරනු ලැබේ.

ලබන මහ කන්නය සඳහා සෑම ගොවියෙකුටම තමන් කැමති වර්ගයේ උදැල්ලක් නොමිලේ ලබා දෙන්නෙමි.

වගා රක්ෂණ ක්‍රම සහ ගොවි විශ්‍රාම වැටුප් ක්‍රම විධිමත් කර ඒවායේ ප්‍රතිලාභ කඩිනමින් ගොවි ජනතාවට ලබා දීමට කටයුතු කරමි.

ගෙවා ගන්නට බැරිව ළතැවෙන ගොවි ණය කපා හැර හරින්නෙමි.



- **කෘෂි උපදේශනය**

කෘෂි විද්‍යාල යළි පණ ගන්වා විශ්ව විද්‍යාල මට්ටමේ කෘෂි අධ්‍යාපන පීඨ ශක්තිමත් කරන්නෙමි.

දේශීය සහ විදේශීය පුහුණුව සහ දැනුම සහිත කෘෂි විශේෂඥයින්ගේ සහාය සෘජුවම ගොවීන් වෙත ලබාදීම සඳහා ක්‍රියා කරන අතරම ගොවීන් තාක්ෂණයෙන් දැනුවත් කිරීම සඳහා අවශ්‍ය පුහුණුව හා විදේශ ශිෂ්‍යත්ව ලබා දීමටද කටයුතු කරමි.

විශ්ව විද්‍යාල සම්බන්ධ කරගනිමින් ජාන තාක්ෂණ ව්‍යාපෘති රටපුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි.

- **මිලට ගැනීම සහ ගබඩා කිරීම**

වී මිලදී ගැනීම සහ සහල් වෙළඳපොළට මැදිහත් වීම සඳහා වී අලෙවි මණ්ඩලය නැවත පිහිටුවන්නෙමි.

මීළඟ මහ කන්නයේ පටන් වී කිලෝවක සහතික මිල නාඩු වී සඳහා රුපියල් 16.50 දක්වා සහ රතු වී හා සම්බා වී සඳහා රුපියල් 17.50 දක්වා වැඩි කෙරේ.

“පුරන් කුඹුරු අස්වැද්දීමේ” වැඩසටහන යටතේ තෙත් කලාපයේ වී ගොවිතැන වැඩි දියුණු කිරීමට විශේෂ වැඩපිළිවෙලක් අරඹන්නෙමි. මෙම වැඩපිළිවෙල ඉවහල් කර ගනිමින් ජාතික සහල් සුරක්ෂිතතාව තහවුරු කිරීමට පියවර ගනිමි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා වෙළඳ අමාත්‍යාංශය ඒකාබද්ධව සහල් මෙට්‍රික් ටොන් ලක්ෂයක ආරක්ෂක තොගයක් වී හා සහල් වශයෙන් නඩත්තු කිරීමට ද පියවර ගන්නෙමි.

දැනට බිඳ වැටී ඇති කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් යළි පණ ගැන්වීම සඳහා රුපියල් ලක්ෂ 100ක් දක්වා අඩු පොළියට ණය පහසුකම් ලබා දෙන්නෙමි.



තවද, දේශීය සහල් වෙළඳපොළ ප්‍රාදේශීයකරණය කිරීම සඳහා **"සහල් සැකසුම් ගම්මාන"** ව්‍යාපෘතිය ක්‍රියාවට නංවමි.

පාසල් දරුවන්ගේ දිවා ආහාරයට අපේම ගොවීන්ගේ සහල්, ධාන්‍ය සහ එළවළු යොදා ගැනීමට කටයුතු කරන්නෙමි.

සහල් වලින් නිෂ්පාදනය කරන වෙනත් ආහාර සඳහා ද පාරිභෝගික ජනතාව වඩ වඩාත් යොමුකර වන්නෙමි. එමඟින් වී ගොවියාට සාධාරණ මිලක් ලැබෙනු ඇති අතර සෞඛ්‍ය සම්පන්න අනාගත පරපුරක් ද, ජාතික ආර්ථිකයේ ඉහළ පිබිදීමක් ද ඇති කර ගත හැකිවනු ඇතැයි මම විශ්වාස කරමි.

- **අනෙකුත් භෝග**

අර්තාපල්, ළූණු සහ මිරිස් වැනි භෝග අස්වනු නෙළන සමයන්හී දී ඒවා පිටරටින් ආනයනය කිරීම නතර කරමි.

ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුව කෙසෙල් ප්‍රභේද වර්ග හඳුන්වා දීම සහ අපනයනය සඳහා විදේශ වෙළඳ පොළ විවෘත කරමි.

පළතුරු හා එළවළු වල පසු අස්වනු නාස්තිය අවම කිරීම සඳහා ඒවා කල්තබා ගැනීමේ නව තාක්ෂණවේදයන් ද, වැඩි වටිනාකමින් යුතු "ඇසුරුම් ආහාර" බවට පත් කිරීමේ ව්‍යාපෘතීන් ද ආරම්භ කරමි.

"ප්‍රාදේශීය බෙදා හැරීමේ මධ්‍යස්ථාන" ආරම්භ කොට ඒවායේ එළවළු හා පළතුරු කල්තබා ගැනීම සඳහා සියලු පහසුකම් සහිත ශීතාගාර ගබඩා පිහිටුවනු ඇත.

අපේ එළවළු, පළතුරු සහ කුළු බඩු ගුවන් හා නාවික සේවා වලටත්, මැදපෙරදිගට හා යුරෝපයටත් අපනයනය පහසු කිරීම සඳහා පියවර ගන්නෙමි.



“බුලත් අරුණැල්ල” වැඩසටහන යටතේ බුලත් නිෂ්පාදනය දියුණු කොට පකිස්තානු, ඉන්දියානු බුලත් වෙළඳපොළ කෝටාවෙන් ප්‍රයෝජන ගැනීමට ලාංකික බුලත් ගොවියාට අවස්ථාව ලබා දීමට කටයුතු කරමි.

පාරම්පරිකව **හේන් ගොවිතැනින් ජීවත් වන ගොවි ජනතාවට බාධාවකින් තොරව තම වගාව කරගෙන යාමට සඳහා ඉඩම්** ලබා දීමට කටයුතු කරමි.

ගොවියාට වඩාත් යහපත් වන අයුරින් **ගොවි ජන සංවර්ධන පනත සංශෝධනය කිරීමට** පියවර ගන්නෙමි.

## වැවිල්ලට නවෝදයක්

තේ, පොල්, රබර් යන වගාවන් අපේ ජාතික ආර්ථිකයේ හදවත විය. එහෙයින් එකී වගාවන්ගේ මතු සංවර්ධනය උදෙසා පියවර ගන්නෙමි.

කළුතර, රත්නපුර, ගාල්ල හා කෑගල්ල ආදී ප්‍රදේශවල පහත රට තේ වගාව වැඩි දියුණු කිරීම සඳහා රජය සතු L.R.C. සහ ජනවසමට අයත් **ඉඩම්වලින් අක්කරය බැගින්** ඒ පිළිබඳව උනන්දුව ඇති අයට ලබා දීමට පියවර ගන්නෙමි.

කුඩා තේ වතුවලින් ඉපැයෙන “සෙස් බදු” මුදල්වල ප්‍රතිලාභ නැවත එම වතුවලටම ලබාදීමට කටයුතු කරන්නෙමි. ඊට අමතරව **නැවත වගාව සඳහාත් අළුතින් වගා කිරීම සඳහාත් ලබා දෙන සහනාධාර 25% කින් වැඩි කිරීමට කටයුතු කරමි.**

කළු තේ අපනයනය කිරීම වෙනුවට අගය වැඩි කරන ලද තේ වැඩි වැඩියෙන් නිපැයීම සඳහා **පුද්ගලික අංශයට අවශ්‍ය ප්‍රාග්ධන පහසුකම්** හා දැනුම ලබා දෙන්නෙමි.

කාබනික තේ හා සුවිශේෂිත තේ වර්ග නිපැයීම සඳහා වැවිලි කරුවන්ට දිරි දීමනා ලබා දෙන්නෙමි.



වැසී ගිය සහ වැසී යාමේ තර්ජනයට මුහුණ පා තිබෙන තේ කර්මාන්ත ශාලා නවීකරණය කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සහ බදු සහන සපයන්නෙමි.

ප්‍රධාන පොල් ත්‍රිකෝණයට අමතරව දකුණු, නැගෙනහිර සහ වෙරළබඩ ප්‍රදේශ ආශ්‍රිතව පොල් වගාව සංවර්ධනය කිරීමට කටයුතු කරමි.

ප්‍රධාන පොල් ඉඩම් සුරක්ෂිත කිරීමටත් පොල් වගාවේ ඵලදාව වැඩි කිරීමටත් නව පොල් ප්‍රභේද හා වගා ක්‍රම හඳුන්වා දීමටත් කටයුතු කරමි.

බින්දු ජල තාක්ෂණය පදනම් කරගෙන පොල් වගා කිරීම සඳහා අවශ්‍ය මූලාධාර සපයන්නෙමි.

කපාපු පොල් සඳහා නව වෙළඳපොළ වර්ධනය කර දීමේ වැඩ පිළිවෙලක් ද හඳුන්වා දෙමි.


පොල්තෙල් නිෂ්පාදනය දියුණු කිරීමට පියවර ගනිමි.

පොල් නැවත වගා කිරීම සඳහා දෙනු ලබන සහනාධාර මුදල වියදමට සරිලන ලෙස වාර්ෂිකව වැඩි කරනු ලැබේ.

තෙත් කලාපයට පමණක් සීමා නොකොට දැනටමත් ආරම්භ කර ඇති පරිදි මොණරාගල, වැල්ලවාය වැනි ප්‍රදේශවලද රබර් වගාව ව්‍යාප්ත කිරීමට කටයුතු කරමි. රබර් ආශ්‍රිත කර්මාන්ත සඳහා මූල්‍ය හා තාක්ෂණික ආධාර නොඅඩුව ලබා දෙන අතර ජාත්‍යන්තර වෙළඳ පොළ සොයා ගැනීමට උපකාර කරමි.

රබර් නැවත වගා කිරීමේ සහනාධාරය හෙක්ටාරයකට රුපියල් 106,000 දක්වා වැඩි කෙරේ.

ජාත්‍යන්තර කුරුඳු අවශ්‍යතාවයෙන් 70% ක් නිෂ්පාදනය කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ කුරුඳු ගොවීන් විසිනි. එහෙත් එකී ඉහළ නිෂ්පාදන කොටසට සාපේක්ෂව කුරුඳු සඳහා ජාතික ආර්ථික නිෂ්පාදනයේ ඉහළ අගයක් වාර්තා නොවීම කණගාටුදායකය. එබැවින් නව තාක්ෂණය කුරුඳු කර්මාන්තයට හඳුන්වා දීමටද විදේශ



වෙළඳාම සඳහා දැනට ඇති දුෂ්කරතා ඉවත් කිරීමටද මම කටයුතු කරන්නෙමි.

කුළු බඩු හා වෙනත් සුළු අපනයන භෝග ප්‍රාථමික නිෂ්පාදන ලෙස අපනයනය කිරීම වෙනුවට ඒවා **අගය වැඩි කළ භාණ්ඩ ලෙස අපනයනය කිරීම** සඳහා පුද්ගලික අංශයට දිරි ලබා දෙන්නෙමි.

**සීනි සඳහා උක් වගාව තවදුරටත් කුඩා වැවිලිකරුවන් අතර ප්‍රචලිත කරන්නෙමි.** සීනිවලින් අප රට ස්වයංපෝෂිත කරවීම සඳහා වැසී ගිය හිඟුරාන කන්තලේ සීනි කර්මාන්තශාලා යළි පණ ගැන්වෙනු ඇත.

## කිරි ඉතිරීම - කිරි නිෂ්පාදන කර්මාන්තය

අප රටේ කිරි අවශ්‍යතාවෙන් දේශියව නිපදවෙන්නේ 15% ක් පමණ වූ සුළු ප්‍රමාණයකි. මේ අවාසනාවන්ත තත්වයෙන් අප කඩිනමින් ගොඩ ආ යුතුය. ආනයනය කරනු ලබන කිරිපිටිවලට සහන දී බහුජාතික සමාගම් තර කිරීම වෙනුවට යළිත් කිරියෙන් උතුරන රටක් කරා අප යා යුතුය.

මේ සඳහා කිරි ගොවියා ශක්තිමත් කිරීමට සහ පශු කර්මාන්තය නඟා සිටුවීමට විශේෂ අවධානය යොදන්නෙමි. **ගම්වල ගොවි පවුල්වලට දෙමුහුන් කිරි දෙනුන් සහන ණය පදනමක් මත** ලබාදෙන්නෙමි. මධ්‍යම පරිමාණ **සත්ව ගොවිපොළ ඇති කිරීම සඳහා අවශ්‍ය ඉඩම්, ජලය, උපකරණ හා තාක්ෂණය දේශීය ව්‍යවසායකයින්ට** ලබා දීමට පියවර ගන්නෙමි.

**දියර කිරි පරිභෝජනය හා අලෙවිය දිරි ගන්වන්නෙමි.** රජයේ සෑම රෝහලක් අසලම දියර කිරි අලෙවි මධ්‍යස්ථාන ආරම්භ කෙරෙනු ඇත. යු.එච්.ටී. තාක්ෂණය යොදා ගන්නා දියර කිරි කර්මාන්ත ශාලා කුරුණෑගල, ත්‍රිකුණාමලය හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල පිහිටුවන්නෙමි.

**කිරි ගොවීන් සඳහා කිරි ලීටරයකට රුපියල් 25 ක් ජනවාරි මස සිට** ක්‍රියාත්මක වන පරිදි ලබා දෙන්නෙමි. දැනට වෙළඳපොළේ කිරිවල මිලෙන් කිරි ගොවියා වෙත ලැබෙන 40% ක් පමණක්



වන ප්‍රතිශතය වසර තුනක් තුළ දී 60% දක්වා ක්‍රමානුකූලව ඉහළ නැංවීම තුළින් කිරි ගොවියාට ලැබෙන මිල ක්‍රමයෙන් රුපියල් **35** ක් දක්වා වැඩි කිරීමට ද කටයුතු කෙරෙනු ඇත.

දේශීය කිරිවලින් නිෂ්පාදනය කෙරෙන චීස් යෝගට්, අයිස්ක්‍රීම් හා වෙනත් ආහාර සඳහා රට පුරා සුළු සහ මධ්‍ය පරිමාණ කර්මාන්තවලට සහන ලබා දෙන්නෙමි.

## දළ රළ ජය ගන්නා ධීවරයා


අප අවට ඇති සාගර සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට අපි තවමත් අසමත්ව සිටිමු. මේ තත්වය පිටු දකිමින් ජපානය, තායිලන්තය වැනි රාජ්‍යයන් ධීවර කර්මාන්තයේ ලබා ඇති දැවැන්ත ප්‍රගතිය ශ්‍රී ලංකාවටද ලබාදීම සඳහා අළුතින් සිතන්නටත් ක්‍රියා කරන්නටත් මම අදිටන් කරගෙන සිටිමි. මා ධීවර ඇමතිව සිටි කාලයේ ඒ අරමුණ ජය ගැනීම සඳහා සාගර විශ්ව විද්‍යාලයක් පිහිටුවීමි.

මා විසින් ආරම්භ කරන ලද වෙරළාරක්ෂක හමුදාව වඩාත් ශක්තිමත් කරමින් අප රටේ සාගර සම්පත් සුරැකීමට පියවර ගන්නෙමි. එම සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබමින් ජාතික නිෂ්පාදනය වර්ධනය කිරීමටත්, රැකියා අවස්ථා වැඩි කිරීමටත් කටයුතු කරන්නෙමි.

ඉන්දියන් සාගරයේ ශ්‍රී ලංකාව අවට ගැඹුරු මුහුදේ ඇති සාරවත් මත්ස්‍ය සම්පතින් අස්වනු ලබා ගැනීමට මූලිකත්වය දෙන්නෙමි. ඒ සඳහා දුර ඈත සයුරේ සම්පත් සොයා යාමට සමත් ට්‍රෝලර් යාත්‍රා 50 ක් යොදවා ගැනීමට මම පියවර ගන්නෙමි.

ඊට අමතරව දිවයින පුරා විසිර යන ආකාරයට **ධීවරයින් හට සහනදායී ක්‍රමය යටතේ වසර 3 කදී බහුදින යාත්‍රා 500 ක් ලබා දීමට කටයුතු කරමි.**

යම් ආපදාවකට ලක් වූ **දැල් සහ අනෙකුත් ආම්පන්න සහනාධාර ක්‍රමය යටතේ** නැවත ලබා දීමට වැඩ පිළිවෙලක් දියත් කරන්නෙමි.



**වෙරළ තීරය ඔස්සේ ධීවර වරාය හා නැංගුරම්පොළ 100 ක් වැඩි දියුණු කරන්නෙමි.**

**ධීවරයින්හට ඉන්ධන සහනාධාරයක් 2006 ජනවාරි මස සිට ලබා දෙන්නෙමි.**

නවීන තාක්ෂණය සහිත ධීවර යාත්‍රා, වෙනත් ධීවර යාත්‍රා හා අනෙකුත් ආම්පන්න ධීවර ජනයාට පහසු මිලට ලබාදීම සඳහා නිෂ්පාදනයට පුද්ගලික අංශයට අවශ්‍ය සියලු දිරි දීම් ලබා දෙන්නෙමි.

අලුතින් ප්‍රතිසංස්කරණය කරන ලද වැව් හා ජලාශවල මිරිදිය මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීමටද, පොකුණුවල මසුන් වගා කිරීම සහ දැල් කූඩුවල මසුන් වගා කිරීම ව්‍යාප්ත කරන්නෙමි.

කරදිය සහ මිරිදිය ඉස්සන් වගාව සඳහා කලාප 10 ක අළුත් ගොවිපොළ 150 ක් බිහි කිරීමට ඉඩම්, ප්‍රාග්ධනය, දැනුම හා තාක්ෂණය ලබා දීමට කටයුතු කිරීමටද පියවර ගන්නෙමි.

ධීවර වරායවලට හා නැංගුරම් පොළවලට ආසන්නයෙන් **උතුරේ, නැගෙනහිර සහ දකුණේ මත්ස්‍ය සකස් කිරීමේ හා ඇසිරීමේ කර්මාන්ත** ආරම්භ කිරීමට කටයුතු කරමි.

සුරතල් මසුන් වගාව ප්‍රචලිත කරමි. අපගේ සුළු හා මධ්‍ය පරිමාණ සුරතල් මත්ස්‍ය කර්මාන්තකරුවන්ට ජාත්‍යන්තර වෙළඳපොළ ජය ගැනීමට අවශ්‍ය තාක්ෂණය, වෙළඳපොළ, තොරතුරු හා දිරි ගැන්වීම් රාජ්‍ය මැදිහත්වීම මත ලබා දෙනු ඇත.

ශ්‍රී ලංකා රජයේ අනුමැතිය නොමැති විදේශ ධීවර යාත්‍රා පැමිණ ශ්‍රී ලංකාවට අයත් මුහුදු තීරයේ මසුන් මැරීම වැළැක්වීමට පියවර ගන්නෙමි. හානිකර උපක්‍රම භාවිතයෙන් මසුන් මැරීම පාලනය කිරීමට පියවර ගන්නෙමි.

වැනසුණු ධීවර බෝට්ටු, දැල් ආම්පන්න සහ විනාශ වුණු ධීවර නිවාස සියල්ල මාස තුනක් තුළ ලබා දීමට කටයුතු කරන්නෙමි.



## දැය නංවන නව නිපැයුම්

### කර්මාන්ත සංවර්ධනය

අප නිදහස ලබද්දී අපට සමාන හෝ අඩුවෙන් සංවර්ධනය වී තිබූ චීනය, ජපානය, සිංගප්පූරුව, මැලේසියාව, තායිලන්තය වැනි රටවල් කර්මාන්ත හා වාණිජ ක්ෂේත්‍රයේ මහා පිම් පනිමින් ඉදිරියට ගොස් අද ලෝක ආර්ථිකයේ බලවතුන් බවට පත්ව ඇත. ශ්‍රී ලංකා ආර්ථිකයේ පසුබෑමට ප්‍රධාන හේතුව වූයේ අපට නිශ්චිත අරමුණක් හා වැඩ පිළිවෙලක් නොමැති වීමයි. ඒ බව නිරවුල්ව තේරුම් ගත් මම එකී අභියෝග දිග් විජය කිරීම සඳහා පහත වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන්නෙමි.

- නව ආයෝජන කලාපයන් 12ක් බිහි කොට ඊට අනුරූපීව කුඩා නගර 12ක් මහනගර බවට වැඩි දියුණු කරන්නෙමි.
- සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම මහා පරිමාණ කර්මාන්තයක් ඇතිවන ලෙස නව කර්මාන්ත 300 ක් පිහිටුවන අතර එයින් රුපියල් ලක්ෂ 500 කට වැඩි ආයෝජන සඳහා වසර 5 ක බදු නිදහස් කාලයක් ලබා දෙන්නෙමි.

එසේම ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කරගත් දේශීය අමු ද්‍රව්‍ය 75% කට වඩා යොදා ගන්නා කර්මාන්ත සඳහා ද වසර 5 ක බදු සහන කාලයක් ලබාදෙමි.

මැණික් සහ පිඟන් මැටි කර්මාන්තයේදී මෙන් ඩොලමයිට්, ග්‍රැපයිට්, ඉල්මනයිට් වැනි ඛණිජ සම්පත් සඳහාද අගය එකතු කිරීමේ කර්මාන්ත ආරම්භ කරන්නෙමි.

**මැණික් කර්මාන්තය සඳහාම වෙන්වුණු ආයෝජන ප්‍රවර්ධන කලාපයක්** රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටුවමි.



ශ්‍රී ලංකාවේ වටිනාම සම්පතක් වන මැණික් කර්මාන්තයෙන් උපරිම ඵල ලබාගැනීම සඳහා පුළුල් වැඩ සැලැස්මක් ක්‍රියාත්මක කරමි.

මෙම කලාපය තුළ මැණික් කැපීම, ඔප දැමීම සහ මෝස්තර නිර්මාණය සඳහා අවශ්‍ය පහසුකම් සපයනු ඇති අතර ඒ ඒ අංශයන් හි ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම සඳහා මධ්‍යස්ථානයක් ද පිහිටුවනු ලැබේ.

දැනට විශ්ව විද්‍යාලයන්හි හා කාර්මික විද්‍යාලයන්හි පවත්වා ගෙන යනු ලබන ඉංජිනේරු විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ සියලු පාඨමාලා ශීඝ්‍ර කර්මාන්ත සංවර්ධනයකට පහසුකම් සැළසෙන පරිදි නවීකරණය කොට සංවර්ධනය කරන්නෙමි.

ඉන්දියාව හා පාකිස්තානය අතර ඇති කරගෙන තිබෙන නිදහස් වෙළඳ ගිවිසුම් ඵලදායී ලෙස යොදා ගනිමින් දේශීය කර්මාන්ත නඟාසිටුවීමට ද බලාපොරොත්තු වෙමි.

### සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත

අපේ ආර්ථිකයේ කොඳු නාරටිය බවට සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකත්වයන් (සුමක) පත් කිරීම මගේ බලාපොරොත්තුවයි. එම ව්‍යවසායකත්වයන් ජාතික මට්ටමේ විකාශනය සඳහාත් ජාත්‍යන්තර මට්ටමෙන් ව්‍යාප්ත කරවීම සඳහාත් පියවර ගන්නෙමි. ඒ සඳහා සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යසායකත්වය අධිකාරියක් පිහිටුවමි.

මෙම ප්‍රවේශයෙන් සංවර්ධනය සඳහා "ලංකා පුත්‍ර" බැංකු සේවය ආරම්භ කරනු ඇත. එමගින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා තාක්ෂණ සංවර්ධන අරමුදලක් ද පිහිටු වීමට බලාපොරොත්තු වෙමි.

විශ්ව විද්‍යාල ඇතුළු අනෙකුත් ආයතන විසින් නිෂ්පාදන ක්ෂේත්‍රයට හඳුන්වා දී ඇති පේටන්ට් බලපත්‍ර සහිත නව නිර්මාණ දේශීය ව්‍යවසායකයින්ට හඳුන්වාදීමට ක්‍රියා කරන්නෙමි.



සෑම වසරකදීම තෝරාගනු ලැබූ සුමක ව්‍යාපෘති ජාත්‍යන්තර වෙළඳපොළ තුළ තරඟ කළ හැකි මට්ටම දක්වා වර්ධනය කිරීමට රාජ්‍ය අනුග්‍රහය සඳහා රුපියල් කෝටි 50ක් වෙන් කරමි.

SME බැංකුවෙන් "ලංකා පුත්‍ර" ව්‍යාපෘතිය මගින් මෙම ව්‍යවසායකයින්ට විශේෂ ණය ආධාර සපයන්නෙමි.

සුළු සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී විශේෂ ක්ෂේත්‍ර සඳහා තීරු බද්දෙන් තොරව ආනයනය කිරීමට අවස්ථාව සපයමි.

සුළු සහ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට නව තාක්ෂණය ලබාගෙන කෙරෙන නිෂ්පාදන දිරි ගැන්වීමට වසර 5 ක බදු සහන ලබා දෙමි.

සුළු සහ මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකත්වය තුළ මානව සම්පත් දියුණු කිරීමෙහි ලා එම සේවකයන් වෙනුවෙන් ලබා දෙන වෘත්තීය පුහුණු පාඨමාලාවන් සම්බන්ධයෙන් රාජ්‍ය අනුග්‍රහය සහ මූල්‍යමය අනුග්‍රහය ලබා දෙනු ඇත.

## ඇඟලුම් කර්මාන්තය

ඇමරිකානු කෝටා ක්‍රමය අහෝසි වීම නිසා අභියෝගයට ලක් වූ ඇඟලුම් කර්මාන්තය අපි රැකගත්තෙමු. යුරෝපා කෝටාව අපි ආරක්ෂා කරගත්තෙමු. නව විදේශ වෙළඳපොළ සොයා ගැනීමෙන්, රට තුළම වෙළඳපොළ පුළුල් කිරීමෙන් සහ ඵලදායීතාව හා අපේ අනන්‍යතාව එක් කිරීමෙන් අපේ ඇඟලුම් තවදුරටත් ලොව පුරා ප්‍රචලිත කිරීම මගේ අරමුණයි. ඒ සඳහා තවදුරටත් අවශ්‍ය මඟ පෙන්වීම සහ ශක්තිය සපයන්නෙමි.

දැනට අහෝසි වී ඇති ඇමරිකානු කෝටා ක්‍රමය යළි ලබා ගැනීමට සියලු උත්සහයන් ගනිමි.



ඇඟලුම් අපනයනයන්ගේ එකතු කළ වටිනාකම වැඩිකර ගැනීම සඳහා රෙදිපිළි සැකසුම් කලාප තුනක් පිහිටුවමි.

අපනයන ප්‍රවර්ධන කලාප ආශ්‍රිත ප්‍රදේශවල සහ ප්‍රධාන ඇඟලුම් නිෂ්පාදන ප්‍රදේශවල සෞඛ්‍ය හා නේවාසිකාගාර පහසුකම් පෞද්ගලික අංශයේ ද දායකත්වය සහිතව ආරම්භ කිරීමට කටයුතු කරමි.

අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය ඇතුළු හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය යළි ශක්තිමත් කිරීමට අවශ්‍ය මූල්‍ය, තාක්ෂණ සහ වෙළඳපොළ සහාය ලබා දෙමි.

## ඉදිකිරීම්

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රය වර්තමානයේ මුහුණ දී සිටින ප්‍රධානතම බාධකයන් වී ඇත්තේ දීර්ඝ කාලීන ප්‍රාග්ධන හිඟකම, රාජ්‍ය ආයෝජනයේ මන්දගාමී බව සහ විදේශීය ඉදිකිරීම් සමාගම් වල තරගකාරීත්වයයි. මෙම අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීම සඳහා දේශීය ඉදිකිරීම් ක්ෂේත්‍රයට විශේෂ අනුග්‍රහයක් දක්වන වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත. සියලු රජයේ කොන්ත්‍රාත් සඳහා දේශීය සමාගම් වලට ප්‍රමුඛතාව දෙනු ලැබේ.

“ලංකා පුත්‍ර” බැංකු සේවය යටතේ ඉදිකිරීම් සුරැකුම් අරමුදල ශක්තිමත් කෙරේ. **කර්මාන්ත කරුවන්ට අවශ්‍ය ප්‍රාග්ධනය ලබාදීමට සහ ඉදිකිරීම් සඳහා අවශ්‍ය උපකරණ ලබාගැනීමට විශේෂ ණය ක්‍රමයක් හඳුන්වා දෙමි.**

ඉදිකිරීම් කර්මාන්ත පුහුණු සහ සංවර්ධන ආයතනය අධිකාරියක් බවට පත් කරනු ඇත. වැලි, ගල් සහ ලී ආදී ඉදිකිරීම් ද්‍රව්‍යවල හිඟය මැඩ පැවැත්වීමට පරිසර හිතකාමී ද්‍රව්‍ය හා තාක්ෂණය හඳුන්වාදීම දිරිමත් කෙරේ. මුහුදු වැලි පවිත්‍රකර භාවිතා කිරීම, ලී සඳහා වාණිජ වන වගාව, විකල්ප ගොඩනැගිලි ද්‍රව්‍ය හඳුන්වා දීම ඒ අතර ප්‍රධාන වේ. දැව ආනයනය සඳහා තීරු බදු සහන ලබාදෙනු ඇත.



පෙරසවි ගොඩනැගිලි, ඉහළ ප්‍රමිතියෙන් යුත් ද්‍රව්‍ය භාවිතය, නව තාක්ෂණ උපක්‍රම ආදී නවීන සහ ජනප්‍රිය ඉදිකිරීම් ශිල්ප ක්‍රම තුළින් ඉදිකිරීම් ක්ෂේත්‍රය ශීඝ්‍රයෙන් ඉදිරියට ගෙන යාමට කටයුතු කරන්නෙමි. තාක්ෂණය සහ ඵලදායීතාව වර්ධනය කිරීම සඳහා ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු රාජ්‍ය අංශයේ අනුග්‍රහය සහිතව ක්‍රියාත්මක කිරීමද කටයුතු කරමි.

දේශීය ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා හැකිතාක් දුරට දේශීය අමුද්‍රව්‍ය හා නිපැයුම් භාවිතා කිරීමට දිරි දෙමි.


රාජ්‍ය අංශයේ මිලදී ගැනීමේ ක්‍රමවේදයේ පවත්නා දුර්වලතා නිසා තමන් විසින් කරන ලද ඉදිකිරීම්වලට මුදල් ලබා ගැනීමේ දී ඉදිකිරීම් සමාගම් මුහුණ දෙන ගැටළු විසඳීමට කඩිනම් පියවර ගන්නෙමි.

## සංචාරක ව්‍යාපාරය

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට සංචාරක ව්‍යාපාරයෙන් ලබාගත හැකි දායකත්වය විශාලය. එහෙත් දේශයේ ස්වභාවික හා මානව සම්පත් සැලසුම් සහගත ලෙස මෙම කර්මාන්තය සඳහා විද්‍යානුකූලව යොදා ගැනීමක් තවමත් දක්නට නොමැත. ජන සංචරණය වෙනුවට **පරිසර හිතකාමී තිරසාර සංචාරක කර්මාන්තයක්** ඇති කිරීම මගේ බලාපොරොත්තුවයි.

ශ්‍රී ලංකාවේ පාරිසරික සහ සංස්කෘතික ආකර්ශනයන්ගෙන් උපරිම ප්‍රයෝජන ගැනීම පිණිස දැනට ඇති සැලසුම් යාවත්කාලීන කරමින් ඉදිරි වසර පහ තුළ සංචාරක කර්මාන්තය ඉහළම තලයකට ගෙන ඒම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කරන්නෙමි.

2010 වර්ෂය වනවිට විදේශ සංචාරකයින් 15,00,000 ක් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ ඉලක්කයක් හඹා යාම සඳහා ව්‍යාපාරික සැලසුමක් සකසන්නෙමි. ඒ සඳහා දැනටමත් සංචාරකයන් පැමිණෙන රටවල් වලට අමතරව ඉන්දීය, චීන, මැදපෙරදිග සහ රුසියානු සංචාරකයන් ඉලක්ක ගත කෙරේ.



මෙම අතිරේක සංචාරක ප්‍රමාණය දරාගැනීම සඳහා අවශ්‍ය හෝටල් කර්මාන්තය ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනයට අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය ලබා දෙන්නෙමි.

සංචාරක ක්ෂේත්‍රයට ආශ්‍රිත විධිමත් ඇගයීමකට ලක් වී නොමැති මඟ පෙන්වන්නන්ට නිසි පුහුණුව ලබා දීමටද ඔවුන් සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කිරීමටද පියවර ගන්නෙමි.

හම්බන්තොට, කල්පිටිය, අරුගම්බේ ඇතුළු සංචාරක කර්මාන්තය සඳහා ආකර්ශනීය ප්‍රදේශයන්හි එම කර්මාන්තය දියුණු කිරීමට පියවර ගන්නෙමි.

බේරේ වැව රවුම, ලන්දේසි ඇල ප්‍රදේශය සංචාරක කර්මාන්තය සඳහා ප්‍රමුඛතාව ලැබෙන පරිදි සංවර්ධනය කරමි.

## නිල්ල පිරුණු රටක්

### පරිසර සංරක්ෂණයට තිරසාර පිළිවෙතක්

අනුබුදු මිහිඳු මා හිමියන් මේ රටට වැඩම කළ දිනයේ දේවානම් පියතිස්ස රජුට දෙසා වදාළේ මහරජ, ඔබ මේ බිමේ පාලකයා නොව භාරකාරයා බවයි. ඒ දැක්ම මත කටයුතු කළේ නම් අද අපේ ලෝකයේ ඇති සම්පත් හිඟය හා පරිසර දූෂණයටත් එහි ප්‍රතිඵලයක් ලෙස අප මුහුණ දෙන නියඟ, ගංවතුර හා ස්වාභාවික විපත්වලටත් ලක් නොවන්නට ඉඩ තිබිණි.

මාගේ බලාපොරොත්තුව මේ රටේ මහ පොළව සතා සීපාවා හා ගහ කොළ ද සමඟ බැඳුණු තිරසාර සංවර්ධනයක් ඇති කිරීමයි. මතු පරපුරටද අපේ හරිත උරුමය දායද කර දීමයි.

අපේ එක් ලෝක උරුමයක් වන්නේ ජෛව විවිධත්වයයි. එය විදේශිකයන්ට අත්පත් කර ගැනීමට ඉඩ නොතබමි. අපේ සාගර සම්පත්, ජලය, ජලජ ජීවින්, වනාන්තර හා ස්වාභාවික සම්පත් වල අයිතිය රජය සතුව පවත්වා ගනිමි. කඳුකරය, උස්බෑවුම් හා



**ජල සංරක්ෂණ ප්‍රදේශවල අපට ආවේනික ශාක වලින් යුතු වන වගා වැඩපිළිවෙලක් "හරිත පියස"** නමින් ක්‍රියාත්මක කරමි.

සතුනට හිංසා පීඩා කිරීම මිනිස් කමට කරන්නා වූ නිගාවක් ලෙස සළකමි. එහෙයින් සත්ව හිංසනය වැළැක්වීම සඳහා පවත්නා යල් පැනගිය නීති රීති කඩිනමින් සංශෝධනය කිරීමට යෝජනා කරමි.

ජාතියේ දැව අවශ්‍යතා සඳහා වාණිජ දැව වගාව ඉහළ නැංවීමට අවශ්‍ය පියවර ගන්නෙමි.

**නාගරික කැළි කසල ප්‍රශ්නය විසඳීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක්** අරඹමි. ඒවායින් කොම්පෝස්ට් පොහොර නිපදවීම සඳහා ප්‍රාදේශීය වශයෙන් කැළි කසල කළමනාකරණ පද්ධති ඉදිරි වසර හය තුළ පිහිටුවීමට කටයුතු කරමි.

**පොලිතින් භාවිතය ක්‍රමයෙන් තුරන් කිරීමට** කටයුතු යෙදෙන අතර, ඒ වෙනුවට විකල්ප ක්‍රම හඳුන්වා දෙනු ලැබේ. පරිසර සංවර්ධනය පිළිබඳ සියලු රාජ්‍ය ආයතන පරිසර අමාත්‍යංශය යටතට ගනිමි.

## බලශක්ති ප්‍රතිපත්ති

දේශපාලන හා වෙනත් බලපෑම් නිසා අපේ බලශක්ති ක්ෂේත්‍රය අවුල් ජාලයක් වී ඇත. ලෝක වෙළඳපොළේ වැඩිවන ඉන්ධන මිලෙහි බරින් අපගේ දිළිඳු ජනතාව හා රටේ ආර්ථිකය මුදා ගැනීමත් බලශක්ති සැපයුම රට තුළ ඉල්ලුමට සරිලන මට්ටමට ඉහළ නැංවීමත් මගේ ප්‍රධාන ඉලක්කයන් වනු ඇත.

දේශයේ බල ශක්ති සුරක්ෂිතතාවට සහ බලශක්ති සංරක්ෂණයට ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දෙනු ඇත.

ජනතාවගේ සමාජ ප්‍රශ්න, පාරිසරික බලපෑම් ආදී සියල්ල සැළකිල්ලට ගෙන ගල් අඟුරු ඇතුළු තාප බලාගාරද, ජල විදුලි බලාගාරද, විදුලි බල මණ්ඩලයේ ජනක සැලසුම්වලට අනුකූලව කඩිනමින් ඉදි කරමි.



**මොරගොල්ල, උමා ඔය, ගිං ගඟ, බ්‍රෝඩ්ලන්ඩ්ස්** යන ජල විදුලි යෝජනා ක්‍රම හතර ඉදිරි වසර හය තුළ නිමාවට පත් කිරීමට පියවර ගන්නෙමි.

රටේ වියළි කලාපය පදනම් කරගෙන දැව ඉන්ධන ග්‍රාමීය කර්මාන්තයක් ලෙස ආරම්භ කරමි. දැනටමත් සාර්ථක ලෙස අත්හදා බලා ඇති සුළං බලය, සූර්ය බලය ආදියෙන් විදුලි රැහැන් ඇදීමට නොහැකි **අතිශය දුෂ්කර ගම්මාන සඳහා විදුලිය සැපයීමේ වැඩපිළිවෙලක් "සැමට විදුලිය" ව්‍යාපෘතිය යටතේ** ආරම්භ කරමි.

**විදුලිබල මණ්ඩලය පුද්ගලීකරණය නොකරමි.** සේවක කාර්යක්ෂමතාව ඉහළ දැමීම සඳහා වෘත්තීය සමිති ඇතුළු සියලු පාර්ශවයන්ගේ ඒකාග්‍රත්වය සහිතව නව කළමනාකරණ ක්‍රමවේදයන් හඳුන්වා දෙන්නෙමි.

**මම තෙල් සංස්ථාව පුද්ගලික අංශයට නොපවරමි.** සේවක කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නව කළමනාකරණ ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි. නව තෙල් පිරිපහදුවක් හා ගබඩා සංකීර්ණයක් හම්බන්තොට ඉදි කරමි.

ශ්‍රී ලංකාවේ තෙල් සංචිත මගේ පාලන කාලය තුළම ගවේෂණය කර එහි ප්‍රතිලාභ අපේ ජනතාවට ලබා දෙන්නෙමි.

## තිරසාර ප්‍රවාහන පිළිවෙතක්

මාගේ අරමුණ වන්නේ ඉදිරි වසර හයක කාලය තුළ මේ රටේ පොදු ජනතාවට යහපත් ප්‍රවාහන සේවයක් ලබා දීමයි. ඒ සඳහා ප්‍රවාහන සේවකයන්ගේ ද, මගී ජනතාවගේ ද, ප්‍රවාහන වෘත්තිකයන්ගේ ද, බස් හිමියන් ඇතුළු ප්‍රවාහන සේවා සැපයුම් ආයතනවල නියෝජිතයන්ගේ ද, සහභාගිත්වයෙන් **ප්‍රවාහනය පිළිබඳ තිරසාර ජාතික ප්‍රතිපත්තියක්** ගොඩනැඟීමට කටයුතු කරන්නෙමි.



එහිදී, පොදු ප්‍රවාහනයට ප්‍රමුඛතාවය ලබා දීමටත්, මගීන් හා භාණ්ඩ ප්‍රවාහනය කුඩා ප්‍රමාණයේ වාහනවලින් විශාල ප්‍රමාණයේ වාහන වෙත මෙන්ම මහා මාර්ගයෙන් දුම්රිය වෙත ද ආකර්ෂණය කිරීමටත් පියවර ගන්නෙමි.

**දුර ගමන් දුම්රිය ගාස්තු 15% කින් පහත දැමීමට කටයුතු කරමි.**

**දුම්රිය සංවර්ධන දශකයක් ප්‍රකාශයට පත් කරමි.** ඒ දශකය තුළ දළ දේශීය නිෂ්පාදිතයෙන් 1/2% කට නොඅඩු වාර්ෂික ප්‍රාග්ධනයක් දුම්රිය සංවර්ධනය වෙනුවෙන් ලබා දෙන්නෙමි. කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර ඇඹිලිපිටිය හරහා හම්බන්තොට දක්වාද, මුහුදුබඩ දුම්රිය මාර්ගය කතරගම දක්වාද, දීර්ඝ කරමින් සංවර්ධනය කරන්නෙමි. කුරුණෑගල-දඹුල්ල-හබරණ නව දුම්රිය මාර්ගයක්ද ඉදි කරමි. මහනුවර-ගම්පොළ-කඩුගන්නාව දුම්රිය ත්‍රිකෝණයද ඇතුළුව උඩරට දුම්රිය මාර්ගයද වැඩි දියුණු කරමි.

කොළඹ-ගාල්ල, කොළඹ-හලාවත හා කොළඹ-අනුරාධපුර දුම්රිය මාර්ග පැයට කිලෝමීටර 100 ක වේගයක් ළඟාකරගත හැකි ද්විත්ව මාර්ග බවට පත් කරනු ඇත. කොළඹ-කටුනායක අතර ගුවන් තොටුපොළ සම්බන්ධීකරණ දුම්රිය සේවයක් හඳුන්වා දෙනු ලබන අතර මිහින්තලේ දක්වා දුම්රිය සේවය ද වැඩි දියුණු කරන්නෙමි.

**යාපනය අර්ධද්වීපය දක්වා උතුරු දුම්රිය මාර්ගය සහ මන්නාරම් දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීමට** ද මම බලාපොරොත්තු වෙමි. මඩකලපුව-කතරගම සම්බන්ධ කෙරෙන දුම්රිය මාර්ගයක් ඉදිකිරීමේ හැකියාව ද සොයා බලන්නෙමි.

බොහෝ වෙහෙස වී ශ්‍රීලංගමය නැවත පිහිටුවීමට අපට හැකි විය. **වසර තුනක් තුළ බස් රථ 5,000 ක් අලුතින් ලබා දෙමින් ශ්‍රීලංගම ශක්තිමත් කරන්නෙමි.**



පෞද්ගලික බස් රථ සේවාව මුහුණ දී ඇති ගැටලු නොපමාව විසඳිය යුතු බව මගේ විශ්වාසයයි. එහි ඇරඹුම වශයෙන් **පෞද්ගලික බස් හිමියන් හා සේවකයන් සමඟ නව කතිකාවක්** වහාම ආරම්භ කරමි.

බස්රිය-දුම්රිය ඒකාබද්ධ සේවා යළි ආරම්භ කරනු ඇත. ජාතික ප්‍රවාහන කොමිසම ප්‍රතිසංවිධානය කිරීම තුළින් බස් සේවා කාල සටහන්, මඟී ආරක්ෂාව, ග්‍රාමීය සේවා, පාසල් සේවා සහ රාත්‍රී සේවා විධිමත් කරන්නෙමි.

දැනට ආරම්භ කර ඇති කොළඹ-කටුනායක, කොළඹ-මාතර අධිවේගී මාර්ගයන්ද පිටත වටරවුම් මාර්ගය කඩිනමින් නිම කරන්නෙමි. මේ වන විට සැළසුම් කර තිබෙන කොළඹ-යාපනය ඇතුළු දැනට සැළසුම් කර ඇති අනෙකුත් අධිවේගී මාර්ග ව්‍යාපෘති හැකි ඉක්මනින් ආරම්භ කෙරෙනු ඇත. නව අධිවේගී මාර්ග ව්‍යාපෘතීන් සළකා බලන්නේ දුම්රිය සේවයේ සාපේක්ෂ වාසියද සැළකිල්ලට ගනිමිනි.

කොළඹ මාර්ග තදබදය අවම කිරීමට සහ දුම්රිය හරස් මාර්ග අනතුරු අවම කිරීමට **ගුවන් පාළම් 20 ක් වසර 3 ක් ඇතුළත ඉදි කරමි.**

ලන්දේසි යුගයේදී තැනූ හා දැනට පවතින සියලු ඇළ මාර්ග ප්‍රවාහනය සඳහා යොදා ගැනීම පිළිබඳව ද නාගරික ප්‍රදේශවල පාපැදි ධාවන මංතීරු ඇති කිරීමට කටයුතු යොදන්නෙමි.

**පොදු ප්‍රවාහන සේවාවන් වන දුම්රිය, බස්රිය, ත්‍රීරෝද රථ සඳහා සහන මිලට ඉන්ධන** ලබාදීමට අවශ්‍ය සැලසුම් සියල්ලන්ගේ එකඟතාව සහිතව සකස් කරන්නෙමි. ත්‍රීරෝද රථ ජාතික ප්‍රවාහනයේ සිදු කරන සේවාව අගැයීමට ලක් කරන අතර ඔවුන් මුහුණ දෙන ගැටලු නිරාකරණය කිරීමට කඩිනම් වැඩපිළිවෙළක් ලබා දෙන්නෙමි.



<u>නිල් අහස - නිල් දියඹ ජය ගනිමු</u>

## නාවුක හා ගුවන් සේවා

අප රට යළිත් ආසියානු සේද මාවතේ මුතු ඇටය බවට පත් කරවන්නට මම අධිෂ්ඨාන කරගෙන සිටින්නෙමි. අපේ රට එහි විශිෂ්ට භූගෝලීය පිහිටීම උපයෝගී කර ගනිමින් බටහිර හා නැගෙනහිර යාකරන නාවුක, ගුවන්, වාණිජ හා වෙළඳ කේන්ද්‍රයක් ලෙස දියුණු කරන්නෙමි.

**කොළඹ දකුණු වරාය සහ ඕලුවිල් වරායද ඉදිකිරීම් කටයුතු අවසන් කරමි.** ගාල්ල හා ත්‍රිකුණාමලය වරායන් පුළුල් කරන්නෙමි. ත්‍රිකුණාමලය වරාය කේන්ද්‍ර කරගෙන කාර්මික හා සංචාරක කලාපයක් පිහිටුවීමට ද බලාපොරොත්තු වෙමි. කන්කසන්තුරය හා පේදුරුතුඩුව වරායයන්ද සංවර්ධනය කරන්නෙමි.

**හම්බන්තොට අංග සම්පූර්ණ අතරමැදි වරායක්** ලෙස නිර්මාණය කරන්නෙමි. ජාත්‍යන්තර නැව්වලට අවශ්‍ය ඉන්ධන, සකස් කළ ආහාර, ඖෂධ හා වෙනත් සේවාවන් සැපයීම සඳහා හම්බන්තොට සිට ඇඹිලිපිටිය දක්වා ප්‍රදේශ ආවරණය කෙරෙන ආර්ථික කලාපයක් පිහිටුවන්නෙමි.

ශ්‍රී ලංකාවේ ධජය යටතේ නැව් ලියාපදිංචි කිරීමට කටයුතු කරමි. **නාවුක වෘත්තිකයන් සඳහා නාවුක පුහුණු පාසලක් පිහිටුවන්නෙමි.** වාණිජ නාවුක ක්ෂේත්‍රයේ විදේශ රැකියාවන් ලබාදීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කරන්නෙමි.

**දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපොලක් පිහිටුවීමට ද සැළසුම් කරමි.** කොග්ගල, හිඟුරක්ගොඩ, සීගිරිය, අනුරාධපුරය අභ්‍යන්තර ගුවන්තොටුපොලවල් සංවර්ධනය කරන්නෙමි.



## විද්‍යා හා තාක්ෂණය

විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ඌණ සංවර්ධනය අප රට ආර්ථික අතින් පසුබෑමට බලපෑ එක් හේතුවකි. පසුගිය කාලාන්තරයක් පුරාම දියුණු තාක්ෂණ නිෂ්පාදන ආනයනයට අපි ඇබ්බැහිවී සිටියෙමු. දේශීය වශයෙන් තාක්ෂණික දියුණුවට ලබා දුන් ප්‍රමුඛතාවය පිළිබඳව අපට සතුටු විය නොහැක. ඉදිරි හය වසර තුළ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ කැපී පෙනෙන දියුණුවක් අත්පත් කරගැනීම මගේ බලාපොරොත්තුවයි.

**විද්‍යා අධ්‍යාපනය ගම්-නගර, දුප්පත්-පොහොසත් වැනි සීමා මායිම් බිඳ සැමට සමව** ලබා දෙන්නට මම කැප වන්නෙමි.

**දළ ජාතික නිෂ්පාදිතයෙන් අවම වශයෙන් 1%ක් වත් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ නව නිපැයුම් වෙනුවෙන් වෙන් කරමි.** ඒ නව නිපැයුම් ව්‍යාපාරිකයන්ටත්, පාරිභෝගිකයන්ටත් එක ලෙස ලබා දීමටද වැඩපිළිවෙලක් යොදමි.

විද්‍යාව හා තාක්ෂණය ගමට ගෙනයාම සඳහා "විදාතා" සහ "නැණ සල" වැඩපිළිවෙල ශක්තිමත්ව පෙරට ගෙන යමි.

### තොරතුරු තාක්ෂණය

ආසියාවට දැනුම සැපයූ කේන්ද්‍රස්ථානයක් ලෙස ඇති අතීත උරුමය ද, ඉහළ සාක්ෂරතාවකින් හා කුසලතා පිරි මානව සම්පතකින් හෙබි වර්තමාන උරුමයක් ද ඇති ශ්‍රී ලංකාව නූතන ලෝකයේ ද ශීඝ්‍ර තාක්ෂණික සංවර්ධනයක් අත්පත් කරගැනීම සඳහා අවශ්‍ය මූලික සාධක වලින් අනූන බව මගේ විශ්වාසයයි. එනිසා මෙරට තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රය තුළ එබඳු ශීඝ්‍ර සංවර්ධනයක් සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය, නෛතික, මූලෝපායික හා ආයතනික පසුබිම නිර්මාණය කිරීමටද කටයුතු කරමි.



**"නැණ සල" වැඩසටහන යටතේ සියලු ගම්මානවලට පරිගණක හා අන්තර්ජාල පහසුකම්** ව්‍යාප්ත කිරීමට කටයුතු යොදන්නෙමි.

විද්‍යුත් වාණිජ ගනු-දෙනු සඳහා අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කරන්නෙමි.

විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණය උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලන ව්‍යුහය මගින් සපයනු ලබන සේවාවන් කාර්යක්ෂම අයුරින් හා කඩිනමින් ජනතාවට ලබා දීමට අවශ්‍ය පහසුකම් යොදනු ඇත.

විදුලි සංදේශ සේවා සහ තොරතුරු සන්නිවේදන සේවා දිවයින පුරා ප්‍රචලිත කිරීමට අවශ්‍යවන **දිපව්‍යාප්ත යටිතල පහසුකම් ජාලයක්** ඇරඹීමට කටයුතු සලසනු ඇත.

කාලයක් තිස්සේ අඩුවක්ව පවතින සංඛ්‍යාන දත්ත පද්ධති, හදිසි ආපදා සේවා පද්ධති හා භූ විෂමතා තොරතුරු පද්ධති ගොඩ නැඟීම සඳහා නොපමාව ක්‍රියා කරමි.

**සෑම ගමකම ප්‍රමාණවත් පොදු දුරකථන පහසුකම් පිහිටුවන අතර සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම ග්‍රාමීය සන්නිවේදන මධ්‍යස්ථාන** පිහිටුවා එමගින් ග්‍රාමීය ජනතාවට අවශ්‍ය අන්තර්ජාල පහසුකම් ඇතුළු අනෙකුත් බහුමාධ්‍ය සන්නිවේදන පහසුකම්ද ලබා දීමට පියවර ගනු ඇත.

දියුණු ආසියානු රටවල් හා එක්ව දෘඪකාංග (Hardware) හා මෘදුකාංග (Software) නිපදවීමේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ව්‍යාපාරයන් ප්‍රාදේශීය මට්ටමට ගෙන යන්නෙමි.

දැනට ඇති තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව වසර තුනක් තුළදී 20% සිට 60% දක්වා ඉහළ දැමීමට අවශ්‍ය පියවර ගන්නෙමි.

විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයන්ට අදාළ පුහුණු ශ්‍රමිකයින් සඳහා ජාත්‍යන්තර වශයෙන් රැකියා අවස්ථාවන් පවතින බැවින් ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් ඒ සඳහා පුහුණු කිරීමට අවශ්‍ය මධ්‍යස්ථාන අළුතින් අරඹනු ඇත.

ශ්‍රී ලංකාව ආසියාතික තොරතුරු සන්නිවේදන ජාලයන් හි කලාපීය මධ්‍යස්ථානයක් ලෙස දියුණු කිරීමටද බලාපොරොත්තු වෙමි.



# සුව සම්පත සුරකිමු

## "සුව සෙවන" වැඩසටහන

**නිදහස් සෞඛ්‍ය සේවය සුරැකීම මගේ වගකීම වන අතර උස්-පහත් භේදයකින් තොරව සෑම දෙනෙකුටම යහපත් සෞඛ්‍ය සේවයක් ලැබීමට ඇති අයිතිය තහවුරු කිරීම මාගේ වගකීමයි.**

අයවැයෙන් කෙරෙන ප්‍රතිපාදන වහාම ක්‍රියාත්මක වන පරිදි වැඩි කිරීම තුළින් **රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවය ගුණාත්මක බවින් හා ප්‍රමාණාත්මක අතින් වර්ධනය කිරීමට පියවර ගන්නෙමි.**

රෝග වැළැක්වීමේ වැඩ පිළිවෙලට රෝග නිවාරණ වැඩ පිළිවෙලට සමාන ප්‍රමුඛත්වයක් ලබාදෙන අතර, එහි මූලික පියවර වශයෙන් රෝග වැළැක්වීම සඳහා අදාළ ආයතන පද්ධතිය එක් ආයතනයක් තුළ ගොනුකර වෙනමම වැය ශීර්ෂයක් යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ පිහිටුවන්නෙමි.

පෝලියෝ, මැලේරියා, ඩෙංගු සහ ජලභීතිකා රෝග මුළුමනින්ම තුරන් කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරමි.

පිළිකා වැළැක්වීම සඳහා දැනට ක්‍රියාත්මක වන රාජ්‍ය අංශයේ වැඩසටහන් වඩා ශක්තිමත් කරමි.

ඒඩ්ස් උවදුර අප අනාගතය හමුවේ ඇති බරපතල අනතුරක් ලෙස හඳුනා ගනිමින් එම රෝගයෙන් අපේ තරුණ පරපුර සහ රට ආරක්ෂා කර ගැනීම සඳහා කඩිනම් පියවර ගන්නෙමි.

ශ්‍රී ලංකාවේ වර්තමාන වෛද්‍ය/රෝගී අනුපාතය කිසිසේත් ප්‍රමාණවත් නොවන බව මගේ අදහසයි. විශේෂයෙන් ග්‍රාමීය සෞඛ්‍ය අවශ්‍යතා තෘප්ත කළ හැකි වන පරිදි වෛද්‍යවරුන් වැඩිපුර බඳවා ගැනීමට සහ පහසුකම් පුළුල් කිරීමට පියවර ගනිමි.

ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට පාත්‍ර වී ඇති **සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය යළි ක්‍රියාවට නගමි.** රාජ්‍ය ඖෂධ නිෂ්පාදන



නීතිගත සංස්ථාව නැවත ශක්තිමත් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ වැඩිපුරම භාවිතා වන ඖෂධ වර්ග දේශීයව නිෂ්පාදනය කර ගැනීමට කටයුතු යොදමි.

දැනට රටේ සිටින විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව වැඩිකිරීම සඳහා ශිෂ්‍යත්ව ලබා දීමට කටයුතු කරමි.

වෛද්‍යවරුන්ට අවශ්‍ය නේවාසිකාගාර පහසුකම් දියුණු කිරීමටත් වෛද්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ දැමීමටත් ක්‍රියාකරමි.

## දේශීය වෙදකම

ලොවටම ආඩම්බරයෙන් දායාද කළ හැකි මහඟු දේශීය වෛද්‍ය ක්‍රමයක් අප සතුව ඇත. එම දැනුම සංරක්ෂණය කිරීමත් ලොවටම බෙදා හැරීමත් ඉතිහාසය විසින් මට පැවරුණු වගකීමක් ලෙස මම දකිමි.

සිංහල වෙදකමත්, ආයුර්වේදයත්, යුනානි වෛද්‍ය ක්‍රමයත්, හෝමියෝපති හා චීන කටු චිකිත්සාව වැනි සියලුම වෛද්‍ය ක්‍රමවලට අවශ්‍ය තිසි ගෞරවය හා පිළිගැනීම ලබා දෙන්නෙමි.

ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය තුළ ආයුර්වේදයේ කාර්ය භාරය සම්බන්ධයෙන් ජනාධිපති කාර්ය සාධක බලකායේ නිර්දේශයන් ක්‍රියාත්මක කරන අතර, යෝජිත නව ආයුර්වේද පනත හා ආයුර්වේද ඖෂධ විලවුන් හා උපකරණ පනත ඉක්මනින් නීතිගත කොට ක්‍රියාවට නංවමි.

දේශීය වෛද්‍යවරුන්ට අවශ්‍ය හිඟ බෙහෙත් ද්‍රව්‍ය ලබාගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා දෙමි.

සියලුම පෞද්ගලික ආයුර්වේද රෝහල් සහ විදේශිකයන් සඳහා ආයුර්වේද සේවා සපයන ආයතන ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට අවශ්‍ය නෛතික විධි විධාන සළසමි.



## නැණ ගුණ වැඩුම

### ජාතික අධ්‍යාපන වැඩසටහන

**නිදහස් අධ්‍යාපනය සඳහා අපේ දරුවන්ට ඇති අයිතිය කිසිසේත් අහෝසි නොකරමි.** සිසු සිත් බැඳෙන විෂය නිර්දේශයක් සකසා බස මැනවින් ප්‍රගුණ කළ ගුරු සංචිතයක් බිහි කර සෑම සිංහල දරුවෙකුටම දෙමළ භාෂාවත්, දෙමළ භාෂාව මව් බස කරගත් සෑම දරුවෙකුටම සිංහල භාෂාවත් ඉගැන්වීමට කඩිනම් පදනමක් යටතේ පියවර ගන්නෙමි.

මින්මතු කිසිදිනක අපේ දරුවන්ට කුසගින්නේ අකුරු කරන්නට මම ඉඩ නොතබමි. **සෑම පාසල් දරුවෙකුටම දිවා ආහාරය සඳහා බත් වේලක් දීමට මම කටයුතු කරමි.**

රට පුරා ඇති සියලුම මහ විදුහල් සහ මැදි මහ විදුහල් වලට අවශ්‍ය උසස් පෙළ විද්‍යාගාර, සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන් ඉගැන්වීම පදනම් කර ගත් භාෂා මධ්‍යස්ථාන, පරිගණකාගාර, පුස්තකාල, ක්‍රීඩාගාර ඇතුළු සියලු පහසුකම් ලබා දී පරිපූර්ණ පාසල් වශයෙන් ඒවා උසස් තත්වයට නංවන්නෙමි. ඒ අතරින් **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට එක බැගින් තෝරාගත් පාසල් 325 ක් අග්‍රගණ්‍ය පාසල් ලෙස වැඩි දියුණු කෙරෙනු ඇත.**

විශ්ව ගම්මාන සංකල්පය තුළ බරපතල අපහසුතාවයකට පත්ව සිටින අපේ දරු පරපුර ඉන් මුදවා ගැනීම සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් සන්නද්ධ කිරීම ජාතික අවශ්‍යතාවයකි. එහෙයින් ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව වර්ධනය කිරීමට ඉහළම ප්‍රමුඛත්වය ලබා දෙන්නෙමි. **සෑම ශ්‍රී ලාංකික දරුවෙකුම ඉංග්‍රීසි බසෙහි ප්‍රවීණයෙකු කිරීම සඳහා ඉදිරි දස වසර පෙළ ගස්වනු ඇත.**

**අංග සම්පූර්ණ ද්‍රවිඩ භාෂා මාධ්‍ය පාසල් දෙකක් කොළඹටත්, මුස්ලිම් පිරිමි විදුහලක් මහනුවරටත්** ලබා දීමට ක්‍රියා කරමි.



පහ වසරේ ශිෂ්‍යත්ව විභාගය සමත්ව දුර බැහැර ප්‍රදේශ වලින් නාගරික පාසල් වලට පැමිණෙන දරුවන් විඳින දුක් පීඩාවන්

මම දැක ඇත්තෙමි. සමෘද්ධි වැඩසටහනට ඇතුලු වන්නාවූ එවැනි දරුවන්ට සඳහා "සිසු සෙවණ" ව්‍යාපෘතිය යටතේ නොමිලේ නේවාසිකාගාර පහසුකම් ලබා දෙන්නෙමි.

ජලය, විදුලිය සහ දුරකථන යන අත්‍යවශ්‍ය යටිතල පහසුකම් දිවයිනේ සෑම ග්‍රාමීය පාසලකටම ලබා දීමට කටයුතු කරමි.

පාසල් බස් සේවය විධිමත් කිරීමට ද පාසල් සිසුන් ඉලක්ක කරගත් දුම්රිය සේවාවක් ස්ථාපනය කිරීමට ද දුම්රිය, බස් රිය ඒකාබද්ධ පාසල් ප්‍රවාහන සේවා හඳුන්වාදීමට ද පියවර ගන්නෙමි.

ඕනෑම හදිසි ව්‍යසනයක රුදුරු ගොදුරු බවට පත් වන්නේ දරුවන්ය. එබැවින් ජාතික ආපදා කළමනාකරණ සභාවේ ද සහයෙන් වාහන අනතුරු, ගිනි ගැනීම්, ජල ගැලීම්, නාය යෑම්, සුනාමි වැනි හදිසි ආපදාවන්ට මුහුණ දීම පිළිබඳ අවබෝධය සහ ප්‍රායෝගික පුහුණුව සිසු දරුවනට ලබාදෙන වැඩසටහන් සෑම පාසලකම ක්‍රියාත්මක කරමි.

ජාතික උත්සව යෙදෙන මාස වලදී අ.පො.ස. උසස් පෙළ විභාගය පැවැත්වීම නිසා දරුවන්ටත් ඔවුන්ගේ දෙමාපියන්ට සහ විභාග කටයුතු වලට සම්බන්ධවන ගුරුවරුන්ටත් ඇතිවන අසීරුතාවන් මඟ හැරවීම සඳහා එම විභාගය වෙනත් සුදුසු මාසයකදී පැවැත්වීමට අවශ්‍ය පියවර ගන්නෙමි.

දශක ගණනාවක් තිස්සේ නිර්මාණය වූ දේශපාලන පදනම මත අධ්‍යාපන ක්ෂේත්‍රයේ අර්බුද නිමා කිරීමේ එක් පියවරක් වශයෙන් අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීමේ දී සුදුසුකම් සපුරා ඇති ගුරුවරුන්ට ප්‍රමුඛතාව පිරිනැමීම අනිවාර්ය කෙරේ.

ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ සමාජමය හා වෘත්තීමය ගරුත්වය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගනිමි.

ගුරුවරුන් සඳහා දේශීය හා විදේශීය ආයතන වල උසස් අධ්‍යාපන අවස්ථා සැළසීම වෙනුවෙන් ශිෂ්‍යත්ව ක්‍රමයක් හඳුන්වා දෙමි.



තරුණ විදුහල්පතිවරුන්ට අවශ්‍ය දෙස් විදෙස් පුහුණු ලබා දීමට කටයුතු කරමි.

1961 පාසල් රජයට පවරා පනතේ විධිවිධාන ඒ අයුරින්ම සුරක්ෂිත කොට ක්‍රියාත්මක කරමි.

### “සැමට සරසවි” වැඩසටහන

උසස් පෙළ සමත්වන විශාල පිරිසකගෙන් විශ්ව විද්‍යාල සඳහා වරම් ලැබෙන්නේ ඉතාමත් අතලොස්සකටය. එසේ වුවද උසස් පෙළ සමත්වන සියලුම තරුණ තරුණියන්ට උසස් අධ්‍යාපනය හැදෑරීමේ අයිතිය සුරැකිය යුතු වන අතර මම ඒ අභියෝගය භාරගනිමි.

එහි පළමු පියවර ලෙස **නව සරසවි පාඨමාලා** ආරම්භ කිරීම තුළින් සහ සරසවි පහසුකම් පුළුල් කිරීම තුළින් **විශ්ව විද්‍යාල වලට බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමට** මම පියවර ගන්නෙමි. විවෘත විශ්ව විද්‍යාල අධ්‍යාපනය විධිමත් කර පුළුල් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් හා ප්‍රතිපාදන සපයන්නෙමි.

සන්නිවේදන තාක්ෂණ යොදා ගනිමින් දුරස්ථ වැඩසටහන් ක්‍රම හඳුන්වාදීමට ක්‍රියා කරමි.

කොළඹින් බැහැරව පිහිටා ඇති විශ්ව විද්‍යාල ආශ්‍රිත ප්‍රදේශ විශ්ව විද්‍යාල ගම්මාන ලෙස සංවර්ධනය කිරීමට පියවර ගනු ඇත. ඒ තුළින් විශ්ව විද්‍යාල ප්‍රජාවේ අවශ්‍යතා සම්පූර්ණ වන පරිදි ඒ අවට ප්‍රදේශ සංවර්ධනය වනු ඇත.

**සරසවි සිසුන්ගේ මාසික මහපොළ ශිෂ්‍යත්ව දීමනාව සහ ශිෂ්‍යාධාරය රුපියල් 500 කින් වැඩි කරමි.**

සියලු සරසවි සිසුන්ට විශ්ව විද්‍යාල අධ්‍යාපන කාලය තුළදීම රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයේ ආයතනවල ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම සඳහා පියවර ගත්තෙමි.



**සෑම සරසවි ශිෂ්‍ය ශිෂ්‍යාවකටම නේවාසිකාගාර පහසුකම් ලබා දීමට හැකිවන පරිදි නව වැඩපිළිවෙලක් මම ක්‍රියාත්මක කරමි.**

විශේෂිත දක්ෂතා දක්වන විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට ජනාධිපති අරමුදලෙන් ලබාදෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව දෙගුණ කරමි.

සෑම විශ්ව විද්‍යාල ශිෂ්‍යයකුටම තමන්ගේ අභිමතය පරිදි සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය තහවුරු කෙරෙන අතර සිංහල, ඉංග්‍රීසි, දෙමළ සහ ප්‍රධාන විදේශීය භාෂා හැදෑරීම සඳහා අවශ්‍ය සියලු පහසුකම් සහිත භාෂා අධ්‍යාපනාගාරයක් සෑම විශ්ව විද්‍යාලයකම පිහිටුවන්නෙමි.

**විශ්ව විද්‍යාල ආචාර්ය මණ්ඩල සාමාජික පුරප්පාඩු වහාම පිරවීමට** පියවර ගන්නා අතර, නිශ්චිත වැඩසටහනක් යටතේ සියලුම විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ට විදේශ විශ්ව විද්‍යාලවල පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා අවස්ථාව දීම මගේ අරමුණයි.

විශ්ව විද්‍යාල හා අනෙක් අධ්‍යාපන ආයතන තුළ සිදු කෙරෙන නව පර්යේෂණ, සොයාගැනීම් සහ ජාතික සංවර්ධනයට කෙරෙන දායකත්වය වෙනුවෙන් සම්මාන හා ප්‍රදාන ක්‍රමයක් හඳුන්වා දෙනු ඇත. රජයේ අමාත්‍යාංශවල සහ අනුබද්ධ ආයතන වල පර්යේෂණ අවස්ථා සහ පුහුණු කටයුතු වලදී විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සහ සිසුන්ට ප්‍රමුඛතාව ලබා දෙන්නෙමි. **විශ්ව විද්‍යාල වල පර්යේෂණ කටයුතු සඳහා පර්යේෂණ සංවර්ධන අරමුදලක්** ඇති කරන්නෙමි.

## "ජීවන නිපුණතා" වැඩසටහන

නව ප්‍රවණතා අනුව වෙනස්වන දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළෙහි ශ්‍රම අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදිත් සෑම වෘත්තියකම අභිමානය තහවුරු කෙරෙන පරිදිත් ඒ ඒ වෘත්තීන්ට අදාල ජාත්‍යන්තර මට්ටමේ දැනුම සහ පුහුණුව ලබා දීම සඳහා තෘතීයික අධ්‍යාපන පහසුකම් පුළුල් කිරීමට කටයුතු කරමි.



සාමාන්‍ය පෙළ විභාගය දක්වා පමණක් අධ්‍යාපනය හැදෑරූ සිසුන් සඳහා සංචාරක කර්මාන්තය, විද්‍යුත් ක්ෂේත්‍රය, අලෙවිකරණ කටයුතු සහ ගොඩනැගිලි තාක්ෂණය වැනි අංශ සඳහා නිපුණතා ඩිප්ලෝමා පාඨමාලා හඳුන්වා දෙන්නෙමි.

පාසල් හැර යන තරුණ ප්‍රජාව වෙනුවෙන් දැනට රාජ්‍ය අංශයේ පවත්නා විධිමත් **පුහුණු අවස්ථා සංඛ්‍යාව වාර්ෂිකව 60,000 සිට 100,000 දක්වා වර්ධනය කිරීම** සඳහා දැනට ඇති කාර්මික විද්‍යාල නවීකරණය කොට ඒවාට අවශ්‍ය පහසුකම් සැපයෙන අතර දැනට කාර්මික විද්‍යාල නොමැති ප්‍රදේශවල නව කාර්මික විද්‍යාල ආරම්භ කෙරෙනු ඇත.

වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව 200 සිට 300 දක්වා වර්ධනය කිරීම සඳහා නව ආයතන 100ක් පිහිටුවන්නෙමි.

අසංවිධිත අංශයේ ජීවනෝපාය සංවර්ධන අවස්ථා 100,000 බැගින් වාර්ෂිකව ලබාදීම සඳහා **ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ දිවයින පුරා ප්‍රජා විද්‍යාල 500 ක් සංවිධානය කරන්නෙමි.**

විදේශ රැකියා ඉලක්ක කරගත් ජාතික තාක්ෂණික අධ්‍යාපන ආයතනයක් පිහිටුවමි.

## සුනාමියෙන් යළි ගොඩනැගෙමු

### “ජය ලංකා” වැඩපිළිවෙල

සුනාමි ව්‍යසනයෙන් විපතට පත් නිවාස සහ යටිතල පහසුකම් නැවත ගොඩනැගීමේ මන්දගාමී බවට හේතු මනාව වටහාගෙන සිටින මම එකී සීමාවන් ජයගනිමින්, කඩිනමින් මේ සියල්ල යථාතත්වයට පත්කිරීම සඳහා “ජය ලංකා” වැඩපිළිවෙල ඉදිරිපත් කරමි.

සුනාමි විනාශයට හා විපතට පත් ප්‍රදේශවල ජනයා සඳහා මෙතෙක් ලබා දුන් සහනාධාර වලින් ඔවුන්ගේ ජීවනෝපාය යථා තත්වයට පත්වන තුරු තාවකාලික සමාජ ආරක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කරමි.



මීටර් 100 සීමාව තුළ නව ඉදිකිරීම් සම්බන්ධයෙන් සියලු පක්ෂවලින් සමන්විත පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ නිර්දේශයන්ට අනුකූලව නිවාස හෝ ව්‍යාපාරික ස්ථාන හෝ සංචාරක හෝටල් සාදා ගැනීමට අවශ්‍ය විධිවිධාන සලසන්නෙමි.

ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රදේශවල **සුනාමියෙන් දෙමාපියන් හෝ භාරකරුවන් අහිමි වී ඇති දරුවන්ගේ වියදම් දැරීම සඳහා රුපියල් කෝටි 50ක විශේෂ අරමුදලක්** පිහිටුවන්නෙමි.

සුනාමියෙන් විනාශ වූ පුරා විද්‍යාත්මක ස්ථාන හා ආගමික ස්ථාන වසරක් ඇතුළත නැවත ගොඩ නැංවීමට ක්‍රියා කරමි. ඒ සඳහා අදාළ ආගමික නායකයින්ගෙන් හා ස්වෙච්ඡා සංවිධානවලින් අවැසි උපදෙස් හා උපකාර ලබා ගනිමි.

විනාශ වූ සියලු ඔරු තොටවල් සහ ධීවර වරායන් යළි ගොඩ නැංවීමේ කටයුතු වේගවත් කරමි.

උප්පැන්න සහතික, හැඳුනුම්පත්, ඉඩම් ඔප්පු, නැති වී ගිය සහතික කළ ලියකියවිලි ආදිය ඇතුළු විනාශ වූ සියලු ලියකියවිලි නොපමාව යළි ලබාදීම සඳහා සහ ඉඩම් අයිතිය නිරවුල් කිරීම සඳහා සියලු බලතල සහිත ඒකකයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටුවනු ඇත.

## ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන

ජාතික වශයෙන් ඉදිරිපත් කර තිබෙන පොදු වැඩපිළිවෙලවල් වලට අමතරව එක් එක් ප්‍රදේශ ඉලක්ක කරගත් විශේෂිත වැඩපිළිවෙලවල් ගණනාවක්ද සැලසුම් කර ඇත.

### තල් රූප්පාවෙන් ඔබ්බට

දශක දෙකකටත් වඩා දිග ඇදුණු ගැටුම්කාරී අර්බුදය ද ඉන්දීය සාගරයෙන් හදිසියේ මතු වූ ප්‍රචණ්ඩ සුනාමි රළ පහර ද උතුරේ හා නැගෙනහිර ඔබේ ජීවිත පෙළන බව මම දනිමි.



කිසිදු වර්ගවාදී, ආගම්වාදී පටු අන්තයක සිර නොවී උතුරා යන මානව දයාවෙන් මම ඔබ දෙස බලන්නෙමි. ඔබේ දරුවන්ගේ අනාගතය දෙස බලන්නෙමි. ඉතාමත් දුෂ්කර කොන්දේසි යටතේ ජීවිතය සඳහා පොරබදන ඔබගේ එදිනෙදා ගැටලු විසඳාලීමට පියවර ගන්නෙමි.

මහා භාරතයේ ශ්‍රේෂ්ඨ නායක ජවහර්ලාල් නේරු තුමා පැවසූ සේ **ඔබ සියලු දෙනාගේම ඇස්වල ඇති කඳුළු පිසදා දැමීමේ වගකීම මම භාර ගන්නෙමි.** ඒ සඳහා මූලික වශයෙන් පහත යෝජනා ඔබ හමුවේ තබන්නෙමි.

**යුද්ධයෙන් විනාශ වී ගිය නිවාස හෝ ඒනිසාම බිඳ වැටුණු ජීවිත නැවත සකසා දීම අරමුණු කොට ගෙන විශේෂ අරමුදලක්** ඇති කරන්නෙමි.

**මෙමගින් පවුල් 80,000 ක් සඳහා විනාශ වී ගිය නිවාස** සහ ජීවනෝපායන් පළමු වසර තුළ ලබා දීමට බලාපොරොත්තු වෙමි. ඉන් කොටසක් සහනාධාර ලෙස ද අනෙක් කොටස පොළී රහිත ණයක් ලෙස ද ලබා දීමට මම අදහස් කරමි.

**අධි ආරක්ෂිත කලාප නිසා නිවාස හැරයාමට සිදුවී ඇති පවුල් සඳහා තාවකාලික දීමනාවක් ගෙවීමට කටයුතු කරමි.**

**අවතැන්වූ සියලු දෙනා තම ගම්බිම්වල කඩිනමින් නැවත පදිංචි කරමි.**

**උතුරු ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා යාපනය හා මන්නාරම දුම්රිය මාර්ග නැවත ප්‍රතිසංස්කරණය** කරනු ලැබේ. ප්‍රදේශයේ සියලුම මහා මාර්ග හා ග්‍රාමීය මාර්ග සියල්ලක්ම විශේෂිත "මග නැගුම" ව්‍යාපෘතියක් මඟින් තනා නිම කරන්නෙමි.

විනාශ වී හෝ අඩාල වී තිබූ සියලු සෞඛ්‍ය පහසුකම් අනාගතයට සරිලන අන්දමින් නැවත ගොඩ නගමි. එසේම, වෛද්‍ය හා සෙසු සේවක අඩුපාඩුකම් දුරලීමට ද කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාවට නංවමි.

විනාශ වී ඇති හෝ දියුණු නොකරන ලද සියලු පාසල් ගොඩනැගිලි උසස් ප්‍රමිතීන්ට අනුව යථාතත්වයට පත් කිරීම සඳහා පියවර ගනු ලැබේ.



**වසරක් ඇතුළත උතුරු ප්‍රදේශයේ ගුරු හිඟය ඇති සියලූ ගුරු පුරප්පාඩු පුරවන්නෙමි.**

විනාශ වී ගිය පීඨයන් නැවත ගොඩ නැඟීම ඇතුළුව යාපනය විශ්ව විද්‍යාලය සඳහා සියලු භෞතික පහසුකම් ලබා දීමටද, අධ්‍යාපන පාඨමාලා නවීනත්වයෙන් යුතුව පුළුල් කිරීමටද කටයුතු කරමි. යාපනය විශ්ව විද්‍යාලය කේන්ද්‍ර කොටගත් මානව සංවර්ධන ව්‍යාපෘතියක් නිර්මාණය කරන ලෙස උතුරු නැගෙනහිර පළාත්වල බුද්ධිමතුන්ට ආරාධනා කරමි. ඒ සඳහා අවශ්‍ය සියලු සම්පත් හා මූල්‍ය පහසුකම් සැපයීමේ වගකීම මම ඉටු කරන්නෙමි.

ධීවර කටයුතු යළි පණ ගැන්වීමට අරඹා ඇති වැඩපිළිවෙල තවදුරටත් පුළුල් කිරීමට පියවර ගනු ලැබේ. විශේෂයෙන්ම මසුන් සැකසීමේ හා ඇසිරීමේ කර්මාන්ත ශාලාවක් උතුරු පළාත තුළ පිහිටුවීමට පියවර ගන්නෙමි.

උතුරේ හදවත වන් ගොවියාට මූල්‍ය හා කෘෂි ආම්පන්න සැපයීමට ද, ඔවුනගේ අස්වැන්නට ඉහළ මිලක් සැපයීමට ද මවිසින් හඳුන්වා දෙනු ලබන දේශීය ආර්ථික ප්‍රතිපත්තිය ඔස්සේ කටයුතු කෙරේ. විනාශවී ගිය තල්, පොල් හා කජු වගාවේ පුනරුත්ථාපනය සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන්නෙමි.

මෙම ප්‍රදේශවල පසේ ලවණ ගතිය අඩු කොට කෘෂිකර්මාන්තයට යොදා ගැනීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් ජාත්‍යන්තර ආධාරද ඇතිව ක්‍රියාත්මක කෙරේ.

භූමිය මෙන්ම ප්‍රදේශයේ ජෛව ශක්තීන් හා විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා පරිසර සංවර්ධන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්නෙමි.

උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පානීය අවශ්‍යතා සඳහා හා වැව්ලි සඳහා ජලය ලබා දීමේ දිස්ත්‍රික් ව්‍යාපෘති ඉහළ ප්‍රමුඛත්වයක් දී ක්‍රියාත්මක කරනු ලැබේ.



බලශක්ති අවශ්‍යතා හා සන්නිවේදන අවශ්‍යතා කඩිනම් වැඩපිළිවෙලක් මඟින් සම්පූර්ණ කිරීමට කටයුතු කරමි.

ප්‍රදේශයේ ආයතනවල කාර්යභාරය වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය යන්ත්‍ර සහ උපකරණ ලබා දෙනු ඇත.

ජාතික සමුපකාර ව්‍යාපාර බලගැන්වීමේ වැඩපිළිවෙලට අනුව උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ඇති සමුපකාර ව්‍යාපාරය ශක්තිමත් කිරීමට පියවර ගන්නෙමි.

ප්‍රදේශයේ තරුණ තරුණියන් උදෙසා තෘතියීක පුහුණු වැඩසටහන් ආරම්භ කෙරෙනු ඇත.

ගැටුම් වලින් සහ සුනාමියෙන් විනාශ වුණු සියලුම කෝවිල්, පල්ලි හා පන්සල් ඉතා ඉක්මනින් නැවත ප්‍රතිසංස්කරණය කරන අතර එම භූමිවල සංස්කෘතික මධ්‍යස්ථාන හෝ ආගමික කටයුතු සඳහා ඉදිකිරීම් අවශ්‍ය වේ නම් ඒවා සඳහා මූල්‍ය සම්පත් වෙන් කරනු ලැබේ.


උතුරු පළාතේ අවතැන්වී ඇති මුස්ලිම් ජනතාව කඩිනමින් පදිංචි කරමි.

**නැගෙනහිර නවෝදය**

ජනගහන, විවිධත්වය, භූගෝලීය හා සංස්කෘතික සාධක සළකා බැලීමේදී නැගෙනහිර පළාත තුළ ජීවත් වන ජනතාවට ඔවුන්ටම විශේෂිත වූ ප්‍රශ්න සමුදායක් ඇති බව මගේ පිළිගැනීමයි. එබැවින් එම ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා විශේෂිත වූ වැඩපිළිවෙලක් මගේ රජය යටතේ දියත් කෙරෙනු ඇත.

මෙහි ප්‍රශ්න සමුදාය අතර ආරක්ෂාව සම්බන්ධයෙන් නැගෙනහිර ජනතාව තුළ මතුව ඇති භීතිය ඉවත් කිරීම ප්‍රමුඛතාවයෙහි ලා සළකමි. කිසිදු ජාතියක් තවත් ජාතියක හෝ කණ්ඩායමක ප්‍රාණ ඇපකරුවන් නොවිය යුතු බවට වන මාගේ මූලික පිළිගැනීම තුළ නැගෙනහිර ජනතාවගේ සුරක්ෂිත භාවය තහවුරු කරන්නෙමි.

මේ සඳහා ත්‍රිවිධ හමුදාව සහ පොලිසියද, විශේෂ කාර්ය බලකායද, ජනතා සංවිධාන ද, ප්‍රදේශයේ දේශපාලන නායකත්වය ද, ඒකරාශී වූ නව ආරක්ෂක ජාලයක් නිර්මාණය



කරන්නෙමි. මෙහිදී මුස්ලිම් ප්‍රජාවගේ ආරක්‍ෂාව තහවුරු කිරීමට විශේෂයෙන් සැළකිලිමත් වන්නෙමි. මුස්ලිම් ජනතාව වෙනම ජන කණ්ඩායමක් ලෙස සැලකෙන අතර ඔවුන්ගේ නියෝජනත්වය සෑම අවස්ථාවකම තහවුරු කරමි. නැගෙනහිර පළාතේ විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දී සිටින සිංහල හා දෙමළ ජනතාවගේ ද ගැටලු නිරාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් යොදන්නෙමි.

නැගෙනහිර පළාතේ මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවල වෙසෙන ජනතාවට ඔවුන්ගේ පරිපාලන අවශ්‍යතා සඳහා තම පළාත් කේන්ද්‍රස්ථානය වූ ත්‍රිකුණාමලයට බොහෝ දුරක් යාමට සිදුවීම මහත් දුෂ්කරතාවයකි. මෙම තත්වයට පිළියම් ලෙස පූර්ණ බලැති පළාත් අතිරේක කාර්යාලයක් අම්පාර ප්‍රදේශයේ පිහිටුවන්නෙමි.

නැගෙනහිර පළාතේ ජනතාව මුහුණ දී සිටින ඉඩම් ගැටලු නිරාකරණය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරමි. අම්පාර ප්‍රදේශයේ කෘෂි අපනයන කලාපයක් පිහිටුවමි. ප්‍රදේශයේ සියලු වැව් සහ වාරිමාර්ග ක්‍රම පිළිසකර කරමි.

ත්‍රිකුණාමලය-මඩකලපුව මහා මාර්ගය පූර්ණ සංවර්ධනයට ලක් කරමි. පානම හා මොණරාගල අතර නව මහා මාර්ගයක් ඉදිකරන්නෙමි. ප්‍රදේශයේ අනෙකුත් මාර්ග සංවර්ධනයට විධිමත් වැඩපිළිවෙලක් සකසන්නෙමි.

මඩකලපුව සහ ත්‍රිකුණාමලය දුම්රිය මාර්ග වැඩි දියුණු කෙරෙනු ඇත.

ඕලුවිල් වරාය සංවර්ධන කටයුතු කඩිනමින් නිමා කරන්නෙමි.

වාලච්චේනයි සහ කල්මුනේ නගරය සංවර්ධනය කරමි.

මේ ප්‍රදේශයේ සියලු පුරාවිද්‍යාත්මක ස්ථාන ආරක්‍ෂා කරන අතර සියලු ආගමික සිද්ධස්ථාන සංවර්ධනය කිරීමට කඩිනම් වැඩපිළිවෙලක් යොදමි.

- සත්ව පාලනය දියුණු කිරීමට විශේෂ වැඩපිළිවෙලක් සකස් කරමි.
- ධීවර යෝජනා ක්‍රම ගණනාවක් අලුතින් ආරම්භ කරමි.



- විශේෂ සංචාරක කලාපයක් ලෙස මෙම ප්‍රදේශයන් සංවර්ධනය කරමි.
- ඇඟලුම් කර්මාන්ත ශාලා අළුතින් ඉදිකරමි.
- මුස්ලිම් පාසල්වල දැනට ඇති ගුරු හිඟය නිම කිරීමටත් ඒවායේ භෞතික සම්පත් සංවර්ධනය කිරීමටත් කටයුතු කරමි.

සුනාමි ව්‍යාසනයෙන් බරපතලම ජීවිත හා දේපළ හානියට ලක් වූයේ නැගෙනහිර පළාතේ මුස්ලිම් ජනතාවයි. එබැවින් පුනරුත්ථාපන කටයුතු වලදී එම ප්‍රදේශ ඉලක්ක කොට ගත් විශේෂ ව්‍යාපෘතියක අවශ්‍යතාවය මම වටහාගෙන සිටිමි. මේ සඳහා පළාතේ දේශපාලන නායකත්වය, අග්නිදිග විශ්ව විද්‍යාලය, සහ ප්‍රදේශයේ රාජ්‍ය ආයතන හා ප්‍රජා සංවිධාන සම්බන්ධ කොට ගත් ඒකාබද්ධ පුනරුත්ථාපන වැඩපිළිවෙලක් කඩිනමින් ක්‍රියාත්මක කරමි.

**සෙංකඩගල නවෝදය**

- සෙංකඩගල ප්‍රදේශයේ විශේෂිත සම්පත් ආශ්‍රිත කර්මාන්ත වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලංකා පුත්‍ර බැංකු සේවය යටතේ ලබා දෙමි.
- කන්ද උඩරට ජනතාවගේ ඉඩම් ප්‍රශ්නය විසඳීමට ප්‍රමුඛතා පදනමක් මත රජයේ ඉඩම් ලබාදෙමි.
- උඩරට ජනතාව අතර ඇති පාරම්පරික කර්මාන්ත සියල්ල වෙන වෙනම ගෙන ලංකා පුත්‍ර බැංකු සේවය යටතේ වැඩි දියුණු කරන්නෙමි.
- කොත්මලේ-දිගන-උකුවෙල ආශ්‍රිතව පිහිටුවනු ලබන ආර්ථික කලාපය කේන්ද්‍ර කර ගනිමින් නවීන තාක්ෂණය මුසුකොට ගත් ආදර්ශ පර්යන්ත ගම්මාන ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි.
- නුවරඑළිය ආශ්‍රිතව විශේෂ පාරිසරික සංරක්ෂණ ව්‍යාපෘති ආරම්භ කරන්නෙමි.



## රුහුණු අරුණාලෝකය

- ගාල්ල මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්ක වල සංචාරක පුරවර ලෙස සංවර්ධනය සහ විශේෂයෙන්ම පාරිසරික සහ ත්‍රාසෝත්පාදන සංචාරක ව්‍යාපාරය දියුණු කරමි
- දක්ෂිණ අධිවේගී මාර්ගය කඩිනමින් සම්පූර්ණ කරන්නෙමි. මාතර, හම්බන්තොට, වීරවිල, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය නව මාර්ග සහ ඒවාට අතුරු ප්‍රවේශ මාර්ග ඉදි කරමි. ගාල්ල සහ හම්බන්තොට වරාය සංවර්ධනය කර වාණිජ නගර බිහි කිරීමටත්, ධීවර වරාය සහ නැංගුරම් පොළ සංවර්ධනය කිරීමටත්, ටින් මාළු කර්මාන්ත ශාලා ස්ථාපිත කිරීමටත් පියවර ගන්නෙමි.

## රජරට නවෝදය

- අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයන් හි ගම්මාන දියුණු කිරීමට රජරට නවෝදය නමින් කඩිනම් වැඩසටහනක් දැනටමත් ක්‍රියාත්මක වන අතර “ගම නැගුම” හා “මග නැගුම” වැඩපිළිවෙල තුළින් එය වඩාත් ශක්තිමත් කරන්නෙමි.
- අනුරාධපුර සහ පොළොන්නරුව ප්‍රදේශවල සිද්ධස්ථාන නිසි පරිදි සංරක්ෂණය කිරීමට සහ එම ප්‍රදේශවල වන්දනා කරුවන්ට අවශ්‍ය ප්‍රවාහන, නවාතැන් හා අනෙකුත් යටිතල පහසුකම් දියුණු කිරීමට කටයුතු කරන්නෙමි.

## වයඹ පුනර්ජීවනය

- පඬුවස්නුවර, දඹදෙණිය, යාපව්ව, ඇතුගල්පුර සංස්කෘතික චතුරශ්‍රය ඓතිහාසික උරුමයන්ට ගැලපෙන පරිදි ප්‍රතිසංස්කරණය කොට සංරක්ෂණය කරන්නෙමි.
- දැදුරු ඔය වාරිමාර්ග ක්‍රමය කඩිනමින් ක්‍රියාත්මක කරමි.



## පුබුදමු වෙල්ලස්ස

ඌව වෙල්ලස්ස ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ඉතාමත්ම නොදියුණු, අති දුෂ්කර සහ දැඩි දරිද්‍රතාවයකින් යුත් ප්‍රදේශයකි. මෙම ප්‍රදේශයේ කඩිනම් සංවර්ධනයක් ඉදිරි සය වසර තුළ ළඟා කරගැනීම සඳහා දැනටමත් යෝජනා කර ඇති පුබුදමු වෙල්ලස්ස සංවර්ධන සැළැස්ම යටතේ කටයුතු කරමි.

ප්‍රදේශයේ අධ්‍යාපන පහසුකම් නගා සිටුවීමට පියවර ගනු ඇත. මේ යටතේ ප්‍රදේශයේ පවත්නා දැඩි ගුරු හිඟය මඟහරවා ගැනීම සඳහා ගුරු පුරප්පාඩු පියවීමට පියවර ගනු ලැබේ. ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය පිහිටුවීමේ කටයුතු කඩිනමින් නිම කොට වෙල්ලස්සේ ඓතිහාසික උරුමයට නැවත ජීවය ලබා දීමට කටයුතු කරන්නෙමි.

පළාත් සභාව සමඟ ඒකාබද්ධව ප්‍රදේශයේ සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමට පියවර ගන්නෙමි.

අතීතයේදී ඌව වෙල්ලස්ස ප්‍රදේශය ශ්‍රී ලංකාවේ සශ්‍රීකම ප්‍රදේශයක්ව පැවතුනි. මෙම තත්වය නැවත උදාකර ගැනීම සඳහා ප්‍රදේශයේ වැව් ඇතුළු වාරි මාර්ග පද්ධති පිළිසකර කිරීමේ කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්නෙමි.

උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය ප්‍රමුඛතා පදනමක් යටතේ ක්‍රියාත්මක කෙරෙනු ඇත.

දෙහි, දොඩම් ඇතුළු වගාවන් සංවර්ධනය කිරීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ඇති අතර අලෙවි ගැටලු සඳහාද පිළියම් යොදනු ඇත. එකී භෝග ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලා පිහිටුවීමටද ක්‍රියා කරමි.

ගම්මිරිස් ගොවියන් මේ වනවිට මුහුණ දී සිටින ගැටලු නිරාකරණය කිරීම සඳහා ද කඩිනම් වැඩපිළිවෙලක් සකස් කෙරෙනු ඇත.



## වතුකරයට නව ජීවනයක්

වතුකරයේ ජනතාවට තමන්ගේම වූ බිම් කැබැල්ලක් ලබා දෙමි. එමගින් වැවිලි කම්කරු ප්‍රජාව ද අනෙකුත් පුරවැසියන් මෙන් දේපල හිමි ස්වෛරීව පුද්ගලයන් ලෙස නඟා සිටුවීමට කටයුතු කරමි.

වතු ප්‍රජාව වෙනුවෙන් 2004 වර්ෂයේ බලයට පැමිණි රජය විසින් සැලසුම් කළ තුන් අවුරුදු සැලැස්මේ ඇති සියලු සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාවේ නැංවීම සඳහා පුළුල් බලතල සහිත වතු යටිතල පහසුකම් සහ වැවිලි ප්‍රජා මානව සම්පත් සංවර්ධන අධිකාරියක් පිහිටුවනු ලැබේ.

වැවිලි ප්‍රජාව ජීවත්වන ජනාවාස වලට ප්‍රවේශ විය හැකි වන ලෙස වතුකරයට සම්බන්ධ සියලු මංමාවත් සංවර්ධනය කර පොදු මාර්ග ලෙස ප්‍රකාශයට පත් කරමි.

වතුකරයේ ලයින් කාමර වල පදිංචිකරුවන්ට එම ලයින් කාමර සහ එය පිහිටි ඉඩම් කොටසේ අයිතිය නොමිලේ ලබා දීමේ අප රජයේ ප්‍රතිපත්ති තීරණයට අනුව එම නිවාස වල සින්නක්කර අයිතිය ඔප්පු ගාස්තු සහ මුද්දර ගාස්තු අයකිරීමෙන් තොරවම පවරා දෙමි. ලයින් කාමර වලින් පිටත තාවකාලික පැල්පත් නිවාස වල පදිංචි ජනතාවට තනි ගෘහ සැපයෙන විශේෂ නිවාස ව්‍යාපෘතියක් "ජන සෙවණ" ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන්නෙමි. මේ යටතේ නිවාස ඒකක 50,000 ක් ඉදිකිරීම ඉලක්කගත කෙරෙනු ඇත.

වතු කම්කරු ප්‍රජාවට නිවස සෑදීමට පර්චස් 7 බැගින් ලබාදුන් ඉඩම් කැබැල්ලට අවුරුදු 20 කින් පසු අයිතිය හිමිවීමේ ක්‍රමය අහෝසි කර එම ඉඩම් කැබලි වල අයිතිය නොමිලේ ඔවුන්ට වහාම ලබා දෙන්නෙමි.

වතුකරයේ පවුල්වලට විශේෂිත පිටි සහනාධාරයක් මාසිකව ලබා දෙන්නට කටයුතු කරන්නෙමි.



වතුකරය තුළ ඌණ සංවර්ධනයට ලක්ව ඇති පාසල් 400 ක් වහාම උසස් තත්වයට පත්කිරීමට ක්‍රියා කරන අතරම වතුකරයේ සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකටම එක බැගින් නවීන ජාතික පාසල් පිහිටුවීමට පියවර ගන්නෙමි.

ගුරු හිඟය මගහැරවීමට වතු ප්‍රජාවගේ උගත් තරුණ තරුණියන්ට ගුරුපත්වීම් 3000 ක් වහාම ලබා දෙන අතර වතු ප්‍රජාවගේ දරුවන් ගුරු වෘත්තියට පුහුණු කිරීම සඳහා “ශ්‍රීපාද අධ්‍යාපන පීඨය” සියලු පහසුකම් වලින් යුත් ගුරු අධ්‍යාපන පීඨයක් බවට පත් කරන්නෙමි.

වතු ප්‍රජාවට සිය මවු භාෂාවෙන් එම ප්‍රදේශවල පිහිටි රජයේ ආයතන සමඟ ක්‍රියා කිරීමේ බාධා ඉවත් කිරීම සඳහා අ. පො. ස සාමාන්‍ය පෙළ සමත් වතුකරයේ තරුණ තරුණියන් අතරින් 2,500 ක් ප්‍රජා සංවර්ධන සන්නිවේදන සහයකයින් ලෙස බඳවාගනු ලැබේ.

ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයට අනුබද්ධ කෘෂි සහ සත්ව පාලනය පිළිබඳව පීඨය හැටන් නගරය කේන්ද්‍ර කර පිහිටුවන්නෙමි.

වතුකරයේ සෞඛ්‍ය තත්වය අනෙකුත් නාගරික ප්‍රදේශවල පවතින ජාතික සෞඛ්‍ය ප්‍රමිතීන්ට සමාන මට්ටමට ගෙන ඒම සඳහා වතුකරයේ ප්‍රජාව වෙනුවෙන් දැනට ක්‍රියාත්මක වන රෝහල්, සායන, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සෞඛ්‍ය පහසුකම් රජයේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයකින් සමන්විතව පවත්වාගෙන යාමට පියවර ගන්නෙමි.

වතු කම්කරු ප්‍රජාවට තැපෑල බෙදා හැරීමේ ශතවර්ෂයකට අධික කාලයක් තිස්සේ පවතින වැඩපිළිවෙල වහාම වෙනස් කර දිනපතා තැපෑල සිය නිවසටම බෙදාහරින වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්නෙමි.



“නැණ සල” වැඩසටහන මගින් වතුකරයේ තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණු ලබාදීමට කටයුතු කරමි.

වතුකරයේ ජල සංරක්ෂණය හා සෝදාපාළුව වැලැක්වීම සඳහා වතු ජනතාවගේම සහභාගීත්වයෙන් "තුරුපියස" වැඩසටහන දියත් කරමි.

සංස්කෘතික මධ්‍යස්ථාන සහ ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන වල දැනට ඇති අඩුපාඩු කම් සම්පූර්ණ කර ඒවා වතු ප්‍රජාවගේ යහපත සඳහා තවදුරටත් වැඩි දියුණු කරමි.

නෝර්වුඩ් ක්‍රීඩාපිටිය සහ ක්‍රීඩාගාරය ක්‍රීඩා අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ ජාත්‍යන්තර පාපන්දු, අත්පන්දු, බැඩ්මින්ටන්, මලල ක්‍රීඩා පැවැත්විය හැකි මට්ටමට සංවර්ධනය කරනු ඇත.

"ජන පුබුදුව" සංවර්ධන වැඩසටහනට සමාන්තරව වතුකරයේ ප්‍රජාව සඳහා ආරම්භ කළ "ප්‍රජා ශක්ති" වැඩසටහන යටතේ **වතුකරයේ තරුණ තරුණියන් කුඩා මට්ටමේ ව්‍යවසායකයින් ලෙස පුහුණු කිරීමට පියවර ගනු ඇත.**

## කලා කෙත අස්වැද්දීම

### කලා හා සංස්කෘතික පෝෂණය

අපගේ ඉපැරණි කලා හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරගැනීම, විශ්ව කලා සංස්කෘතික උරුමයන්හි ප්‍රබුද්ධ අංගයන් දේශීය ජනතාවට හඳුන්වාදීම, පුරවැසියාගේ ජීවිතය උසස් මානසික හා අධ්‍යාත්මික ගුණවගාවන්ගෙන් පෝෂණය කිරීම, ප්‍රඥා සම්පන්න විචාරශීලී, ප්‍රබුද්ධ හා ඉදිරිගාමී ජන සමාජයක් බිහිකිරීම යන අරමුණු පෙරදැරි කරගනිමින් උසස් සංස්කෘතික ජීවිතයක් පුරවැසියාට ලබාදීමට ඉවහල් වන ජාතික සංස්කෘතික ප්‍රතිපත්තියක් හඳුන්වා දෙමි.

ගීත ඇතුළු කලා හා සංස්කෘතික නිර්මාණ මංකොල්ලය වැළැක්වීම සඳහාත් කලා නිර්මාණවල අයිතීන් කිසිම



ආකාරයකින් කොල්ලකෑමට ඉඩ නොදීම සඳහාත් බුද්ධිමය දේපොළ නීතිය සමාලෝචනය කරමින් නිර්මාණවල අයිතිය ඒවායේ නිර්මාණකරුවන්ටම ලැබෙන ආකාරයට නෛතික පදනමක් හඳුන්වා දෙන්නෙමි.

කිසිදු දේශපාලන භේදයකින් තොරව රාජ්‍ය මාධ්‍ය වල කාලය හා ඉඩකඩ ලබාගැනීමට කලාකරුවන්ට ඉඩ සලසා දෙමි.

ජාත්‍යන්තර මට්ටමේ සිනමා හා රංග කලා අභ්‍යාස පාසලක් බිහි කිරීමට පියවර ගනිමි.

සාහිත්‍ය හා කලා ක්ෂේත්‍රවල නියැලි පිරිස් වියපත් වූ පසු තවදුරටත් සිය කටයුතු කරගෙන යාමට නොහැකි වීමේදී ඔවුන්ගේ සුබසාධනය සඳහා විසඳුම් ලෙස සෞඛ්‍ය, රක්ෂණ සහ විශ්‍රාම පාරිතෝෂික ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි.

**කලාකරුවන් සඳහා ජාතික අරමුදලක් පිහිටුවීමට පියවර ගනිමි.**


පාරම්පරික කලා ශිල්ප සහ එම ශිල්පීන් ආරක්ෂා කිරීමට හා පෝෂණය කිරීමට විශේෂ වැඩපිළිවෙලක් සකස් කරමි.

කලාකරුවන්ගේ ජාතික නාමාවලියක් සම්පාදනය කිරීම සඳහා පියවර ගනිමි.

**කලාකරුවන් සඳහා නිවාස තනා ගැනීමට පහසුකම් සපයමි.**

"කොළඹ ජාත්‍යන්තර චිත්‍රපට උළෙල" නමින් ජාත්‍යන්තර චිත්‍රපට උළෙලක් උත්කර්ෂවත් අන්දමින් සංවිධානය කිරීමට පියවර ගන්නෙමි.

දේශිය සිනමා කර්මාන්තයට දිරිදීමේ අරමුණින් ජාත්‍යන්තර සිනමා ක්‍රමවේදයන් අධ්‍යයනය කිරීම සඳහා සිනමාවේදීන්ට හා රංග ශිල්පීන්ට පහසුකම් හා ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩපිළිවෙලක් අරඹන්නෙමි.



ටවර් හෝල් රඟහල ඇතුළු රංග ශාලා නූතන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි නවීකරණය කිරීමට කටයුතු යොදමි.

**භාෂාව හා සාහිත්‍යය**

මිනිසා විසින් නිර්මාණය කරන ලද උසස්ම සන්නිවේදන මෙවලම භාෂාවයි. භාෂාව ද සම්පතකි. එය නිසි කළමනාකරණ ක්‍රම ඔස්සේ දියුණු කිරීමෙන් එහි සන්නිවේදන ධාරිතාව තවත් පුළුල් කළ හැකිය. ශ්‍රී ලංකාවේ භාවිතාවන සිංහල හා දෙමළ භාෂා වලට අවුරුදු දහස් ගණනක ප්‍රෞඪ ඉතිහාසයක්, සාරවත් ජනශ්‍රැතියක්, ප්‍රබුද්ධ සම්භාව්‍ය සාහිත්‍යයක් උරුම වී තිබේ. එසේම නූතන සාහිත්‍යය හා ජනසන්නිවේදනය තුළ ද සිංහල හා දෙමළ භාෂාවන් සුභාවිත උරුමයක් අත්පත් කරගෙන තිබේ. මේ කරුණු සැලකිල්ලට ගනිමින් අපේ ජාතික භාෂාවන් දියුණු කරගැනීමේ ඉදිරිගාමී වැඩපිළිවෙලක් අරඹමි.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය දැඩි ලෙස ක්‍රියාත්මක කරමි.

නූතන පරිගණක යුගයට ගැලපෙන ලෙස සිංහල, දෙමළ භාෂා දියුණු කරගැනීම සඳහා අවශ්‍ය කරන ශබ්ද කෝෂ හා විශ්ව කෝෂ පරිගණක ආශ්‍රිතව ගොඩනැගීමට කටයුතු කරමි.

සිංහල, දෙමළ භාෂා සඳහා දැනට හඳුන්වා දී ඇති පරිගණක ඒක කේතයන් (unicodes) ජනප්‍රිය කරවීම සඳහා කටයුතු යොදමි.

ඉංග්‍රීසි භාෂා භාවිතාව එක් පිරිසකට පමණක් සීමා නොකර සමස්ථ ජනතාව අතරම ජනප්‍රිය කරවීම සඳහා අධ්‍යාපන හා ජනමාධ්‍ය ක්ෂේත්‍රයන්වලට අදාල පහසුකම් හා නව්කරණයන් හඳුන්වා දෙන්නෙමි.

පොත පත කියවන උගත් ප්‍රඥා සම්පන්න සමාජයක් බිහිකිරීම අරමුණු කරගනිමින් ගුණාත්මක අතින් ඉහළ



පොත්පත් හා සඟරා ප්‍රකාශනය දිරිමත් කිරීමත්, විදේශීය සාහිත්‍ය හා විවිධ විෂය ඥානය ඇතුළත් ප්‍රකාශන පරිවර්තනය කිරීමත්, පරිගණක තොරතුරු අධවී ප්‍රකාශන වැඩසටහන් දිරිමත් කිරීමත් සඳහා විශේෂ පියවර ගන්නෙමි.

ජනමාධ්‍ය තුළ භාවිතා කෙරෙන භාෂාව ගුණාත්මක බවින් උසස් කිරීම සඳහා භාෂා උගතුන්ගේ හා වාග් විද්‍යාඥයන්ගේ සේවය ලබාගනිමින් සකස් කරන නිර්දේශ මත සියලු රාජ්‍ය හා පුද්ගලික මාධ්‍යයන් සඳහා සුදුසු භාෂා ප්‍රමිතීන් හඳුන්වා දෙනු ඇත.

**තොරතුරු හා ජනමාධ්‍ය**

ජනතාවට නිවැරදි තොරතුරු දැනගැනීමට ඇති අයිතිය සුරක්ෂිත කරමින් රටේ සමස්ථ සමාජ සංස්කෘතික හා ආර්ථික සංවර්ධන අභිලාෂයන් සාක්ෂාත් කරගැනීම සඳහා ජනමාධ්‍යයන්හි පුළුල් දායකත්වය ලබාගැනීම මගේ ජනමාධ්‍ය ප්‍රතිපත්තියේ පදනමයි.

සැබෑ ස්වාධීන හා වගකීම් සහගත මාධ්‍ය භාවිතාවක් උදෙසා ඉහළම ආදර්ශය බවට රාජ්‍ය මාධ්‍ය පත්කරනු ලබන අතර ඒ සඳහා රාජ්‍ය මාධ්‍ය නිර්දේශපාලනීකරණය කරන්නෙමි.

ශ්‍රී ලංකාවේ අභිමානයට, අනන්‍යතාවට, සංස්කෘතියට, ළමා මනසට හා සමාජ සදාචාරයට අහිතකර ලෙස බලපාන්නාවූත් අවිචාරවූත් මාධ්‍ය භාවිතය වැළැක්වීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය වල සහභාගිත්වයෙන් හා පුළුල් මහජන මත විමසුමකින් අනතුරුව ජනමාධ්‍ය ආචාර ධර්ම පද්ධතියක් සකස් කිරීමට පියවර ගනිමි.

ජනමාධ්‍ය නිදහස සැබෑ ලෙසම ඇති කළ හැක්කේ ජනමාධ්‍යවේදියාගේ ජීවන තත්වය උසස් කළ විටය. එසේ නොවුන හොත් ජනමාධ්‍යවේදියා කවරෙකුගේ හෝ ගැත්තකු



බවට පත්වේ. එබැවින්, ස්වාධීන ගැති-නැති ජනමාධ්‍යවේදියකු වශයෙන් කටයුතු කිරීමට අවශ්‍ය පහසුකම් ලෙස -

බදුරහිත පරිගණකයක් සෑම මාධ්‍යවේදියකුටම ලබාදෙමි.

සියලුම පිළිගත් පුවත්පත් වාර්තාකරුවන්ට තීරුබදු රහිත මෝටර් සයිකලයක් ලබාදෙමි.

පිළිගත් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ආයතනයන්හී ප්‍රධාන කර්තෘවරුනට නියමිත කාලයක් සඳහා තීරුබදු රහිත වාහන ලබාදෙමි.

මාධ්‍යවේදීන්ගේ දුක් ගැනවිලි විසඳීම සඳහා පූර්ණ බලය ඇති ඔම්බුඩ්ස්මන්වරයෙකු පත් කරන්නෙමි.

රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය වල සේවය කරන වඩාත් නිර්මාණශීලි මාධ්‍යවේදීන්ට විදේශ අධ්‍යාපනය ලැබීම සඳහා ශිෂ්‍යත්ව ලබා දීමට අවශ්‍ය පියවර ගන්නෙමි.

වාර්ෂිකව මාධ්‍යවේදීන්ගේ දක්ෂතා ඇගයීමට ලක් කිරීමේ ක්‍රමයක් සකස් කරමි. මාධ්‍ය සඳහා විශේෂ රාජ්‍ය සම්මාන උළෙලක් පැවැත්වීමටද ක්‍රියාකරමි.

මාධ්‍යවේදීන්ට නිවාස තනා ගැනීමට පහසුකම් සැපයෙන අතර විශ්‍රාමික මාධ්‍යවේදීන් සඳහා විශ්‍රාම පාරිතෝෂික ක්‍රමයක් හඳුන්වා දීමට පියවර ගන්නෙමි.

## නිරෝගී දැයක්

### ක්‍රීඩා

නිරෝගීමත් පුද්ගලයකු බිහි කිරීමටත් ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර තලයට ගෙන ඒමටත් අවශ්‍ය ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනයක් උදෙසා තිරසාර ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන්නෙමි.



**සෑම ක්‍රීඩා සංගමයකටම සාධාරණ දීමනාවක් වාර්ෂිකව ලබා දෙනු ඇත.**

දැනට පවතින ක්‍රීඩා පාසල් වහාම දියුණු කිරීමටත් ජාත්‍යන්තර තලයට ගෙන ආ හැකි ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන්, විනිසුරුවරුන් පුහුණු කිරීමට ජාතික ක්‍රීඩා පාසලක් පිහිටු වීමටත් පියවර ගන්නෙමි.

දේශීය සහ විදේශීය ක්‍රීඩකයන්ට අවශ්‍ය පුහුණුව ලැබිය හැකි ක්‍රීඩා පාසලක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ආරම්භ කරමි.

2005 වසරේ කැලණි විශ්ව විද්‍යාලයේ ආරම්භ කරන ලද ක්‍රීඩාව උපාධි විෂයයක් ලෙස ඉගැන්වීමේ වැඩපිළිවෙල පුළුල් කොට ක්‍රීඩා කටයුතු පිළිබඳ අධ්‍යයන අංශයක් ප්‍රථමව ද ක්‍රීඩා හා ශාරීරික අධ්‍යයනය පිළිබඳ විශ්ව විද්‍යාල පීඨයක් ඉන් අනතුරුව ද ආරම්භ කිරීමට කටයුතු කරනු ඇත.

ජාතික වාර්තා පිහිටුවමින් **ජාත්‍යන්තර තලයට පිවිස සිටින සෑම ක්‍රීඩක ක්‍රීඩිකාවකටම අවම වශයෙන් මාසිකව රුපියල් 25,000 ක දීමනාවක් ලබා දීමේ සහ පොත් පත් හා අනිකුත් අවශ්‍යතා සැපයීමේ** වැඩපිළිවෙලක් සකස් කරන්නෙමි.

දක්ෂතා දක්වන ගම්බද ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනා ගැනීමටත් ඔවුන්ව ජාත්‍යන්තර තලයට ගෙන ඒමටත්, **"ක්‍රීඩා ශක්ති"** නමින් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්නෙමි.

ප්‍රාදේශීය මට්ටමින් ක්‍රීඩාව දියුණු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට පත් කර ඇති ක්‍රීඩා නිලධාරීන්ගේ සේවය නිසි පරිදි ලබා ගැනීමේ අරමුණින් ඔවුන්ගේ ප්‍රවාහන දුෂ්කරතා අවම කිරීම පිණිස මෝටර් බයිසිකලයක් මිලට ගැනීම සඳහා දීමනාවක් ලබාදෙන්නෙමි.



**සෑම දිස්ත්‍රික්කයකටම ශාහස්ත ක්‍රීඩා පිටියක්, පිහිනුම් තටාකයක් සහිත අංග සම්පූර්ණ ක්‍රීඩා පිටි සාදනු ඇත.**

පළමු වසරේ සිටම සෑම පාසැල් දරුවකුගේම ශාරීරික අධ්‍යාපනය පිළිබඳව අගැයීමේ ක්‍රමයක් හඳුන්වා දීමට පියවර ගනු ඇත.

**ඉදිරි දශකය තුළ ඔලිම්පික් ඇතුලු ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණ පහක් වත් ශ්‍රී ලංකාවට ලබා ගැනීම මම ඉලක්ක කොට ගනිමි.**

## ජන මතයට මුල් තැන

### ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

මහජන මතය නියෝජනය වීම ද ස්ථාවර ආණ්ඩුවක් බිහි කිරීම ද තුලනය වන අයුරින් පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමට යෝජනා කරමි.

විධායක ජනාධිපති ධූරය අහෝසි කෙරෙන්නා වූ හා රටේ සෙසු ප්‍රශ්න වලට ද විසඳුම් ලබා දෙන්නා වු නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සියල්ලන්ගේ සම්මුතියෙන් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි. එතෙක් ජනාධිපතිවරයා නිල මට්ටමින් පාර්ලිමේන්තුවට වගකියන ලෙසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන ඉදිරිපත් කරන්නෙමි.

පාර්ලිමේන්තුව කෙරෙහි ජනාධිපතිවරයා ගේ ඇති වගකීම සහතික කිරීම සඳහා මසකට වරක් පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගි වන්නෙමි.

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ - විපක්ෂ මන්ත්‍රීන් කාර්යක්ෂම ලෙස රාජ්‍ය පාලනයට සහභාගිවීම තහවුරු කිරීම සඳහා අමාත්‍යාංශ කාරක සභාවන්හි බලතල පාර්ලිමේන්තුවේ එකඟතාවෙන් වැඩි දියුණු කිරීමට යෝජනා කරමි.

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තීන්ට සහ ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූල වන පරිදි සියලු ශ්‍රී ලංකා වාසීන්ගේ සමාජ,



සංස්කෘතික, දේශපාලන, ආර්ථික හා සිවිල් අයිතිවාසිකම් සියල්ල කිසිදු වෙනස් කමකින් තොරව සමානාත්මතා පදනමකින් සුරැකීම තහවුරු කිරීම සඳහා හිමිකම් ප්‍රඥප්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමට කටයුතු යොදමි.

**නොබැඳි නිදහස් විදෙස් පිළිවෙතක්**

මම නොබැඳි, නිදහස්, ප්‍රගතිශීලී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නෙමි.


දේශපාලන, ආරක්ෂක, ආර්ථික, වෙළඳ හා සංස්කෘතික ක්ෂේත්‍රයන් හිදී ඉන්දියාව, ජපානය, චීනය සහ පකිස්තානය ඇතුළු ආසියානු රටවල් සමඟ දැනට පවතින සුහද මිත්‍රශීලී සබඳතාවන්ට ප්‍රමුඛතාව ලබාදෙනු ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානය මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය සේවාවන්ද වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස සකස් විය යුතු බව මගේ විශ්වාසයයි. එයට අපි ක්‍රියාශීලීව මැදිහත් වන්නෙමු.

දූෂණයට විරෙහිව ජාත්‍යන්තර ප්‍රඥප්තිය ශ්‍රී ලංකාව තුළ දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම මාගේ අපේක්ෂාවයි. විදේශ රටවල් හා විදේශ ආයතන ශ්‍රී ලංකාව සමඟ කරන ගනුදෙනුවලදී දූෂණවලට වරදකරුවන් වුවහොත් අදාළ නෛතික ක්‍රියාමාර්ග ජාත්‍යන්තර නීතියේ ප්‍රකාරව ගැනීමට අපට එයින් හැකියාව ලැබෙනු ඇත.

ශ්‍රී ලංකාවේ නිවැරදි ඉතිහාසය, අපේ ආර්ථික අවශ්‍යතා අපේ සංස්කෘතික උරුමය පිළිබඳව මනා හැඟීමක් ඇති විදේශ සේවාවක් ඇති කරන්නෙමි.

ලොව පුරා සිදුකරන නව නිපැයුම්, නව සිද්ධාන්ත ආදිය පිළිබඳව දත්ත තොරතුරු වහාම අපට ලබාගැනීමටත්, ඒ සඳහා අපේ නිර්මාණ හා නව සිද්ධාන්ත කරා යොමු කිරීමටත් ජාත්‍යන්තර



පර්යේෂණ ආයතනයක් තාක්ෂණ අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් පිහිටුවමි.

ගෝලීය උණුසුම පාලනය කිරීම හා ලොවේ කාලගුණ දේශගුණ විපර්යාස වැළැක්වීම සඳහා මුළු ලොවම සම්මුතියකට ආ යුතු යැයි මම විශ්වාස කරමි. ඒ සඳහා වූ කියෝතෝ සම්මුතිය ක්‍රියාත්මක කරවීම සඳහා ලොව පුරා පරිසරවේදීන්ට මගේ සහය ලබා දෙනු ඇත.

## ප්‍රතිපත්ති පසු විපරම් සභාව

සෑම මැතිවරණයකදීම දේශපාලකයෝ සුරංගනා කතා බඳු පොරොන්දු රැසක් ජනතාව ඉදිරියේ තබති. එම පොරොන්දු මත ඡන්ද දායකයින් විසින් දේශපාලකයින් බලයට පත් කරන නමුත් ඉන්පසු දේශපාලකයෝ එම පොරොන්දු අමතක කරති. කඩවුණු පොරොන්දු දේශපාලනය අවසන් කිරීමට මම මතු දැක්වෙන ක්‍රියා මාර්ග ගනිමි.

- මාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන "ප්‍රතිපත්ති පසු විපරම් සභාව" නමින් පූර්ණ බලැති ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කොමිසමක් ස්ථාපනය කරමි. එකී කොමිසමේ සාමාජිකයින් ලෙස පත් කරන්නේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන බුද්ධිමතුන් ය.

- මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අඩංගු වැඩසටහන් මෙම කොමිසම මඟින් වසර 6 කට අදාළ සැලසුම් හා වැඩසටහන් ලෙස සකස්කර එම සැලසුම් ක්‍රියාත්මක කිරීම විවිධ අමාත්‍යාංශ වලට පවරා දෙනු ඇත.

- එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වාර්ෂික ඉලක්කයන් නියම කිරීමද, වාර්ෂික ප්‍රගතිය සමාලෝචනයද, පසුබෑම්



අධ්‍යයනය කොට පිළියම් යෙදීමද මෙම කොමිසමේ කාර්යභාරයට අයත් වනු ඇත.

- සෑම අමාත්‍යාංශයක්ම සිය ඉලක්කද, වාර්ෂික ප්‍රගතියද, ඉලක්ක සහ ප්‍රගතිය අතර යම් වෙනසක් ඇත්නම් ඊට හේතුද දක්වන වාර්ෂික වාර්තාවක් එකී කොමිසමට සැපයිය යුතු වන අතර මැතිවරණ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ වාර්ෂික ප්‍රගතිය දක්වන ප්‍රගති වාර්තාවක් කොමිසම මඟින් ප්‍රසිද්ධ කරනු ඇත.

මහින්ද රාජපක්ෂ

மஹிந்த ராஜபக்ஷ

Mahinda Rajapaksha

1

REFERENCE

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ඔබ සැමගේ සිතුවිලි කැටිකොට
මිනිසා ගොඩ නඟා පවුල රකින්නටත්
පවුල ගොඩ නඟා ගම රකින්නටත්
ගම ගොඩ නඟා රට රකින්නටත්
රට ගොඩ නඟා ලොව දිනන්නටත්

"මහින්ද චින්තන" නම් වූ
මගේ වැඩපිළිවෙල
ඉදිරිපත් කළෙමි.

මගේ සිහිනය නිවහල් ජාතියකි
නිල්ල පැතිරුණු රටකි
අටුකොට පිරුණු හෙටකි
දැහැමි මිනිසෙකි.

සිහළ දමිළ මුස්ලිම් බර්ගර්
ලක්මවගේ සියලු දරුවන්
අපේක්ෂා දැල්වුණු දෑසින්
අප දෙස බලා සිටින බව
මම දනිමි.

ඒ අපේක්ෂාව
යථාර්ථයක් බවට පත් කළ හැක.
ඒ විශ්වාසය මා සතුව තිබේ.
නිසැකවම මම එය ඉටුකරන්නෙමි.

අභියෝගයන්ට ආදරය කරමු !
ලක්මවට
සුබ අනාගතයක් තිළිණ කිරීමට
අපි සැවොම එක්ව පිය නගමු !!

| මහින්ද රාජපක්ෂ | | 1 |
|---|---|---|

වීරකැටියේ පදිංචි කපිල දිසානායක වන මවිසින් කොළඹ 10 හි පීසීපී ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ගැෆික්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ මුද්‍රණය කර බෙදාහරින ලදී